


# සර්ව පාක්ෂික නියෝජිත කමිටුව

## ව්‍යවස්ථාමය සම්මුතියකට ප්‍රවේශයක්

# සර්ව පාක්ෂික නියෝජිත කමිටුව: ව්‍යවස්ථාමය සම්මුතියකට ප්‍රවේශයක්

වෙරිටේ රීසර්ච් හි පර්යේෂණ කණ්ඩායම අමිතා අරුද්ප්‍රගාසම්, විද්‍යා නැතනියෙල්, සුමිත් චාමින්ද, රෙහානා මොහොමඩ් සහ සරින්ද පෙරේරා යන අයගෙන් සමන්විත වන අතර එහි සමස්ථ සංස්කරණ අධීක්ෂණය ගෙහාන් ගුණතිලකගෙනි. මෙම අධ්‍යයනයෙහි මූලික අදියරේදී සිදු කළ දිරිමත් කිරීම් සහ මූලික පිටපත් හමුවේ ලබා දුන් අදහස්, ගුණදොස් විමසීම් සහ ප්‍රතිපෝෂණ සම්බන්ධයෙන් වෙරිටේ රීසර්ච්හි ස්තුතිය කුසල් පෙරේරා වෙත හිමිවනු ඇත.

වෙරිටේ රිසර්ච් හි ඉලක්කය වන්නේ කලාපය තුළ සමාජ සංවර්ධනය සඳහා වන සංවාදය සහ අධ්‍යාපනය නංවාලන අතරම, ආසියාවේ ප්‍රතිපත්ති සම්පාදනයන් සහ කථිකාවන් සඳහා තොරතුරු සහ විශ්ලේෂණ සැපයීමේ ප්‍රමුඛයා බවට පත්වීමයි. මෙම ආයතනය ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලනය, නීතිය සහ ජන මාධ්‍යය සබැඳි ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සහ කථිකාවන් සඳහා සෘජුව දායක වන අතර දත්ත රැස් කිරීම, තොරතුරු නිරවද්‍යකරණය, උපායමාර්ග සංවර්ධනය සහ තීන්දු විශ්ලේෂණය සබැඳි සේවා සපයයි.

මෙය The APRC: A primer for constitutional consensus යන මැයෙන් ඉංග්‍රීසි බසින් ප්‍රකාශයට පත් වූ කෘතියෙහි සිංහල පරිවර්තනයයි.

පරිවර්තනය - ප්‍රියන්ත ෆොන්සේකා
කවර නිර්මාණය - ඒඩ්‍රියන් මාකස්
පිටු නිර්මාණය සහ සැකසුම - දිනුක් සේනාපතිරත්න

විද්‍යුත් තැපැල මඟින් අදහස්: publications@veriteresearch.org

ප්‍රකාශන අයිතිය © 2016 වෙරිටේ රීසර්ච් පුද්ගලික සමාගම සතු ය.
සියලු හිමිකම් ඇවිරිණි. දායකත්වලාභීන් සඳහා පමණි. වැඩිදුර බෙදාහැරීම් සඳහා වෙරිටේ රීසර්ච් පුද්ගලික සමාගමේ පූර්ව අනුමැතිය ලබාගත යුතු ය.

# පටුන

පෙරවදන ........ v

හැඳින්වීම ........ xi

I. සර්ව පාක්ෂික නියෝජිත කමිටුවට පෙර යුගය ........ 1

II. සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ ක්‍රියාවලිය: ප්‍රධාන අවස්ථා ........ 11

III. ව්‍යවස්ථා සංශෝධනය අතපසු කළේ ඇයි? ........ 21

IV. සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ ප්‍රතිඵල: නිර්දේශ පිළිබඳ කෙටි විමසුමක් ........ 25

V. සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ යෝජනා: බලාපොරොත්තු සහගත අවසානයක් ........ 29

සමාප්තිය ........ 33

ඇමුණුම I ........ 35

# සංකේත නාම සහ කෙටි යෙදුම්

| | |
|---|---|
| සලද්‍රකො | සමස්ථ ලංකා ද්‍රවිඩ කොංග්‍රසය |
| APC | සර්ව පාක්ෂික සමුළුව |
| APRC | සර්ව පාක්ෂික නියෝජිත කමිටුව |
| බොබසෙ | බොදු බල සේනා |
| CFA | සටන් විරාම ගිවිසුම |
| ශ්‍රීලකොප | ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය |
| CWC | ලංකා කම්කරු කොංග්‍රසය |
| දේජව | දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය |
| දේවිජප | දේශ විමුක්ති ජනතා පක්ෂය |
| ප්‍රජපෙ | ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ |
| ප්‍රඑජාපෙ | ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ |
| ප්‍රකකො | ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු කොංග්‍රසය |
| ඊපීආර්එල්එෆ් | ඊලාම් ජනතා විප්ලවවාදී විමුක්ති පෙරමුණ |
| ඊරෝස් | ඊලාම් විප්ලවවාදී ශිෂ්‍ය සංවිධානය |
| IRDP | ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන |
| ISGA | අන්තර්වාර ස්වයං-පාලන අධිකාරිය |
| ජවිපෙ | ජනතා විමුක්ති පෙරමුණ |
| ජාහෙඋ | ජාතික හෙළ උරුමය |
| එල්එල්ආර්සී | උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම |
| ලසසප | ලංකා සම සමාජ පක්ෂය |
| එල්ටීටීඊ | දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය |
| මඑපෙ | මහජන එක්සත් පෙරමුණ |
| NPA | එල්එල්ආර්සීහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වූ රජයේ ජාතික ක්‍රියාකාරී වැඩසටහන |
| ජාඒපෙ | ජාතික ඒකාබද්ධතා පෙරමුණ |
| ප්ලොට් | දෙමළ ඊලාම් ජනතා විමුක්ති සංවිධානය |
| පාතේකාස | පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව |
| P-TOMS | පශ්චාත් සුනාමි ක්‍රියාකාරී කළමණාකරණ ව්‍යුහය |
| ශ්‍රීලනිප | ශ්‍රී ලංකා නිදහස් පක්ෂය |
| ශ්‍රීලමුකො | ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය |
| ශ්‍රීලමප | ශ්‍රී ලංකා මහජන පක්ෂය |
| දෙජාස | දෙමළ ජාතික සන්ධානය |
| ද්‍රඑවිපෙ | ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ |
| එජාපෙ | එක්සත් ජාතික පෙරමුණ |
| එජනිස | එක්සත් ජනතා නිදහස් සන්ධානය |

# පෙරවදන

සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ (APRC) අවසන් වාර්තාව, රාජ්‍ය පාලනයේ වෙනස්වීමෙන් සහ පශ්චාත් -2015 ජනවාරි 08 යුගය සඳහා වන දේශපාලනික අදාලත්වය හමුවේ වුව නිල වශයෙන් ඉදිරිපත්ව නොමැති පසුබිමක, වෙරිටේ රිසර්ච් ආයතනයෙන් එම කමිටුවේ ක්‍රියාකාරීත්වය පදනම්ව සකස් කරන ලේඛණය සඳහා පෙරවදනක් ලියන්නට ආරාධනයක් ලැබීම ගෞරවයකි.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් සර්ව පාක්ෂික නියෝජිත කමිටුවක් 2006 වර්ෂයේදී කැඳවන ලද්දේ ජනවාර්ගික අරගලයට 'ගෙදරම හැදූ' විසඳුමක් සොයාගනු පිණිස ය. ඒ වන විටත් ඔහු දිගුකාලීනව ඇදී එමින් තිබුණු සන්නද්ධ යුද්ධයෙන්ම අවසානය දැකීම ඉවත හෙළා තිබුණේ නැත. 2008 ජනවාරි මාසයේ සටන් විරාම ගිවිසුම නිල වශයෙන් ඉවත් කිරීමත් සමඟ වන්නියේ උන් දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව රාජපක්ෂ රජය විසින් ලේ වැගිරෙන යුධමය ප්‍රහාරයක් එල්ල කරනු ලබන බව පැහැදිලිව විය. එසේ වුවත් ඔහු APRCහි ක්‍රියාකාරකම් නොකඩවා පවත්වාගෙන ගියේ ය. 2009 මැයි මාසයේ දී එල්ටීටීඊ ය ප්‍රබල සහ කුරිරු ලෙස පරාජයට පත් කරමින් යුද්ධය අවසන් වූ අතර දැවැන්ත නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන කිරීම් හා සංහිඳියාව ඇති කිරීම් අවශ්‍ය වූ මානව ඛේදවාචකයක් ඉතිරි කෙරිණ. ඒ හා සමග යුධ අවසානය රට අත්‍යාවශ්‍යයික සහ එළදායී ලෙස එක්සත් කරනු පිණිස ගැටුම සඳහා වන දිගු කලක් බලා උන් දේශපාලනික විසඳුමක් සෙවීමද අප වෙත ඉතිරි කළේ ය.

මෙම තත්වය හමුවේ, 2010 අගෝස්තු මාසයේදී, දේශපාලනික අර්බුදයට 'ගෙදර හැදූ' විසඳුමක් සහිත සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ අවසන් වාර්තාව ජනාධිපති රාජපක්ෂ වෙත ඉදිරිපත් කෙරිණ. අවසන් වාර්තාව, දකුණේ බොහෝ සිංහල දේශපාලන පක්ෂ සහ කණ්ඩායම්, ඇතැම් දෙමළ සහ මුස්ලිම් දේශපාලන පක්ෂ සමග එකඟ වී තැනූ නව ව්‍යවස්ථාවක් සඳහා වන පදනමක් සපයා තිබිණ. සැබවින්ම, මෙම සර්ව පාක්ෂික නියෝජිත කමිටුව වූ කලී, දිග්ගැස්සුණු සහ වේදනාකාරී වුණු දේශපාලනික අරගලයට නිදහසින් පසු ගෙන එන ලද එකම ක්‍රියාත්මක කළ හැකි, පිළිගත හැකි සහ අර්ථවත් පිළිතුරක් රැගත් දේශපාලනික උත්සාහයයි. මූලාරම්භයේදී දෙමළ ජාතික සන්ධානයට (දෙජාස) සර්ව පාක්ෂික නියෝජිත කමිටුව සඳහා ආරාධනා කෙරුණේ නැත. එක්සත් ජාතික පක්ෂයට ද (එජාපය) කමිටුවෙන් ඉවත් ව සිටීම සඳහා නිදහසට කරුණක් තිබිණි. උපදේශ වාක්‍යයක් ද සමඟින් 'එජාප' යන ලේබලය අලවාගත් එජාපයට විරුද්ධමතික සාමාජිකයෝ පිරිසක් කමිටුවේ උන් හ. අවසාන වාර්තාව පිළිබඳ 'පොදු එකඟත්වයකට' පැමිණෙනු පිණිස දෙජාසය සහ එජාපය මෙම දේශපාලනික ක්‍රියාවලිය සමඟ එක්ව නොසිටියද, මූලධාර්මික පදනමකින් ඒ සඳහා 'පොදු එකඟත්වයකට' පැමිණීමට දෙපක්ෂයටම සිදුවනු ඇත.

දමිළ පළාත්වල පළාත් පාලනය අයිතිය සහ ඉන් පසු ස්වයං-නිර්ණ අයිතිය මඟින් නීත්‍යානුකලව දමිළ භාෂාව භාවිතා කිරීම පිළිබඳ අයිතිය ආදිය වෙතින් නැගී ආ ගැටුම සඳහා දේශපාලන විසඳුමක් සෙවීම, රාජපක්ෂ රෙජීමයත් ඔවුන් පෙරමුණක තබා සඳහන් කළ සිංහල සහයෝගීතාවත්, පශ්චාත් යුධ ශ්‍රී ලංකාව තුළ මූලික කොට සැලකුවේ නැත. ගැටුමෙහි ප්‍රමුඛ භූමිකාවන් රඟ දැක්වූ දෙමළ ඩයස්පෝරාව හා ජාත්‍යන්තර ප්‍රජාව විසින් මූලිකත්වයෙහි ලා සැලකූ අවතැන් වී, අවිනිශ්චිත අනාගතයක් සමඟින් ජීවත් වූ දමිළ ජනතාව සුරක්ෂිත කරනු පිණිස වැඩ පිළිවෙලක් වූයේ ද නැත. ඉක්මන් සහ හදිසි ඉලක්කය වූයේ, යුද්ධයෙන් දිවි ගලවාගත් දමිළ ජනතාව හෝ යුද්ධයෙන් විනාශ වී ගිය භූමියේ හමු වූ ඔවුන්ගේ ජීවිත නොව රාජපක්ෂ-වරුන් හා ඔවුන්ගේ පාලන තන්ත්‍රයයි. එබැවින් යුධ අපරාධ, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සහ වගවීම රාජපක්ෂ රෙජීමයට එරෙහිව පෙරමුණට ගෙන මධ්‍ය වේදිකාවට ගෙන එනු ලැබිණ. මේ හේතුවෙන් අද වනවිටත් හමුදා පාලනය හා මැදිහත්වීම යටතේ ඇති යුද්ධයෙන් විනාශ වී ගිය බිමෙහි දිවි රැකගත් පිරිසට

වඩා යහපත් ජීවිතයක් ආරම්භ කිරීම නමැති වඩා සුවිශේෂ කරුණ මග හැරී ගොස් ඇත.

ජාත්‍යන්තරයෙන් නැගුණු පීඩනය සහ යුධ අපරාධ සහ වගවීම් සම්බන්ධ ගැටලු මග හරිනු වස් ජනාධිපති රාජපක්ෂ විසින් පත් කරන ලද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම (එල්එල්ආර්සී) විසින් ඉදිරියට යාමට ඇති නොවැලැක්විය හැකි අවශ්‍යතාවක් ලෙස සියලු ඉතිරිව ඇති නොවිසඳුණු හූ මට්ටමේ වන ගැටළු සඳහා දේශපාලන විසඳුමක් යන්න හඳුනාගන්නා ලදි. එහි අවසන් වාර්තාව කියා සිටින්නේ:

> 'සියලු පක්ෂ පිළිගත යුතු කරුණක් නම් බලය **බෙදීම හා රාජ්‍ය පාලනයට සම්බන්ධ වීම හා අදාල සැබෑ ගැටලුව වන්නේ මිනිසුන් බලාත්මක කිරීම හා දේශපාලන නායකයින් මහජනතාවට වගකිව යුතු තත්ත්වයකට පත් කිරීම බවයි.** මෙය සමස්ථ ශ්‍රී ලංකාවටම පොදු වශයෙන් යෙදෙන අතර සිංහල, දෙමළ, මුස්ලිම් සහ අනෙකුත් ජාතීන් ඇතුළු සියලු පුරවැසි ප්‍රජාවන්ගේ අවශ්‍යතාවන්ට ඇතුළත් වනු ඇත. **බලය විමධ්‍යගත කිරීම සඳහා සම්මුතික රාමුවක්, එයට ආවේණික ගුණාංගයන් සහිත ආයතනයන්වලින්ද සමන්විත,** මනා ලෙස ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය මෙම අවශ්‍යතා පූරණය කරනු ඇති අතර **සුළු ජන කොටස්වල ගැටළුවලට ද පිළිතුරක් ලැබෙනු ඇත.**' [එල්එල්ආර්සී අවසන් වාර්තාව, 8.222 ඡේදය[1]. තද පැහැ කොටස එකතු කරන ලද්දකි]

එසේ වුවත්, මෙතෙක් නොවිසඳුණු අර්බුදයෙහි දේශපාලනික ප්‍රශ්න සඳහා සුදුසු සහ යහපත් පිළිතුරක් සොයා ගැනීම යන්න, සිරිසේන-වික්‍රමසිංහ රජය විසින් නොසගවමින් සහ මහජන සහභාගිත්වය ලබා ගනිමින් ගොඩනගන්නට පොරොන්දු වූ නව ව්‍යවස්ථා කෙටුම්පත සඳහා එකඟතාවකට පැමිණීම සහ එහි කටයුතු අවසාන කිරීම සඳහා වන ප්‍රධානතම බාධකය ලෙස පවතී. කවර ආකාරයක හෝ 'බලය විමධ්‍යගත කිරීමේ' ආකෘතියකට, දකුණේ සමාජය නියෝජනය කරන විශාල හෝ කුඩා යන කවර තරාතිරමක හෝ සිංහල දේශපාලන පක්ෂයක් බරපතල ලෙස සම්බන්ධ නොවන්නේ සිංහල ඡන්දදායකයා කොන්දේසි විරහිතව බලය බෙදීම යන්නට විරුද්ධ වන්නේ ය යන පදනමෙහි සිටිමිනි. සිංහල ඡන්දදායකයා සැමවිටම බලය බෙදාහැරීම සඳහා විරුද්ධ වන්නේ ය යන උපකල්පනයෙහි හිඳිමින් ඔවුන් සිදුකළේ 'ජනප්‍රියවාදීව' හා 'හිතාමතාම' ඒ 'ෆෙඩරල්' හෝ 'වෙන්වූ' දෙමළ රාජ්‍යයක් සඳහා වන සැක සහිත මාර්ග වශයෙන් පෙන්වා දීමයි.

දමිළ ජාතිකවාදයෙහි නැගීම 'වෙනම' දෙමළ රාජ්‍යයක් ඉල්ලමින් සිදුකරන යුද්ධයක් බවට පරිවර්තනය වන්නේ සැබවින්ම 'සිංහල - හිතවාදී' කොළඹ කේන්ද්‍රීය සිංහල නායකයින් පිරිස සහ සිය අන්තවාදී මතය 'සිංහල මතය' ලෙස වර නැගූ බෞද්ධ භික්ෂූන් කණ්ඩායම හේතුවෙනි. එහෙත් සැමවිටම ඉදිරියෙන් සිටි නායකත්වය මෙහෙය වූවා මිස, දේශපාලන නායකයින් සහ ජනමාධ්‍ය අර්ථ දක්වන ආකාරයට සිංහල සමාජය අන්තවාදී වී නැත. ඒ බව පැහැදිලි වන්නේ 1994 අගෝස්තු මාසයේ සහ 2001 දෙසැම්බර් මාසයේ පැවති මහ මැතිවරණවලදී සිංහල බහුතරය බලය බෙදාහැරීම සඳහා වන සාකච්ඡාවකට එක්වීමට සිය කැමැත්ත පළ කළ හෙයිනි. 1994 අගෝස්තුවේ පැවති මහ මැතිවරණයේ දී, චන්ද්‍රිකා කුමාරතුංග ප්‍රමුඛ පොදුජන එක්සත් පෙරමුණ රට බෙදන්නට උත්සාහ දරන්නේ ය යන එජාප චෝදනා අභියස හිඳිමින්, යුද්ධය වෙනුවට එකඟතාවන් ඇති කරගනු පිණිස කොන්දේසි විරහිත විවෘත සංවාදයකට පිවිසීමේ ඇයගේ කැමැත්ත හමුවේ, එජාපය ලබාගත් 44.0%ක ඡන්ද ප්‍රතිශතයට එරෙහිව 48.9%ක ඉහළ ප්‍රතිශතයක් දිනාගැ-නීමට පොදුජන එක්සත් පෙරමුණට හැකි විය. මෙම තත්වය නැවත 2001 දෙසැම්බරයේදී හමුවන්නේ, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග ප්‍රමුඛ පොදුජන එක්සත් පෙරමුණ රට බෙදීම සඳහා එල්ටීටීඊය සමඟ රනිල් වික්‍රමසිංහ රහස් ගිවිසුමකට පැමිණ ඇතැයි සඳහන් කරන අවස්ථාවේ ය. එහිදී එජාපය 45.6% දිනාගනිද්දී පොදුජන එක්සත් පෙරමුණ දිනාගත්තේ 37.2% පමණි.

1. එල්එල්ආර්සී අවසන් වාර්තාවේ සිංහල පරිවර්තනයෙහි ඉහත උපුටනය සඳහා අදාල කොටස ඉංග්‍රීසි ලේඛණයට වඩා වෙනස්කම් සහිතව පරිවර්තනය කෙරී ඇත. එබැවින් මෙම ලිපියේ රචකයාගේ අදහසට හානි නොවනු පිණිස එම කො-ටස මෙහිලා යළි පරිවර්තනය කර ඇත. - වෙරිටේ රිසර්ච් පරිවර්තක

1957, 1965, 1984, 1985, 1990, 1995, 2002 සහ පශ්චාත් සුනාමි ක්‍රියාකාරී කළමණාකරණ ව්‍යුහය සමඟින් ආ උත්සාහයන්වලදී ද, විවිධාකාර දේශපාලනික හා පෞද්ගලික හේතු පදනම් කරගනිමින් සම්මුතියකට පැමිණීමට කටයුතු කළේ මිස අර්බුදය සඳහා ක්‍රියාවට නැගිය හැකි විසඳුමක් ලබාගැනීමට කොළඹ සිංහල නායකත්වය සැබෑ දේශපාලනික අධිෂ්ඨානයකින් කටයුතු කළේ නැත. එහි ප්‍රතිඵලය ශ්‍රී ලංකාව ජනවාර්ගික බෙදීම් මත පදනම් වූ යුද්ධයක සහ සිංහල ඡන්ද දිනීම සඳහා ජාතිවාදය පදනම් ඇවිලෙන උණුසුම් ඡන්දවල ගිලී පැවතීමයි. රාජ්‍ය භාෂා පනත මඟින් සිංහල පමණක් රාජ්‍ය භාෂාව කළ මොහොතේ පටන් දශක ගණනාවක් තිස්සේ රාජ්‍යය සිතා ඇත්තේත්, කටයුතු කර ඇත්තේත් සිංහලයෙන් පමණි. මෙය රාජ්‍ය පාලනයේ පවතින ආර්ථිකය යටතේ සියලුම ආර්ථික ක්‍රියාකාරකම්වලදී දකුණට නිරතුරුවම වැඩි අවස්ථා හිමි කරදීම මඟින් පැහැදිලි වේ. 1956න් පසු, ස්වභාවික සම්පත් සහ ප්‍රවර්ධනය ඉලක්ක කරගත් ව්‍යාපෘති හතරක් හැර සියලුම රැකියා ඉලක්ක කරගත් ආර්ථික ව්‍යාපෘති සියල්ල ක්‍රියාත්මක කර ඇත්තේ සිංහල කලාපවල ය. 1978 සිට ක්‍රියාත්මක කරන ලද ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්වලදී ද (IRDPs), විශාල වශයෙන් මුදල් ආයෝජනය කරන ලද්දේ උතුරු හා නැගෙනහිර දෙපළාත් ඉවත් කොට තබමිනි. මෙය තව දුරටත් පැහැදිලිව හඳුනාගත හැක්කේ එක් කර ගත යුතුව තිබියදීත් මහවැලි සංවර්ධන වැඩසටහන තුළ දී දෙමළ කලාප ඉවත් කිරීම හමුවේ ය. රජයේ සහ ආණ්ඩු බලය හෙබවූ කණ්ඩායම්වල සිංහල චින්තනය සැකයකින් තොරව පැහැදිලි වන්නේ දකුණේ ඈත කෙළවර පිහිටි උඩවලවේ ප්‍රදේශය ද මහවැලි සංවර්ධන අධිකාරිය යටතට ගැනීමත් සමඟ ය. උඩවලවේ ප්‍රදේශය මහවැලි නදිය සමඟ කිසිදු ආකාරයක සබඳතාවක් හෝ ගණුදෙනුවක් ඇති කලාපයක් නොවේ. 1967 දී මෙම කලාපයට පුළුල් සංවර්ධන වැඩපිළිවෙලක් හඳුන්වා දෙන ලදි. අද වන තුරුත්, රත්නපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල සිංහල ජනතාවට සේවය සළසනු පිණිස උඩවලවේ කලාපය මහවැලි සංවර්ධන වැඩසටහන යටතේ තබා ඇත.

මෙම 'සිංහල' අධිපතිවාදී චින්තනය අධ්‍යාපනය තුළ ද දැකිය හැක්කකි. කන්නන්ගර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා ලබා දුන් වඩා වටිනාම මූලධර්මය ලෙස ඔවුන් 'නිදහස් අධ්‍යාපනය' සඳහා අරගල කළ ද, පාසැල් අධ්‍යාපනය හමුවේ භාවිතයේදී එය කන්නන්ගර ප්‍රතිසංස්කරණ මඟින් යෝජනා කළ මූලික මූලධර්මවලින් බැහැරට යයි.

කන්නන්ගර අධ්‍යාපනය තුළින් අපේක්ෂා කළේ උත්ප්‍රේක්ෂාව හරහා බහුවිධතාව පෝෂණය කිරීමයි.

> 'අප විසින් ගොඩනගා ගන්නට බලපොරොත්තු වන ජාතිකවාදය ඉවසීම සහ එහි පැවැත්ම පිළිබඳ වන අවබෝධය මත රඳා පවතිනු ඇත. විවිධ ආකාරයේ වෙනස්කම් සහිත ජනතාවක් වෙනත් ආකාරයකට එක්ව ගැනීම නිපදවනු ඇත්තේ ජාතික බිඳවැටීමක් මිස ජාතික එකමුතුවක් නොවේ. අපේ මිනිසුන්ගෙන් එකිනෙකා හමුවේ යොදන ලෙස අප ඉල්ලා සිටින ඉවසීම සෙසු ජාතීන් හමුවේත් යෙදෙනු දකින්නට අප කැමති ය. මෙම ඉවසීම අපේ පුරවැසියන්ගේ චර්යා ලක්ෂණයකි. මෙම දිවයිනේ වැසියන් වසර ගණනාවක් මුළුල්ලේ සාමයෙන් සහ සහජීවනයෙන් ජීවත් ව ඇත. අප උනන්දු වන්නේ සියලු ජාතීන්වල පුද්ගලයින් අතර වන සාමය සඳහා වන කැමැත්ත සහ ඉවසීම යන්නෙහි බලපෑමෙන් මෙම නව අධ්‍යාපනික ව්‍යුහයේ ඉගැන්වීම් සැකසේ ද යන්න පිළිබඳව ය.' [පිට 10 - වාර පත්‍රිකා XX1V, 1943].

එවැනි ස්වෝත්තමවාදී චින්තනයන් වඩවඩාත් ගොඩනගාගත් ක්‍රමයෙහි මධ්‍යය වෙත කේන්ද්‍රගතවත්ම රාජ්‍ය බලය ලබාගැනීමෙන් සහ බෙදාගැනීමෙන් දෙමළ ජනතාව තව දුරටත් දුරස්ථකරණය විය. සිංහල රාජ්‍යය මත මෙසේ බලය කේන්ද්‍රණය වීම, උතුරු නැගෙනහිර පළාත් වෙත තවතවත් බලය ඉල්ලනු වෙනුවට, ඔවුන් 'වෙනම' රාජ්‍යයක් ඉල්ලීම දක්වා තල්ලු කර හැරියේ ය.

නොබෙදුණු රටක, ඒකීය ව්‍යවස්ථාවක් තුළ දෙමළ ජනතාවගේ උවමනාවන් සාධනය කරනු පිණිස කලාපීය මට්ටමින් බලය බෙදා හැරීම අත්‍යාවශ්‍ය විය. මෙම අවශ්‍යතාව පරාජය කළ නොසලකා හැරීම සිදු වූයේ සිංහල ඡන්දදායකයාගෙනි. මෙතෙක් මධ්‍යගතව පැවති රාජ්‍යය මඟින් තමන් පූර්ණ වශයෙන්

සමාජ-දේශපාලනික සහ සංස්කෘතික ජීවිතයෙන් ඉවත් කර තිබුණු බව ඔවුන් දේශපාලනිකව වටහා ගත්තේ නැත. වසර 67 ක නිදහස සහ ජනරජ ව්‍යවස්ථා දෙකක් හරහා පැමිණ තිබුණද, බලය කේන්ද්‍රගත වීමේ වාසි ලබාගෙන තිබුණේ ඉදිරියේදී 'මෙගාපොලිස්' කලාපයක් වීමට නියමිත බස්නාහිර පළාත සහ කොළඹ පමණි.

කොළඹින් බැහැර ඡන්දදායකයා යනු නොසළකා හරින ලද්දෙකි. බස්නාහිර පළාතේ 2.6ක් වන පාසැල් නොයන දරුවන්ගේ ප්‍රතිශතය, ඌව පළාතේදී 7.9%ක් ද, මධ්‍යම පළාතේදී 6.2%ක් ද, සබරගමුව පළාතේ දී 5.1ක් ද සහ දකුණු පළාතේ දී 4.9ක් ද වෙයි. බස්නාහිර පළාතේදී රුපියල් 47,118ක් වන සාමාන්‍ය මාසික ගෘහස්ථ ආදායම, නැගෙනහිර පළාතේදී රුපියල් 23,922ක් පමණක් වන අතර ඌව පළාතේ දී 28,717ක් ද, මධ්‍යම පළාතේදී 31,895ක් ද, සහ දකුණු පළාතේදී 32,514ක් ද වෙයි. (මෙම දත්ත සියල්ලක්ම 2009/2010 දී ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්මේන්තුව විසින් සිදු කළ ගෘහස්ථ ආදයම් සහ වියදම් පිළිබඳ සමීක්ෂණය ඇසුරෙනි.) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සංඛ්‍යා ලේඛණවලට අනුව 2010 සිට 2013 කාල සීමාව තුළ මඩකළපුව, අම්පාර, පුත්තලම, කුරුණෑගල, කෑගල්ල සහ මහනුවර යන පෙදෙස්වලින් ගෘහ සේවය සඳහා විදේශ ගතවන්නන්ගේ සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. මැද පෙරදිග ගෘහසේවය සඳහා රැකියා අපේක්ෂිතයින් පැහැදිලිවම එක් වන්නේ ග්‍රාමීය දරිද්‍රතාව හේතුවෙනි. එම පළාත්වල සිටින ජනතාවගේ ආර්ථික දරිද්‍රතාව සමඟ ඔවුන්ගේ අසාර සංස්කෘතික ජීවිතයද එක්ව බැඳී පවතී. මනා තත්වයේ, යහපත් පුස්තකාල සහ කෞතුකාගාර හෝ හොඳ තත්වයේ නාට්‍ය ශාලා හෝ සිනමා ශාලා කොළඹ නගරයෙන් බැහැර කිසිදු නගරයක හමු නොවේ. හිරු අවරට යත්ම නතර වන පොදු ප්‍රවාහන සේවා හේතුවෙන් ග්‍රාමීය සමාජය තුළ කිසිදු රාත්‍රී ජීවිතයක් දක්නට නැත. ග්‍රාමීය ජීවිතය යනු සංස්කෘතික වශයෙන් මියගිය ජීවිතයකි. බලය බෙදා හැරීම පිළිබඳ දමිළ ජනතා ඉල්ලීමට එරෙහිව බලය දිගින් දිගටම කොළඹ වෙත කේන්ද්‍ර කිරීමට සහාය ලබා දීමෙන් ඔවුන් කිසිදු ආකාරයක යහපතක් උදා කරගෙන නැත.

බලය බෙදා හැරීම සම්බන්ධයෙන් යුද්ධයකට නොගිය ද උතුරට හෝ නැගෙනහිරට වෙනස්ව සිංහල දකුණ විසින් දිනාගන්නා ලද කිසිවක් නොමැත. දකුණේ ග්‍රාමීය සමාජයේ සිංහල තාරුණ්‍යය ද අත් වින්දේ, යහපත් ජීවිතයක් ඉල්ලා සටන් වැදුණු, 1971 සහ 1988 කාල සීමාවන් තුළ නැගුණු විනාශකාරී සන්නද්ධ අරගල දෙකකි.

පළාත් සඳහා බලය බෙදා හැරීම පිළිබඳ තවමත් සාකච්ඡා කර ඇත්තේ දෙමළ දෘෂ්ටි කෝණය අනුව පමණි. වසර 67ක් තිස්සේ දිගින් දිගටම අසාර්ථකව ඇති මෙම සාකච්ඡා බලය කේන්ද්‍රගත වීම යන අර්ථයෙන් එම කරුණ විමසා බලා නැත. ජනවාර්ගික බෙදීම හේතුවෙන් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරනු පිණිස අත්‍යාවශ්‍ය දිළිඳුකම තුරන් කිරීම යන්න අඩපණ ව ගොස් ඇත. ප්‍රජාතන්ත්‍රවාදය සහ වගකීම්සහගත පාලනය පිණිස හා බැඳෙන දකුණේ දරිද්‍රතාව යන්න පිළිබඳ කිසිදු සාකච්ඡාවක් කරළියට පැමිණ නැත.

එබැවින් මෙහිදී සඳහන් කළ යුත්තේ, වසර 67ක නිදහසකින් පසු වුව, රාජ්‍යය සිංහල බල-කේන්ද්‍රීය රාජ්‍යයක් බවට හැරෙමින්, 1928 දී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ඩොනමෝර් කොමිසමේ වාර්තාව සඳහන් කරන ආකාරයට සමාන ලෙස, ග්‍රාමීය දුප්පතුන් කොලනිවාදී අතීතය තුළ තවමත් සිරගතව ඇති බවයි. වාර්තාව අනුවː

> 'බොහෝ පළාත්වල, බොහෝ ගම්මානවල දරිද්‍රතාව සහ රෝගාබාධ බහුල බව කොමිසමට පෙනී ගොස් ඇත. බොහෝ ස්ථානවල ජනතාවට හොඳ තත්වයේ නිවාස හෝ මූලික අධ්‍යාපනය ලැබීම සඳහා අවශ්‍ය පහසුකම් දක්නට නැත. අසරණ බවින් අත්මිදීම සඳහා 'දුප්පතුන් වෙනුවෙන් සරණ වන නීතියක්' හෝ තුවාල ලබන කම්කරුවන්ට වන්දි හිමිවන ක්‍රමයක් හෝ කම්හල් සඳහා යාවත්කාලීන වූ නීති පද්ධතියක් හෝ වෙහෙස දරා සේවය කරන්නන් සඳහා සේවා කාලසීමා සහ වැටුප් පිළිවෙලක් හෝ යන කිසිවක් ඇත්තේ නැතගී

APRC අවසන් වාර්තාවේ වැදගත්කම පැවතියේ 'නොනිල' සම්මුතියක් ලෙස පමණි. සියලු ජනවර්ගවලට ආඩම්බරයෙන් අයිතිවාසිකම් කිව හැකි 'ජාතියේ රාජ්‍යයක්' ගොඩනගන්නට යුද්ධය දිනාගෙන සිය වාසනාව සරි කරගත් ජනපතිවරයා උනන්දුවක් දැක්වූයේ නැත. සිංහල දේශපාලන පක්ෂ ද විවාදයට ඇදෙමින් අවසානය දක්වාම රැඳී සිටීමත් සමඟ APRC අවසන් වාර්තාව, බලය බෙදා හැරීම පිළිබඳ නව කථිකාවක් ගොඩනගනු පිණිස අවශ්‍ය තරම් දේශපාලනික කරුණුවලින් සමන්විත වී තිබිණ. පළාත් සඳහා බලය ඉල්ලා සිටිනු පිණිස දකුණට සුවිශේෂ සහායක කාර්යයකට පිවිසීමට එහි අවකාශයක් පැවතිණ. APRC 'සම්මුතිය' මේ වන තෙක්ම පරීක්ෂාවට බඳුන් කර නොමැති නමුත්, ඒ පිළිබඳ බරපතල කථිකාවක් ප්‍රමාදය හමුවේ වුව ඇරඹීම අගනේ ය.

1983 ජූලි මාසයේ හෝ 1987 ජූලි මාසයේ තරම් ප්‍රබල බලවේගයක් ව සිංහල අන්තවාදයට හිස එසවිය නොහැක. රාජ්‍ය අනුග්‍රහය භුක්ති විඳිමින්, 2014 වර්ෂයේදී බොදු බල සේනා (බොබසෙ) සංවිධානය ඇති කළ කලබලය මේ සඳහා කදිම සාක්ෂියකි. අලුත්ගම ඇති කළ භීෂණයෙන් පසුව වුව, මුස්ලිම් ජනතාවට එරෙහිව මහා උද්ඝෝෂණයක් ඇති කිරීමේ ඔවුන්ගේ උවමනාව, සමාජය තුළ කිසිදු උනන්දුවක් ඇති කිරීමට සමත් වූයේ නැත.  රාජපක්ෂ රජය තුළ උන් ජාතික හෙළ උරුමය (ජාහෙඋ), තමන් වෙත වූ සිංහල සහාය පදනම ගිලිහී ඇති බව විශ්වාස කරන්නට පෙළඹෙන්නේ මේ සමඟිනි. තව දුරටත් ජාතික හෙළ උරුමය යන්න නොපවතින බව දක්වමින් ඔවුන් කැඩී වෙන්ව යන්නේ, පාර්ශව දෙකක් සිරිසේන-වික්‍රමසිංහ රජය හා එක්වෙමින්ද, තුන්වැනි පාර්ශවය විරුද්ධ පක්ෂය තුළ සුරැකෙන්නට උත්සාහ කරමින් ද කටයුතු කිරීමත් සමඟ ය. සිංහල අන්තවාදය බලමුළු ගැන්වීමේ බොබසේ සංවිධානයේ තවත් උත්සාහයක් අසාර්ථක වන්නේ, පළමු වරට එහි නායකයා අත්අඩංගුවට ගැනීමෙන් සහ පසු දින එහි සාමාජික භික්ෂූන් කිහිප දෙනෙකු රිමාන්ඩ් භාරයට පත් කිරීම සමඟිනි. බොබසෙ සහ අනෙකුත් පුද්ගලයින් විශ්වාස කළ අයුරින් භික්ෂූන් අත්අඩංගුවට ගැනීම සමඟ විරෝධතාවක් පැන නැගුණේ නැත. මුලින් විශාල දේශීය වෙළඳපොළ කොටස් ඉලක්ක කර ගනිමින් සිංහල අන්තවාදය සඳහා ප්‍රතිපාදන සැපයූ සිංහල වෙළඳ ප්‍රජාවෙන් වැඩි පිරිසක් වඩා ඉහළ ලාභාංශ වෙනුවෙන් ජාත්‍යන්තර වෙළඳපොළ වෙත පියවර තබා ඇති සැටියකි. ඒ හේතුවෙන් ඔවුන්ට, මෙම දේශපාලනික වශයෙන් යල් පිනූ කණ්ඩායම් වෙනුවෙන් වන සිරිල් මැතිව් ව්‍යාපාර තව දුරටත් අවශ්‍ය නැත.

නව ව්‍යවස්ථාවක් යටතේ, දැඩි ලෙස මධ්‍යගත ක්‍රම පද්ධතිය බිඳ හෙළමින් වඩා යහපත් බලය බෙදීමේ ක්‍රම පද්ධතියකට පිවිසීම පිළිබඳ බරපතල කථිකාවක් ඇති කරනු පිණිස වඩා හිතකර අවකාශයක් දැන් බිහිව ඇත. එය, 'බලය විමධ්‍යගත කිරීම සඳහා සම්මුතික රාමුවක්, එයට ආවේණික ගුණාංගයන් සහිත ආයතනයන්වලින්ද සමන්විත, මනා ලෙස ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය මෙම අවශ්‍යතා පූරණය කරනු ඇති අතර සුළු ජන කොටස්වල ගැටළුවලට ද පිළිතුරක් ලැබෙනු ඇත.' යනුවෙන් එල්එල්ආර්සී අවසන් වාර්තාවේ වන සඳහනට වඩා වැඩි යමක්ද ලබා දෙනු ඇත.

එය දරිද්‍රතාවයෙන් පෙළෙන ග්‍රාමීය සිංහල බහුතරය සඳහා පිළිතුරක් ලබා ගනු පිණිස කටයුතු කිරීමට ද අවකාශයක් සළසා දෙනු ඇත. APRC අවසන් වාර්තාවේ ඇති වටිනාකම එයයි.

**කුසල් පෙරේරා**

ජනමාධ්‍යවේදී

2016 ජනවාරි 23

කොළඹදී ය.

# හැඳින්වීම

රාජ්‍ය බලය සංවිධානය විය යුතු ආකාරය කුමක්දැයි යන ශ්‍රී ලංකාවේ දිගුකාලීන 'ජාතික ගැටළුව' එහි පසු-නිදහස් ඉතිහාසය පුරා පැතිර පවතින්නකි. දශක තුනක සිවිල් යුද්ධයක් ද ඇතුළු දිගුකාලීන දේශපාලන අස්ථාවරභාවයක් හමුවේ වුව, බලයට පත් වූ කිසිදු ආණ්ඩුවක් සියලුම පක්ෂවලට පිළිගත හැකි බලය බෙදා හැරීමේ යෝජනාවලියකට සාකච්ඡා මේසය මතදී එකඟතාව ලබා ගැනීමට අපොහොසත් වී ඇත. බලය බෙදා හැරීම පිළිබඳ දේශපාලනික සම්මුතියක් නියෝජනය කෙරෙන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යෝජනාවලියක් සකස් කිරීම සඳහා හිටපු ජනපති මහින්ද රාජපක්ෂ විසින් 2006 ජූලි මාසයේදී සර්ව පාක්ෂික නියෝජිත කමිටුව (APRC) කැඳවන ලදි. APRC යනු, මෙතෙක් ජාතික ගැටළුව සඳහා සුදුසු පිළිතුරක් ලබා ගැනීමට නොහැකිව කෙළවර වුණු රාජ්‍ය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නවල නවතම පියවරයි. 2009 මැයි මාසයේදී බෙදුම්වාදී දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය සහ ශ්‍රී ලංකා රජය අතර පැවති යුද්ධය කෙළවර වීමෙන් අනතුරුව ජනවාර්ගික ගැටුම සඳහා වැදගත් දේශපාලන විසඳුමක් ලෙස එවැනි යෝජනාවලියක් වැදගත් වේ.

පක්ෂ පහළවක් පමණ වසර තුනක් මුළුල්ලේ සිදු කළ ක්‍රියාකාරකම් සහ ඒ පදනම්ව විද්වත් මඩුල්ලක් විසින් සංග්‍රහිත කරන ලද APRCහි යෝජනා 2009 අගෝස්තු මාසයේදී ජනපති රාජපක්ෂ වෙත ඉදිරිපත් කෙරිණ. එම අවසන් වාර්තාව, විශ්වසනීය වූ පශ්චාත් යුධ දේශපාලනික ස්ථාවරත්වයක් ළඟා කර ගැනීමට හැකි ජීව ගුණයෙන් යුතු පියවර සහිත බලය බෙදීමේ ක්‍රියාදාමයක් යෝජනා කළ බලාපොරොත්තු සපිරුණු යෝජනාවලියක් විය. එහෙත්, එහි වූ උසස් බලාපොරොත්තු සහ කැපී පෙනෙන ප්‍රතිඵල නොසලකා හරිමින්, APRC ක්‍රියාවලිය, අවසන් නොකළ සහ නොවැදගත් අවසානයක් වෙත යොමු විය. එහි යෝජනා කිසිදු විටෙක නිල වශයෙන් ඇගයීමට ලක් වූයේ හෝ ප්‍රකාශයට පත් වූයේ නැත.

2016 ජනවාරි මාසයේදී අගමැති රනිල් වික්‍රමසිංහ යළි නිල වශයෙන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට මුල පුරමින්, පාර්ලිමේන්තුව ව්‍යවස්ථා සභාවක් බවට පත් කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළේ ය. මෙම සන්දර්භය තුළ, APRCහි යෝජනා යළි විමසා බැලීම කාලීන මෙන්ම අදාලත්වයක් සහිත වූවකි. මෙම වාර්තාව ඓතිහාසික අධ්‍යයනයක් වන්නේ එය පහත ඉලක්කවලින් සැදුම් ලත් බැවිණි. එනම්:

1. ක්‍රියාවලිය තුළදී මුදුන් පත් කෙරුණු, රාජ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා වූ අනුක්‍රමික උත්සාහයන්හි අසමත් බව පැහැදිලි කිරීම; සහ

2. APRC යෝජනාවලින් නියෝජනය වන, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ වන නව්‍ය විවාද සඳහා භාවිතා කළ හැකි වටිනා ආරම්භක ලක්ෂ්‍යයක් පෙන්වා දීම.

මෙය කොටස් පහකින් සමන්විතව ඇත:

**I කොටස** ශ්‍රී ලංකාවේ පසු-නිදහස් කාල සමයේ සිට 2006 වර්ෂයේ මැද භාගයේදී සර්ව පාක්ෂික නියොජිත කමිටුව පිහිටුවන තෙක් යුගය තුළ

අනුක්‍රමික ආණ්ඩු විසින් සිදු කෙරුණු ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ උත්සාහයන් කෙටියෙන් හඳුන්වා දෙනු ඇත.

**II කොටස** APRC පිහිටුවීමේ සිට එහි වාර්තාව නිකුත් කරන තෙක් කාල සමය තුළ සිදුවුණු ප්‍රධාන සිදුවීම් කෙටියෙන් හඳුන්වා දෙයි.

**III කොටස** ශ්‍රී ලංකාවේ වූ රාජ්‍ය ප්‍රතිසංස්කරණ උත්සාහයන් දිගින් දිගටම අසාර්ථක වූ ආකාරයන් පැහැදිලි කරමින් APRCහි ක්‍රියාකාරකම්වලදී සමාන ඓතිහාසික කරුණු යළි නැග ඒම වළක්වා ගනු ලැබූයේ කෙසේද යන්න පැහැදිලි කරයි.

**IV කොටස** තුළදී APRC හි ප්‍රමුඛ ප්‍රතිදානයන් සාකච්ඡා කරමින් එහි අවසන් වාර්තාවේ ඇති යෝජනාවන්හි සාරාංශයක් ඉදිරිපත් කරයි.

**V කොටස** තුළදී ජාතික ගැටළුව විසඳීම ඉලක්ක කරගත් පදනම් සහගත ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යෝජනාවලියක් ලෙස APRC යෝජනාවලියේ ඇති අනවරත අදාලත්වය සාකච්ඡා කරයි.

# I

# සර්ව පාක්ෂික නියෝජිත කමිටුවට පෙර යුගය

සර්ව පාක්ෂික නියෝජිත සමුළුව යනු ජාතික ගැටළුවට ජීව්‍ය පිළිතුරක් විමසනු පිණිස වූ දිගු ඓතිහාසික ක්‍රියාකාරකම් මාලාවක ආසන්නතම පියවරයි. රාජ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා සපානිකට පෙර ගෙන එන ලද බොහෝ යෝජනා අතුරින් පහත සඳහන් කරන යෝජනා බලය බෙදාහැරීම පිළිබඳ සංවාදයට වඩා ඵලදායි දායකත්වයක් ලබා දී ඇත.

## බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම (1957)

සිංහල භාෂාව දිවයිනේ එකම රාජ්‍ය භාෂාව බවට පත් කිරීම පිළිබඳ වූ ව්‍යාපාරයෙන් පසු, 1956 දී මහජන එක්සත් පෙරමුණෙන් (මඑපෙ) තරග කළ එස්.ඩබ්ලිව්. ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිවරයා වශයෙන් තේරී පත් විය. එම වසර තුළදීම (සිංහල පමණක් පනත ලෙස ප්‍රසිද්ධියට පත්) රාජ්‍ය භාෂා පනත, දෙමළ පක්ෂවල විරෝධයත්, පසුව නැගිය හැකි ප්‍රචණ්ඩත්වය පිළිබඳ භීතියත් සමගම, සම්මත කෙරිණ. වසරකට පමණ පසු, 1957 ජූලි මාසයේ දී රජයේ නියෝජිතයින් සහ එස්.ජේ.වී. චෙල්වනායගම්ගේ නායකත්වයෙන් යුත් ප්‍රධාන දමිළ පක්ෂය වූ ෆෙඩරල් පක්ෂය අතර හමුවීම් මාලාවක් පැවැත්විණ. මෙහි තීරණ අවසානයේ රැගෙන ආවේ, බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම ලෙසින් හැඳින්වුණු ඉතිහාසයේ මංසළකුණක් සටහන් කළ එකඟතාවයි.

එවකට අගමැතිවරයා වුණු එස්. ඩබ්ලිව්. ආර්. ඩී.



Courtesy of www.nation.lk

බණ්ඩාරනායක සහ එස්. ජේ. වී. චෙල්වනාගයගම් දෙදෙනා විසින් අත්සන් කරන්නට යෙදුණු මෙය උප-ජාතික ඒකක හරහා පරිපාලනය සුවිශේෂ ලෙස විමධ්‍යගත කරමින් ගෙන ආ ප්‍රථම ගිවිසුම විය. එය සම්මුතිවාදී ගිවිසුමක් වූයේ, (ෆෙඩරල් පක්ෂයේ ප්‍රමුඛ අරමුණ වූ) ෆෙඩරල් ක්‍රමය ගැන හෝ රාජ්‍ය භාෂා පනත උල්ලංඝණය කරන කිසිදු පියවරක් ගැන හෝ සාකච්ඡා කිරීම බණ්ඩාරනායක ප්‍රතික්ෂේප කළ හෙයිනි.

ගිවිසුම මඟින්:

- උතුරු පළාත එක් කලාපයක් ලෙස සහ නැගෙනහිර පළාත කලාප දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් ලෙස ව්‍යවස්ථාගත කෙරෙන කලාප සභා ක්‍රමයක් ඇති කිරීමටත්;

- කලාප සභා දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් පොදු අවශ්‍යතාවන් යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඒකාබද්ධ කිරීමටත්; සහ

- දෙමළ බස සඳහා රාජ්‍ය භාෂාවක තත්වය ලබා නොදුන්නද, උතුරු සහ නැගෙනහිර පළාත් පරිපාලනයේදී දෙමළ බස ජාතික සුළුතර භාෂාවක් සහ පරිපාලන භාෂාවක් ලෙස නම් කිරීමටත් එකඟ විය.

ප්‍රධාන විපක්ෂය වූ එක්සත් ජාතික පක්ෂය (එජාපය), ඒ හා සමඟ, ගිවිසුමට විරුද්ධ ව්‍යාපාරයක් ආරම්භ කළ අතර ජේ.ආර්. ජයවර්ධනගේ නායකත්වයෙන් යුතුව මහනුවර බලා ගිය පාගමනකින්ද ඒ සමන්විත විය. බෞද්ධ භික්ෂූහු ද ගිවිසුමට විරුද්ධ වූහ. 1958 අප්‍රේල් මාසයේදී බණ්ඩාරනායක විසින් ප්‍රසිද්ධියේ ගිවිසුම ඉරා දමන ලදි.

ඒ අතර, ගිවිසුම ඉරා දැමීමට එරෙහිව සත්‍යාග්‍රහයක් අරඹන බවට ෆෙඩරල් පක්ෂය තර්ජනය කළේ ය. ඉන් පසු, 1958 මැයි මාසයේදී දෙමළ විරෝධී ප්‍රචණ්ඩ වාර්ගික රැල්ලක් පැන නැගුණු අතර කොල්ලකෑම්, ගිනි තැබීම් සහ දෙමළ ජනයා බොහෝ පිරිසක් මරා දැමීම සිදු විය. මෙය නිදහසින් පසු පැන නැගුණු ප්‍රථම ප්‍රධාන වාර්ගික ප්‍රචණ්ඩත්වය හමුවූ අවස්ථාව විය. එයට ප්‍රතිචාර දක්වමින් රජය විසින් හදිසි නීතිය ප්‍රකාශයට පත් කරන ලද අතර සිංහල අන්තවාදී කණ්ඩායමක් වූ ජාතික විමුක්ති පෙරමුණ ද සමඟ ෆෙඩරල් පක්ෂය තහනම් කරන ලදී.

එම වසරේ අගෝස්තු මාසයේදී, උතුරු සහ නැගෙනහිර පළාත්වල අධ්‍යාපනය, සිවිල් සේවය සඳහා ඇතුළුවීමේ විභාග සහ පරිපාලනය සඳහා දෙමළ භාෂාව භාවිතා කිරීමට අවසර දෙමින් 1958 අංක 28 දරණ දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනත හඳුන්වා දෙනු ලැබිණ. මෙම පියවර ද විශාල ජාතික විරෝධයක් නැග ඒමට හේතු විය 1959 සැප්තැම්බර් මාසයේදී බෞද්ධ භික්ෂුවක විසින් බණ්ඩාරනායක ඝාතනය කෙරෙන ලදි.

## ඩඩ්ලි සේනානායක - චෙල්වනායගම් ගිවිසුම (1965)

මෙම ගිවිසුම අත්සන් කෙරෙන ලද්දේ එවකට අගමැතිවරයා වූ එජාපයේ ඩඩ්ලි සේනානායක සහ එස්.ජේ.වී. චෙල්වනායගම් අතර 1965 මාර්තු මස 24 වැනිදා ය. එහි ප්‍රධාන කරුණු ලෙස අඩංගු වූයේ;

- 1958 දරණ දෙමළ භාෂා (විශේෂ) විධිවිධාන පනත බලාත්මක කිරීමට ඉක්මන් පියවර ගැනීම සහ එය නියාමනය කිරීමට අවශ්‍ය සුදුසු නීති ඉදිරිපත් කිරීම;
- නායකයින් දෙදෙනා අතර ඇතිවන අන්‍යෝන්‍ය එකඟතාව පදනම්ව, මධ්‍යම රජය පිහිටුවන සභා වෙත උපදෙස් ලබා දීමේ බලය ජාතික අවශ්‍යතාව යටතේ තමන් වෙත තබා ගනිමින්, දිස්ත්‍රික් සභා පිහිටුවීම; සහ
- උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනපද බිහිකිරීමේ යෝජනා ක්‍රම යටතේ පහත ප්‍රමුඛතා අනුපිළිවෙල සැලකිල්ලට ගැනෙනු ඇත: (i) දිස්ත්‍රික්කයේ ඉඩම් නොමැති; (ii) උතුරු සහ නැගෙනහිර පළාත්වල දෙමළ කතා කරන පුද්ගලයින්; (iii) සෙසු පුරවැසියන්.

එයට ප්‍රතිචාර ලෙස, (ඒ වන විට, බණ්ඩාරනායකගේ වැන්දඹු බිරිඳ වූ සිරිමාවෝ බණ්ඩාරනායක නායකත්වය දැරූ) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, දෙමළ භාෂාවේ 'සාධාරණ භාවිතය' යන්නට එරෙහිව ව්‍යාපාරයක් ආරම්භ කළ අතර ඔවුන් කියා සිටියේ එය ශ්‍රී ලංකාව දෙකඩ කිරීම සඳහා වන මුල් පියවර වන බවයි. ඒ අතරතුර සිදුවුණු, ෆෙඩරල් පක්ෂය සහ එජාපය අතර සාකච්ඡා පල රහිත වූ අතර ගිවිසුම කිසිදු මොහොතක ඵලදායී ලෙස භාවිතයට කැඳවූයේ නැත.

1970 දශකය අග භාගයේදී ජනවාර්ගික යුද්ධය ආරම්භ වීමෙන් පසුව, බලයට පැමිණි ඒ ඒ ආණ්ඩු විසින් ගෙන එන ලද බලය බෙදා හැරීමේ යෝජනා, උතුරු යුධ බිමෙහි පැවති උපායමාර්ගික තත්වයන්ට ප්‍රතිචාර බවට පත් විය. බලය බෙදා හැරීමේ යෝජනා පිළිබඳ සියලුම පක්ෂ අතර එකඟතාවක් ඇති කිරීම වඩා අභියෝගාත්මක වීමට පටන් ගැනුණේ දිනෙන් දින උත්සන්න වුණු යුධවාදී හා වාර්ගික-ජාතිකවාදී දෘෂ්ටිවාදයන් හමුවේ පහසුවෙන්ම දකුණේ මිනිසුන් උසිගැන්වීමට විරුද්ධ පක්ෂවලට ඉඩ ලැබුණු හෙයිනි.

## එජාපය යටතේආ බලය බෙදා හැරීමේ යෝජනා (1984-1994)

### 1984 - සර්ව පාක්ෂික සමුළුව (සපාස)

1983 දී, ඉන්දීය අගමැති ඉන්දිරා ගාන්ධි විසින් විශේෂ නියෝජිත ගෝපාල්ස්වාමි ප්‍රතාසාරතී පත් කරන ලද්දේ ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ (ද්‍රඑවිපෙ) සමග සාකච්ඡා පැවැත්වීමට ය. මෙම සාකච්ඡා අතරතුර ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන විසින් සර්ව පාක්ෂික සමුළුවක් කැඳවිය යුතු බවට එකඟතා පළ විය. සර්ව පාක්ෂික සමුළුවේ දී එකඟතාව සඳහා සාකච්ඡා කළ යුතු යෝජනාවලියක් ද මෙහිදී සකස් කෙරිණි. මෙම යෝජනා 'සී ඇමුණුම්' ලෙස ප්‍රසිද්ධියට පත් වුණු අතර ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් සඳහා වෙනම කලාප සභාවන් ගොඩ නැංවීම සඳහා වන යෝජනා එහි ඇතුළත්ව තිබිණි. කෙසේ වෙතත්, සර්ව පාක්ෂික සමුළුවේ පළමු රැස්වීම් වාරයට ප්‍රථම 'බී ඇමුණුම්' ලෙස නම් කෙරුණු වෙනස් යෝජනා මාලාවක් එහි සාමාජිකයින් අතර බෙදා හැරිණි. පසුව 'සී ඇමුණුම්' ද ඉදිරිපත් කෙරිණි. මේ හේතුවෙන් සර්ව පාක්ෂික සමුළුව පසුපස ඇති අපේක්ෂා පිළිබඳ සහ ක්‍රියාකාරකමේ පලදායීතාව පිළිබඳ සහභාගි වූවන් තුළ සැක පහළ විය.

සමුළුව 1984 ජනවාරි මාසයේදී ආරම්භ වූයේ රාජ්‍ය බලය ලබා උන් එජාප, ශ්‍රීලනිප සහ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය (ශ්‍රීලකොප), ලංකා සමසමාජ පක්ෂය (ලසසප), මහජන එක්සත් පෙරමුණ (මඑපෙ), සමස්ථ ලංකා ද්‍රවිඩ කොංග්‍රසය (සලද්‍රකො), ලංකා කම්කරු කොංග්‍රසය (ලකකො), ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු කොංග්‍රසය (ප්‍රකකො) සමඟ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ යන අනෙකුත් විරුද්ධ පක්ෂවල සහභාගීත්වයෙනි.

සර්ව පාක්ෂික සමුළුවේ සාකච්ඡා වසරකට වැඩි කලක් පැවතිණ. රජය එහි පැන නැගි යෝජනා, දිස්ත්‍රික් සහ පළාත් සභා සංවර්ධන පනත සහ පළාත් පාලන ආයතන පනත යන පනත් සහිත 10 වන ව්‍යවස්ථා සංශෝධනය ලෙස ඉදිරිපත් කළේ ය. කෙසේ නමුත්, මෙම යෝජනාවන් බලය බෙදා හැරීම පිණිස කිසිදු අර්ථසම්පන්න අදහසක් නොගෙනා අතර (ප්‍රධාන දෙමළ ජනතා නියෝජන පක්ෂය වූ) ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ඒ ප්‍රතික්ෂේප කළේ ය. 1984 දෙසැම්බර් මාසයේදී සර්ව පාක්ෂික සමුළුව විසුරුවා හැරිණ.

### 1985 තිම්පු සාකච්ඡා

1985 ජූලි සහ අගෝස්තු දෙමස තුළ පැවති තිම්පු සාකච්ඡා, සාමය ඇති කරනු පිණිස ශ්‍රී ලංකා රජය සහ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ, එල්ටීටීඊ සංවිධානය, ඊලාම් විප්ලවවාදී ශිෂ්‍ය සංවිධානය (ඊරොස්), දෙමළ ඊලාම් විමුක්ති සංවිධානය (ටෙලෝ), ඊලාම් ජනතා විප්ලවවාදී විමුක්ති පෙරමුණ (ඊපීආර්එල්එෆ්) සහ දමිළ ඊලාම් සඳහා වූ ජනතා විමුක්ති සංවිධානය (ප්ලොට්) යන දමිළ සංවිධාන හයක එකතුවක් අතර පැවති ඊළඟ සාම සාකච්ඡා උත්සාහයයි. ඉන්දියාව විසින් සාකච්ඡා සඳහා පහසුකම් සපයා දෙනු ලැබූ අතර විදේශ ලේකම් රොමේෂ් බන්දාරි ප්‍රධාන භූමිකාව ලෙස කටයුතු කළේ ය. තිම්පු සාකච්ඡා වට දෙකකින් සමන්විත විය. පළමු වටය ජූලි මස 08 වැනි දින සිට 13 වැනි දින දක්වා පැවති අතර දෙවැනි වටය අගෝස්තු මස 12 වැනි දින සිට 17 වැනි දින දක්වා පැවැත්විණ. සාකච්ඡාවේ පළමු වටයේ අවසාන දිනයේ දමිළ සංවිධාන හය විසින් සිව් වැදෑරුම් මූල පදනමක් ඉදිරිපත් කරන ලදි. ශ්‍රී ලංකා රජය විසින් ගෙන එනු ලබන ඕනෑම යෝජනාවක් සඳහා මෙම මූල පදනම් ප්‍රමුඛ කොට ගැනීම අපේක්ෂා කෙරිණ. ඒවා නම්:

- ශ්‍රී ලාංකික දමිළයින් ජාතියක් ලෙස පිළිගැනීම
- ශ්‍රී ලාංකික දමිළයින් සඳහා හඳුනාගත් නිජබිමක් පවතින බව පිළිගැනීම
- දමිළ ජාතියෙහි ස්වයං-නිර්ණ අයිතිය පිළිගැනීම
- ශ්‍රී ලංකාවේ වෙසෙන සියලුම දමිළ ජාතිකයින්ට ඇති පුරවැසිභාවය ලැබීමේ අයිතිය සහ මූලික අයිතිවාසිකම් පිළිගැනීම

කෙසේ නමුත්, ශ්‍රී ලාංකික රාජ්‍ය දූත පිරිසෙහි නායකයා ලෙස ජනපතිවරයා විසින් පත් කරනු ලැබ තිබුණු, ජයවර්ධන ජනපතිවරයාගේ සොහොයුරු හෙක්ටර් ජයවර්ධන විසින් මෙම යෝජනා ඍජුවම ප්‍රතික්ෂේප කරන ලදි. 1985 අගෝස්තු 17 වැනිදා

දමිළ කණ්ඩායම් සාකච්ඡාවෙන් ඉවත් වූ අතර එකඟතාවකින් තොරව සාකච්ඡා කෙළවර විය.

## 1985 - දිල්ලි ගිවිසුම

ඉන්දීය විදේශ ලේකම් රොමේෂ් බන්දාරි දිල්ලියේදී සාකච්ඡා පෙරට ගෙන යා යුතු යැයි බල කර සිටියේ ය. ශ්‍රී ලංකා රජයට (ඊට ප්‍රථම තෙමසක කාලයක් සඳහා සාකච්ඡා තිබුණු සහ සැප්තැම්බර් මැදදී අවසන් වීමට නියමිතව තිබුණු) 'සටන් විරාමය' දිගුවක් නිර්දේශ කිරීම දිරිමත් කරන ලදි. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ සමඟ පමණක් කටයුතු කිරීමට අදහස් කොට තිබුණ ද, බන්දාරි මෙම සාකච්ඡා අතරතුර දමිළ කණ්ඩායම් සමඟ නොකඩවා සන්නිවේදනය කිරීම සිදු කළේ ය. සාකච්ඡා 'දිල්ලි ගිවිසුම' නොඑසේනම්, 'ගිවිසුම හා අවබෝධතාව පිළිබඳ කෙටුම්පත් රාමුව' ගෙන ආවේ ය.[2] කෙසේ නමුත්, ශ්‍රී ලංකා රාජ්‍යයේ ඒකීයත්වය බිඳ වැටීම හා ඒ හා සමඟ ශ්‍රී ලංකාවේ දමිළ බහුතරයක් වෙසෙන කලාප වෙන්වී යෑමේ අවදානම මෙම යෝජනා මඟින් සිදු විය හැකිය යන පදනම මත ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව සහ කැබිනට් මණ්ඩලය මෙම ලේඛණය අනුමත කළේ නැත.

## 1987 ඉන්දු-ලංකා ගිවිසුම

1987 වර්ෂයේ ජූලි මස 29 වැනිදා ඉන්දීය අගමැති රජීව් ගාන්ධි සහ ශ්‍රී ලංකා ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන විසින් ඉන්දු ලංකා ගිවිසුම කොළඹදී අත්සන් තබන ලදී. ඉන්දු ලංකා ගිවිසුම, ශ්‍රී ලංකාව



Courtesy of www.asiantribune.com

'බහු වාර්ගික සහ බහු භාෂා, බහුත්ව සමාජයක්ව' පැවති බව පිළිගත් අතර සියලු ජනකොටස් අතර බලය බෙදී යාම සඳහා අදාල ආයතනික රාමුව සාදා දීමට වෑයම් කරන බව ප්‍රකාශ කළේ ය. ගිවිසුමෙහි අඩංගු ප්‍රධාන කරුණු අතර උතුරු සහ නැගෙනහිර දෙපළාත් තනි කළමණාකාරණ කලාපයක් ලෙස හඳුනාගැනීම, ගිවිසුම අත්සන් කර තෙමසක් ඇතුළත පළාත් සභා මැතිවරණය පැවැත්වීම සහ සිංහල භාෂාව සමඟ දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාද්වයත් රාජ්‍ය භාෂා ලෙස ස්ථාපිත කිරීම ඇතුළත්ව තිබිණ.

ගිවිසුම පදනම්ව, පළාත් සභා සඳහා ස්වාධිපත්‍යය බලය ලබා දීමේ අරමුණින් 13වන ව්‍යවස්ථා සංශෝධනය (13A) ඉදිරිපත් කෙරිණ. 1987 නොවැම්බර් මස 14 වැනි දින සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණු ඇත 1988 ජනවාරි මස 26 වැනි දින පටන් බලාත්මක කෙරිණ. 13A සංශෝධනයේ අඩංගු වූ ප්‍රධාන කරුණු පහත පරිදි විය.

- ඉංග්‍රීසි භාෂාව 'සම්බන්ධීකරණ' භාෂාවක් වන අතර දෙමළ භාෂාව ද ශ්‍රී ලංකාවේ 'රාජ්‍ය' භාෂාවකි;
- ජනමත විචාරණයකට යටත්ව, උතුරු හා නැගෙනහිර දෙපළාත් එක් පළාතක් බවට පත් කිරීමට කටයුතු කරනු ඇත;
- පළාත් සභා වසර පහතට වරක් පත් කෙරෙනු ඇති අතර, එක් එක් පළාත වෙනුවෙන් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ආණ්ඩුකාරවරයින්ට විධායක බලතල හිමි වනු ඇත;
- 'වෙන් කළ' ලැයිස්තුව සහ 'පළාත්' ලැයිස්තුව, මධ්‍යම රජය සහ පළාත් වෙත පිළිවෙලින් හිමි වන බලය දක්වනු ඇති අතර 'සමගාමී' ලැයිස්තුව හවුල් බලතල දක්වනු ඇත; සහ
- මහජන ආරක්ෂක ආඥාපනත යටත් ජනාධිපතිවරයා විසින් පනවන නීති මෙම පළාත් සභා නීති අභිභවා බලපැවැත්වෙනු ඇත.

2. 'The Process of Negotiations', Sangam.Org, at http://www.sangam.org/FB_PHOTORAW/4.htm (අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20).

කෙසේ නමුත්, 13A සංශෝධනයට සහ සුවිශේෂී වශයෙන් ඉන්දීය මැදිහත් වීමට වූ සැළකිය යුතු විරුද්ධ පාක්ෂිකයින් හේතුවෙන් එයින් අනුමැතිය ලැබුණේත් භාවිතයට කැදවූයේත් සීමිත අංග ප්‍රමාණයකි. ජනතා විමුක්ති පෙරමුණෙහි (ජවිපෙ) සංවිධානාත්මක දේශපාලන ව්‍යාපාරය, ජවිපෙ අනුබද්ධ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය විසින් ක්‍රියාත්මක කෙරුණු, වූ දකුණේ දෙවැනි සන්නද්ධ අරගලය (1971 දී ජවිපෙ සිය පළමු සන්නද්ධ අරගලයෙන් පරාජයට පත් විය.) බවට ඒ හා සමඟ රූපාන්තරය විය.

## 1989 - සර්ව පාක්ෂික සමුළුව

දෙවැනි ජවිපෙ සන්නද්ධ අරගලය දකුණේ ක්‍රියාත්මක වන අතරතුර, 1988 දෙසැම්බර් මාසයේදී ජනාධිපතිවරණය පැවත්වුණු අතර එජාපයේ රණසිංහ ප්‍රේමදාස ඉන් ජය හිමිකර ගත්තේ ය. ප්‍රේමදාස යුගයේදී එල්ටීටීඊ සංවිධානය සමඟ සාම වෑයම් අවස්ථා දෙකක් දක්නට ලැබිණ. පළමුවැන්න, 1989 මැයි මාසයේදී ආරම්භ කෙරුණු වට තුනකින් යුත් සෘජු සාකච්ඡා ය. එහිදී රජයේ නියෝජිත කණ්ඩායමේ නායකත්වය උසස් අධ්‍යාපන ඇමති ඒ.සී.එස්. හමීඩ් විසින් දරණ ලද අතර එහි තිබුණු සුවිශේෂත්වය වූයේ සාකච්ඡා දෙමළ බසින් පැවැත්වූ එකම අවස්ථාව එය වීමයි.

දේශපාලන පක්ෂ 22ක, නියෝජිතයින් 90 දෙනෙකුගේ සහභාගීත්වයෙන්, ජනාධිපති ප්‍රේමදාස විසින් 1989 සැප්තැම්බර් මස 13 වැනි දින කැඳවන්නට යෙදුණු සර්ව පාක්ෂික සමුළුව (APC) දෙවැනි අවස්ථාවයි. එල්ටීටීඊ සංවිධානය ද නිරීක්ෂකයෙකු ලෙස සමුළුවට සහභාගී වූ අතර රජය සමඟ ඊට පෙර සිදු කළ සාකච්ඡා ඉස්මතු කෙරිණ. රජය විසින් තහනම් කරනු ලැබ තිබුණු ජවිපෙ සාකච්ඡා සඳහා සහභාගී වූයේ නැත. ඔක්තෝබර් මාසයේ පැවති දෙවැනි අදියරේදී විරුද්ධ පක්ෂ සමුළුවෙන් ඉවත්ව ගියේ රජයේ පාර්ශවය සිය යෝජනා සැළකිල්ලට නොග න්නේ ය යන්න පදනම් කරගනිමිනි.

## 1991- මංගල මුණසිංහ තේරීම් කමිටුව

ජනවාර්ගික ගැටළුව සඳහා විසඳුමක් සැපයෙන ව්‍යවස්ථා සැලසුමක් සම්පාදනය කරනු වස් ජනාධිපති ප්‍රේමදාස කැඳවූ සර්ව-පාක්ෂික පාර්ලිමේන්තු තේරීම් කමිටුවේ සභාපතිත්වය දරණ ලද්දේ ශ්‍රීලනිපයේ මංගල මුණසිංහ විසිනි. එම කමිටුව, ශ්‍රීලනිප, එජාප, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, ලසසප, දඑවිපෙ, මඑපෙ සහ ලංකා වතු කම්කරු කොංග්‍රසය සහ (සිය පෞද්ගලික අභිමතය පදනම්ව පැමිණි) අනෙකුත් මන්ත්‍රීවරුන් සහ සිවිල් සංවිධාන සම්බන්ධ වූ සාමාජිකයින් 45කගෙන් සැදුම් ලද්දකි. මෙම තේරීම් කමිටුව ලිඛිත අදහස් දැක්වීම් ඉල්ලා සිටි අතර නිර්දේශය සඳහා යෝජනා පත්‍රිකා 253ක් ඉදිරිපත් කෙරිණ. කෙසේ වෙතත්, එල්ටීටීඊ සංවිධානය මෙන්ම, ප්‍රධාන දෙපක්ෂය වූ ශ්‍රීලනිපය හා එජාපය කිසිදු යෝජනාවක් ඉදිරිපත් කළේ නැත.

තේරීම් කමිටුවට උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීම පිළිබඳ ගැටළුවට පිළිතුරක් සපයාගත නොහැකි විය. මුස්ලිම් නියෝජිතයන් විරුද්ධ වුණු, ඒකාබද්ධ දේශපාලන-පරිපාලන ඒකකයක් සඳහා දෙමළ දේශපාලන පක්ෂ ස්ථාවර ලෙස පෙනී සිටිය හ. උතුරු හා නැගෙනහිර දෙපළාත්වල සිය එක් එක් ජනවර්ගය සඳහා බලපාන කාරණා සම්බන්ධ සම්මුතිගත විසඳුමකට පැමිණීමට දෙමළ සහ මුස්ලිම් නියෝජිතයින්ට නොහැකි විය. තේරීම් කමිටුව නිසි පිළිතුරු ලබා ගැනීමකින් තොරව අවසන් කෙරුණ ද, උතුරු හා නැගෙනහිර දෙපළාත්වල මුස්ලිම් ජනයාගේ ආරක්ෂාව සමබන්ධයෙන් අන්තර්-පාක්ෂික සහයෝගීතාවක් ගොඩනගා ගැනීමට දෙමළ පක්ෂ සහ මුස්ලිම් කොංග්‍රසය සමත් වූ හ.

ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ විවාදය සඳහා කමිටුවේ ඉතාම වැදගත් දායකත්වය සිදු වූයේ මුණසිංහ විසින් කමිටුවට ඉදිරිපත් කළ 'මනාප පත්‍රිකා' අඩංගු යෝජනා සමඟිනි. මෙමඟින් යෝජනා වූයේ, වෙන් වශයෙන් උතුරු සහ නැගෙනහිර පළාත් සහා සඳහා නියෝජිතයින්ගෙන් සහිත, දෙපළාත සඳහාම නිරූපිත බලයක් සහිත තනි කලාපීය ආණ්ඩුකාරවරයෙකුගෙන් සමන්විත, දෙපළාතේම අංශ වැසී යන පාලම් යාන්ත්‍රණයකින් යුක්ත උතුරු-නැගෙනහිර කලාපීය සභාවකි. දෙපළාතේ මහඇමතිවරු කලින් කලට මාරු වෙමින් කලාපයේ මහඇමති ධූරය හෙබවිය යුතු බව එහිදී යෝජනා කෙරිණ.

## ශ්‍රීලනිපය සහ 'ඒකාබද්ධ' රජය යටතේ විමධ්‍යගත යෝජනා

### 1994 ඔක්තෝබරයේ සිට 1995 අප්‍රේල් දක්වා - එල්ටීටීඊය සමඟ සාම සාකච්ඡා

1993 මැයි මාසයේදී ජනාධිපති ප්‍රේමදාස ඝාතනය කෙරුණු අතර ඩී.බී. විජේතුංග බලයට පත් විය.1994 අගෝස්තු මාසයේදී පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වුණු අතර ශ්‍රීලනිපයේ නායකත්වයෙන් යුතු පොදුජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය හිමිකර ගත්තේ ය. ඉතා කෙටි කලකින්, 1994 නොවැම්බර් මාසයේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපති තනතුරට තේරී පත් විය. 1994 ඔක්තෝබර් - 1995 අප්‍රේල් කාල පරිච්ඡේදය තුළ නව රජය විසින් එල්ටීටීඊය සමඟ සාම සාකච්ඡා වට හතරක් පවත්වන ලදි. කුමාරතුංග අගමැති ධුරයේ සිටියදීම, 1994 ඔක්තෝබරයේ පළමු වටයේ සාකච්ඡා යාපනයේ චුන්ඩිකුලිහිදී පැවැත්විණ. දෙවන සහ තෙවන වටයේ සාකච්ඡා පවත්වන ලද්දේ 1995 ජනවාරි මාසයේදී ය. 1995 දී රජය 'කලාප සංගමය' නම් වූ බලය බෙදීමේ පැකේජය ඉදිරිපත් කළ අතර අර්ධ-ෆෙඩරල් තත්වයක් එමඟින් යෝජනා වී තිබිණි. යෝජනාවලියේ ප්‍රධාන අංගයන් පහත පරිදි වේ:

- 'කලාපය' යනු බලය බෙදා හැරීමේ ඒකකය වනු ඇත. කලාපය යන්න සමානුපාතික වන්නේ 'පළාත' යනුවෙන් හඳුන්වන භූමි ප්‍රදේශයට ය. දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය (1987) අනුකූලව උතුරු සහ නැගෙනහිර දෙපළාත, උතුරු-නැගෙනහිර පළාත ලෙස සැලකීමත් සමඟ උතරු-නැගෙනහිර මෙහිදී එක් තනි කලාපයක් ලෙස පිහිටුවනු ඇත. සෑම කලාපයක්ම කලාප සභාවක් මගින් නියෝජනය කෙරෙනු ඇත.
- වෙන් කළ ලේඛණයක් මගින් දක්වා තිබෙන අංශ හැර, නීති සම්පාදන බලය කලාප සභා වෙත පැවරෙනු ඇත.
- දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පැවති සමගාමී ලැයිස්තුව අහෝසි වනු ඇත.
- මහ ඇමතිවරයාගේ එකඟත්වය සහිතව එක් එක් කලාප සඳහා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුකාරවරයකු බැගින් පත් කරනු ඇත.
- විධායක බලතල පූර්ණ වශයෙන් ඇමති මණ්ඩලය වෙත පැවරෙනු ඇත.
- කොළඹ සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ යන නගර ඇතුළත් ප්‍රදේශ අගනුවර ප්‍රදේශය ලෙස ස්ථාපිත කරමින් මධ්‍යම රජයේ සෘජු පරිපාලනය යටතේ පවතිනු ඇත.
- විදේශ ණය ලබාගැනීම් සහ රාජ්‍ය මූල්‍ය සම්බන්ධ සීමිත බලතල පමණක් කලාප සභා වෙත හිමිවනු ඇත.
- ඉඩම් බලතල බෙදී යන්නක් වනු ඇත. කලාප සභාවේ උපදේශකත්වය මත රැඳෙමින් කලාප සභා බල ප්‍රදේශවල රජයේ ඉඩම්, සංවෘත ලැයිස්තුවක් යටතේ, අවශ්‍යතා පදනම්ව පවත්වාගෙන යනු ඇත.

1995 අප්‍රේල් 19 වැනි දින ශ්‍රී ලංකා රජය සහ එල්ටීටීඊය අතර පැවති සාම සාකච්ඡා බිඳ වැටුණේ එල්ටීටීඊය විසින් නිරීක්ෂණ බෝට්ටු දෙකක් ගිල්වා දැමීමත් සහ 97ක් වූ සමස්ථ හට කණ්ඩායම මරා දමමින් හටයින් ගමන් කළ ගුවන් යානා දෙකක් බිම හෙළීමත් සමඟ ය. මෙම ප්‍රහාර තුන්වන ඊලාම් යුද්ධය ආරම්භ වීම සඳහා උත්ප්‍රේරක සැපයී ය.

1995 - බලය බෙදීමේ පැකේජය, සුළුජාතික පක්ෂ සමඟ තව දුරටත් සාකච්ඡා කොට එකඟතාවලට පැමිණීමෙන් පසු, කුමාරතුංග රජය විසින් ඉදිරිපත් කරන ව්‍යවස්ථා කෙටුම්පත ලෙස සකස් කෙරිණි. කෙසේ නමුත්, 2000 වර්ෂයේදී මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමත් සමඟ එජාපය ඒ සඳහා සිය සහාය දීමෙන් ඉවත්ව ගියේ ය. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරය ලබා ගැනීමට නොහැකි වීමෙන් පනත බලාත්මක නොවිණි.

### 1997 ඔක්තෝබර් - ව්‍යවස්ථා සංශෝධන සඳහා රජයේ යෝජනා

අමාත්‍ය ජී.එල්.පීරිස් යටතේ පැවති, අධිකරණ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

# කාල රේඛාව - සර්ව-පාක්ෂික නියෝජිත කමිටුවට පෙර

1957 බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම

1965 ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුම

1972 පළමු ජනරජ ව්‍යවස්ථාව

1978 දෙවැනි ජනරජ ව්‍යවස්ථාව

1984 ජේ.ආර්.ජයවර්ධන විසින් පත් කරන ලද සර්ව පාක්ෂික සමුළුව

1985 තිම්පු සාකච්ඡා
දිල්ලි ගිවිසුම

1987 ඉන්දු-ලංකා ගිවිසුම
13 වන ව්‍යවස්ථා සංශෝධනය

1989 රණසිංහ ප්‍රේමදාස විසින් පත් කරන ලද සර්ව පාක්ෂික සමුළුව

1991 'මංගල මුණසිංහ තේරීම් කමිටුව'

1995 'කලාප සංගමය' පිළිබඳ පැකේජය

1997 'ව්‍යවස්ථා සංශෝධන සඳහා වන රජයේ යෝජනා'

2000 ව්‍යවස්ථා කෙටුම්පත

2003 අන්තර්වාර ස්වයං-පාලන අධිකාරිය පිළිබඳ යෝජනා

2006 මහින්ද රාජපක්ෂ විසින් පත් කරන ලද සර්ව පාක්ෂික සමුළුව
සර්ව පාක්ෂික නියෝජිත කමිටුව

ප්‍රතිසංස්කරණ සඳහා රජයේ යෝජනාව' මැයෙන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා වූ පාර්ලිමේන්තු තේරීම්කාරක සභාව විසින් සලකා බලන ලද යෝජනා කෙටුම්පතක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි. එජාපය කමුටිවේ කටයුතු සඳහා සහභාගි වුණු නමුත්, එම කමිටුවම ගෙන ආ යෝජනා හෝ කමිටුව මඟින් ගනු ලැබූ කිසිදු තීරණයක් වෙනුවෙන් ඔවුන් පෙනී සිටියේ නැත. කමිටුවේ යෝජනා ඉදිරිපත් කෙරුණු පසු එජාපය ප්‍රකාශ කළේ ඔවුන් ඒ සමඟ එකඟ නොවන බව සහ එයට එරෙහිව ඔවුන්ගේ ප්‍රති-යෝජනා ප්‍රකාශයට පත් කරන බව ය.

## 2000 අගෝස්තු - ව්‍යවස්ථා කෙටුම්පත

2000 වර්ෂයේ අගොස්තු මසදී, ජනාධිපති කුමාරතුංග පවතින ව්‍යවස්ථාව ඉවත් කර නව ව්‍යවස්ථාවක් සම්මත කර ගනු පිණිස නව ව්‍යවස්ථා පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කළා ය. කෙසේ නමුත්, කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සතියකට පෙර එජාපය ඒ සඳහා සහයෝගය දැක්වීමෙන් ඉවත් වූ අතර ඒ හේතුවෙන් ඒ ඉවත් කරගැනීමට සිදු විය. කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තු විවාදය ද කල් දැමුණු අතර, වසර හයක නිල කාලය ඉක්ම යන්නට දින ගණනාවකට පෙර, 2000 වසරේ අගෝස්තු 18 වැනි දින පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද්දෙන් එය ඉබේ අහෝසිව ගියේ ය.

2000 වසරේ ඔක්තෝබරයේදී මහ මැතිවරණය පැවැත්වුණු අතර පොදුජන එක්සත් පෙරමුණ යළි බලය ලබා ගත්තේ ය. කෙසේ නමුත්, ඔවුන්ට පාර්ලිමේන්තුවේ බහුතර බලය දිනාගත නොහැකි විය. 2001 ජූනි මසදී, එජාපය කුමාරතුංගගේ සුළුතර ආණ්ඩුවට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් ගෙන ආ අතර ජූලි මස මුලදී විවාදයට ගැනීමට නියමිතව තිබිණ. එසේ නමුත්, කුමාරතුංග විසින් පාර්ලිමේන්තුව රැස්වීම අත්හිටුවූ අතර නව ව්‍යවස්ථාවක් සකස් කිරීමේ අවශ්‍යතාව පදනම්ව එම වසරේ අගෝස්තු මස ජනමත විචාරණයක් පැවැත්වෙන බව ප්‍රකාශ කළේ ය. ජනමත විචාරණය කිසිදු මොහොතක නොපැවැත්වුණු අතර, පළමුව එය කල් දැමීමද දෙවනුව එය අහෝසි කිරීමද සිදු විය.

පෙර මහ මැතිවරණය පවත්වා වසරක ඇවෑමෙන්, 2001 ඔක්තෝබර් මස 10 වැනිදා පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදි. මහ මැතිවරණය 2001 දෙසැම්බරයේදී පැවැත්විණ. පොදුජන එක්සත් පෙරමුණ, එජාපය, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, ලංකා කම්කරු කොංග්‍රසය, ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ සහ කඳුරට ජනතා පෙරමුණ යන පක්ෂ එකතුවෙන් සැදුම් ගෙන තිබුණු එක්සත් ජාතික පෙරමුණ හමුවේ පරාජයට පත් විය.

## 2002 පෙබරවාරි සිට 2003 නොවැම්බර් දක්වා - සටන් විරාම ගිවිසුම සහ අන්තර්වාර ස්වයං-පාලන අධිකාරිය පිළිබඳ යෝජනා

2002 පෙබරවාරි මස 22 වැනිදා සටන් විරාම ගිවිසුමක් අත්සන් කරන ලද්දේ නෝර්වීජියානු රජයේ මැදිහත්වීමෙන් ඇරඹීමට කටයුතු යොදා තිබුණු සෘජු සාම සාකච්ඡා සඳහා පූර්විකාවක් ලෙස ය. ජාත්‍යන්තර නිරීක්ෂණ සභාවක් ද පිහිටුවනු ලැබූ අතර ජපානය, යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපදය සාම ක්‍රියාවලියේ සම-සභාපතිත්වය දැරූ හ.

ගිවිසුමට අත්සන් තබන ලද්දේ අගමැති රනිල් වික්‍රමසිංහ සහ එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් යන දෙදෙනා ය. ගිවිසුම සඳහා පාර්ලිමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීම අවම වීම පිළිබඳවත්, අත්සන් තැබීමට ප්‍රථම සිය අනුමැතිය ලබා ගැනීමට වික්‍රමසිංහ අපොහොසත් වීම පිළිබඳවත් විවේචනාත්මක දැක්මකින් බැලූ ජනාධිපති කුමාරතුංග සාකච්ඡා ක්‍රියාවලිය සහ සටන් විරාම ගිවිසුමේ අඩංගු කරුණු පිළිබඳ ප්‍රශ්න කළා ය. සිංහල ජාතිකවාදී කණ්ඩායම් ද සටන් විරාම ගිවිසුම සඳහා දැඩි විරෝධයක් පළ කළේ එය එල්ටීටීඊය ඉහළට ඔසවා තබමින් එහි අධිකාරීත්වය සඳහා තත්‍ය පිළිගැ-නීමක් ලබා දෙන බවත්, ඒ හරහා එල්ටීටීඊය විසින් පාලනය කරන රාජ්‍යයක් සඳහා මග හෙළි කරන බවත් සඳහන් කරමිනි.

එල්ටීටීඊය සහ රජය අතර සාම සාකච්ඡා වට කිහිපයක් පැවැත්විණ. මේ අතරතුර, රජය සහ එල්ටීටීඊය අතර සෘජු ගැටුම් නතර කොට තිබුණ ද, දෙපාර්ශවයම මානව හිමිකම් විෂයයෙහිදී සටන් විරාම ගිවිසුම උල්ලංඝණය කළ හ. සාකච්ඡා වට හයකට පසු, 2003 අප්‍රේල් මාසයේදී එල්ටීටීඊය සාම සාකච්ඡාවලින් ඉවත්ව ගිය අතර, වසර අවසන් භාගයේදී සිය අන්තර්වාර ස්වයං-පාලන අධිකාරිය (ISGA) පිළිබඳ යෝජනා ඉදිරිපත් කළේ ය. මෙම යෝජනා මඟින්, ඉදිරි සාකච්ඡා මඟින් ස්ථිර

දේශපාලන විසඳුමක් ලබාගන්නා තුරු, එල්ටීටීඊය සංවිධානයට උතුරු හා නැගෙනහිර දෙපළාතේ පාලනය සම්බන්ධයෙන් වසර පහක කාලයක් සඳහා පුළුල් අධිකාරිමය බලයක් යෝජනා වී තිබිණ. මෙම යෝජනා වෙන්ව යෑම සම්බන්ධ භීතිය උත්සන්න කළ අතර සාම සාකච්ඡා සහ සටන් විරාම ගිවිසුම තව දුරටත් අර්බුදයට ලක් කළේ ය.

අන්තර්වාර- ස්වයං පාලන අධිකාරිය සඳහා වූ යෝජනා ඉදිරිපත් වූයේ 2003 නොවැම්බර් 04 වැනිදා ය. ඉන් දින කිහිපයකට පසු, අගමැති වික්‍රමසිංහ ඇමරිකා එක්සත් ජනපදයේ නිල සංචාරයක යෙදී සිටින අතරතුර, ජනාධිපති කුමාරතුංග හදිසි නීතිය ප්‍රකාශයට පත් කර, එජාපෙ රජය ජාතික ආරක්ෂව අනතුරෙහි හෙළන බව චෝදනා කරමින්, ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළු ප්‍රධාන අමාත්‍යාංශ තුනක් රජයට පවරා ගැනීමට කටයුතු කළා ය.

# II

# සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ ක්‍රියාවලිය: ප්‍රධාන අවස්ථා

## 2004 පෙබරවාරි - එජනිසය බලයට පැමිණීම

විසල් සභාග රජය සහ ආර්ථිකය, එක්සත් ජාතික පෙරමුණේ ආර්ථික ප්‍රතිසංස්කරණ පැකේජය හමුවේ අර්බුදයට ලක් වී සාම ක්‍රියාදාමය බිඳවැටෙද්දී, 2004 ජනවාරි මාසයේදී ශ්‍රීලනිප සහ ජවිපෙ නිවේදනය කළේ එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) ගොඩ නගන ලද බවයි. සන්ධානය පහත සඳහන් පක්ෂවලින් සැදුම් ලද්දකි: ශ්‍රීලනිප, ජවිපෙ, මඑපෙ, ලසසප, ශ්‍රීලකොප, ශ්‍රී ලංකා මහජන පක්ෂය (ශ්‍රීලමප), ජාතික ඒකාබද්ධතා පෙරමුණ (ජාඑපෙ), ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ (ප්‍රඑජාපෙ) සහ දේශ විමුක්ති ජනතා පෙරමුණ (දේවිජපෙ).

2000 වර්ෂයේ පටන් පැවති තෙවැනි මැතිවරණය සනිටුහන් කරමින්, 2004 පෙබරවාරියේ පාර්ලිමේන්තුව විසිරුවා හැරි ජනාධිපතිනි කුමාරතුංග යළි මහ මැතිවරණයක් කැඳවූවා ය. ප්‍රධාන තරඟකරුවන් වූයේ එජනිසය, (එජාපය, ශ්‍රීලමුකො සහ ශ්‍රීලකකො යන පක්ෂවලින් සැදුම්ලත්) එක්සත් ජාතික පෙරමුණ, (දඑවිපෙ, ඊපීආර්එල්එෆ් සහ ටෙලෝ යන පක්ෂවලින් සැදුම්ලත්) දෙමළ ජාතික සන්ධානය සහ ජාතික හෙළ උරුමයයි. 2004 අප්‍රේල් මාසයේදී එජනිසය මැතිවරණය ජයග්‍රහණය කළ අතර ශ්‍රීලනිපයේ මහින්ද රාජපක්ෂ අගමැතිවරයා ලෙස පත් කෙරිණ.

කෙසේ වෙතත්, පශ්චාත්-සුනාමි ක්‍රියාකාරී කළමණාකරන ව්‍යුහයට සිය විරෝධය පළ කරමින් ජවිපෙ ඉවත්වීමත් සමඟ පාලක සභාගය බිඳ වැටිණ. 2004 දෙසැම්බර් මාසයේ සිදුවූ සුනාමි ව්‍යසනයේ ප්‍රතිඵල විමසනු වස් රජය, එල්ටීටීඊ සංවිධානය සමඟ උක්ත ගිවිසුමට එළඹියේ 2005 ජූනි මාසයේ ය. මෙම ගිවිසුමට ජවිපෙ සහ ජාතික හෙළ උරුමය දැඩි ලෙස විරුද්ධ විය. ජවිපෙ ගිවිසුමට විරුද්ධව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ අතර, 2005 ජූලි මාසයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් P-TOMSහි වගන්ති ව්‍යවස්ථානුකූල නොවන බව තීන්දු කරන ලදි.

## 2005 නොවැම්බර් - මහින්ද රාජපක්ෂ ජනපති පදවියට පත්වීම

ජනපතිනිය තමන්ට තවත් වසරක කාලයක් ඇති බව සඳහන් කළත්, 2005 අගෝස්තු මාසයේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේ කුමාරතුංග ජනපතිනියගේ නිල ධූර කාලය එම වසරේ නොවැම්බරයෙන් අවසන් වන බවයි. මෙම අර්බුදය ප්‍රධාන විරුද්ධ පක්ෂය වූ එජාපය සමඟ සිටි ජාතික හෙළ උරුමය විසින් අධිකරණය වෙත ගෙන යන ලද අතර ජනපතිවරණය එම වසරේම පැවැත්විය යුතු බවට ඉල්ලා සිටියේ ය එහි ප්‍රතිඵලයක් ලෙස 2005 නොවැම්බර් මාසයේදී ජනාධිපතිවරණය පැවැත්විණ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සිය අපේක්ෂකයා ලෙස අගමැති මහින්ද රාජපක්ෂ ඉදිරිපත් කළේ ය. සිය මැතිවරණ ප්‍රචාරණ සමය තුළදී, පශ්චාත්-සුනාමි ක්‍රියාකාරී කළමණාකරන ව්‍යුහය (P-TOMS) අහෝසි

කර, රටේ ඒකීයභාවය සුරක්ෂිත කිරීම සඳහා කටයුතු කිරීමට පොරොන්දු වෙමින් රාජපක්ෂ, ජවිපෙ සහ ජාතික හෙළ උරුමය සමඟ ගිවිසුම් අත්සන් කළේ ය.[3] කෙසේ වෙතත්, මෙම ද්විපාර්ශවය සමඟ රාජපක්ෂගේ ගිවිසුම් කුමාරතුංග ඇතුළු පක්ෂයේ ඇතැම් ජ්‍යෙෂ්ඨයින් සමඟ ගැටුමකට මග පෑදුවේ, රාජපක්ෂගේ මෙම දැඩි සිංහල ජාතිකවාදී ස්ථාවරය, වඩා මැදහත්, බලය විමධ්‍යගත කිරීම වෙනුවෙන් වන ස්ථාවරයක සිටින ශ්‍රීලනිපයට එරෙහිව යමින් පක්ෂයේ ප්‍රතිපත්ති බිඳ දමන බවටත්, පක්ෂය නොවිමසමින් කටයුතු කිරීමෙන් පක්ෂයේ විනය කඩවන බවටත් ඔවුන් තර්ක කළ හෙයිනි.[4] විරුද්ධ පක්ෂයේ වූ එජාපය සිය අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කළේ හිටපු අගමැතිවරයා වූ රනිල් වික්‍රමසිංහ ය.

එල්ටීටීඊය, සිය පාලනය යටතේ ඇති උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ජනයාට ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලෙස බලපෑම් කළේ ය. සුළු ඡන්ද ප්‍රමාණයක වාසියකින් රාජපක්ෂ ජය ලැබූ අතර 2005 නොවැම්බර් 19 වැනි දින ජනපතිවරයා ලෙස දිවුරුම් දුන්නේ ය.

සියලුම දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා ආරම්භ කරමින්, ඒකීය රාජ්‍යයක් තුළ හිඳිමින් අර්බුදය සඳහා දේශපාලන විසඳුමක් පදනම් කරගත් ජාතික සම්මුතියක් ඉලක්ක කිරීමටත්, එල්ටීටීඊය සමඟ සාකච්ඡා යළි ආරම්භ කිරීමටත් සිය ප්‍රතිපත්ති ප්‍රකාශනය වූ මහින්ද චින්තනය තුළදී රාජපක්ෂ ප්‍රතිඥා දී තිබිණි. ඔහු නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා වගකීමට බැඳෙන සභාවක් පිහිටුවීමට ද ප්‍රතිඥා දී තිබිණි. ජාතික සම්මුතියක් අපේක්ෂා කරන ඉහත උපදේශක ක්‍රියාවලිය සහ නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත යන දෙකම ජනමත විචාරණයකට යටත් කොට එයින් අනුමත වූයේ නම් ක්‍රියාත්මක කරන්නට නියමිත විය.

## 2006 පෙබරවාරි - ජිනීවා සාකච්ඡා

සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මකව පැවතිය ද, 2005 වසර අග භාගයේ සහ 2006 වසර මුල් සමයේ ආරක්ෂක හමුදා නිලධාරීන්, එල්ටීටීඊ ඉලක්ක සහ සිවිල් පුරවැසියන් වෙත එල්ල වුණු ප්‍රචණ්ඩත්වයන් ඉහළ නැගිණ. මේ අතරට 2005 වසරේ දෙසැම්බර් මාසයේදී දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් පරරාජසිංහම් ඝාතනය කිරීම සහ 2006 වසරේ ජනවාරි මස ත්‍රිකුණාමලයේදී දෙමළ ජාතික ශිෂ්‍යයින් පස් දෙනෙකු ඝාතනය කිරීම ද ඇතුළත් විය.



Courtesy of www.peaceinsrilanka.lk

වසර තුනකට පසු මුල්වරට, රජය සහ එල්ටීටීඊ සංවිධානය නව සාකච්ඡා වටයකට එක් වීමට එකඟතා පළ කළ හ. 2006 ජනවාරි මස ජිනීවාහිදී සාකච්ඡා පැවත්වුණු අතර, දෙපාර්ශ්වයම බලගැන්වීමට එකඟතාව පළ කළ සටන් විරාම ගිවිසුම ක්‍රියාවට නැංවීම මෙහි ප්‍රමුඛ කරුණ ලෙස විය.

2006 අප්‍රේල් මාසයේදී ජිනීවාහි පැවැත්වීමට සැලසුම් කෙරුණු දෙවන වටයේ සාකච්ඡා සඳහා සහභාගී වීම එල්ටීටීඊ සංවිධානය විසින් ප්‍රතික්ෂේප කිරීමත් සමඟ සාකච්ඡා බිඳ වැටිණ. මුලින් සහභාගි වීමට එකඟතාව පළ කරමින් 2006 ජූනි මස ඔස්ලෝ නුවරදී පැවැත්වීමට යෙදී තිබුණු සාකච්ඡා වාරයද එල්ටීටීඊ

3. ශගනි වීරකෝන්, 'Mahinda agrees to cancel P_TOMS deal', *Dailymirror.lk*, 6 September 2005, at http://archives.dailymirror.lk/2005/09/06/front/01.asp (අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2016 මාර්තු 20); 'No self-governance, no P-TOMS, no homeland', *Dailymirror.lk*, 14 September 2005, at http://archives.dailymirror.lk/2005/09/14/front/2.asp (අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2016 මාර්තු 20).

4. 'Continuing saga of the internal battle in the SLFP over policy,' *Thesundayleader.lk*, 18 September 2005, at http://www.thesundayleader.lk/archive/20050918/politics.htm (අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2016 මාර්තු 20).

සංවිධානය විසින් මගහරින ලදි.[5] මේ අතරවාරය තුළ ගෙවුණු මාස කිහිපයක කාල සීමාව, 60 දෙනෙකුට පමණ මරු කැඳවමින් කැබිතිගොල්ලෑවේ දී සිවිල් පුරවැසියන් රැගෙන ගිය බසයකට එල්ල වූ මරාගෙන මැරෙන ප්‍රහාරය ඇතුළු ප්‍රචණ්ඩ ක්‍රියා රැසකින් පිරී පැවතිණ.

## 2006 ජූනි - සර්ව පාක්ෂික සමුළුව ඇරඹීම

2006 වර්ෂයේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් ජාතික ගැටළුවට දේශපාලනික විසඳුමක් ලබා ගනු පිණිස සර්ව පාක්ෂික සමුළුවක් කැඳවන ලදි. මුල් අදියරවලදී පක්ෂ පහළවක් ඒ සඳහා සහභාගි විය. දෙමළ ජාතික සන්ධානයට සමුළුවට සහභාගී වීම සඳහා ඇරයුම් නොකෙරිණ.[6] මෙම සමුළුව, නොබෙදුණු ශ්‍රී ලංකාවක් තුළ බලය බෙදීම සඳහා යෝජනාවලි සැකැස්මක් සකස් කිරීම හා එල්ටීටීඊ සංවිධානය සමඟ අනාගත සාකච්ඡා සඳහා පදනමක් සකස් කර ගැනීම පිණිස සර්ව පාක්ෂික කමිටුවක් පත් කර ගැනීම සම්බන්ධ යෝජනාවකට එකඟතාව පළ කළේ ය.[7] මෙම කමිටුව සඳහා ඒ ඒ පක්ෂ විසින් පත් කරන සාමාජිකයින්ගේ නම් පළමුව ලබා දිය යුතු විය.

මේ අතරතුර, මරා දැමීම් සහ හමුදා ප්‍රහාර දිගටම ක්‍රියාත්මක වෙමින් පැවතිණ. 2006 ජූලි මාසයේදී එල්ටීටීඊය විසින් ත්‍රිකුණාමලයේ මාවිල් ආරු සොරොව්වේ දොරටු වසා දමන ලද අතර එමඟින් සෘජුවම ප්‍රදේශවාසීන වෙත ජල සැපයුම අඩාල කෙරිණි. ඉන් පසුව රජය, යුද්ධයේ අවසන් අදියරෙහි ආරම්භය සනිටුහන් කරමින්, සොරොව්ව සහ අවට ප්‍රදේශය යළි අත්පත් කරගැනීම සඳහා පූර්ණ හමුදා ප්‍රහාරයක් දියත් කළේ ය.

## 2006 ජූලි - සර්ව පාක්ෂික නියෝජිත කමිටුව (APRC) පිහිටුවීම

ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා කෙටුම්පතක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාව පෙරදැරිව ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් 2006 ජූලි මස 11 වැනිදා සර්ව පාක්ෂික නියෝජිත කමිටුවක් පත් කරන ලදි. 'ජාතික ගැටළුව විසඳීම සඳහා පුළුල් ප්‍රවේශයකට ඉඩ සලසමින්' සහ 'පුරවැසියන්ට ස්වකීය ඉරණම් වෙත පිවිසීමට ඉඩ සලසමින්' ජනපතිවරයා 'ගෙදර-හැදූ ව්‍යවස්ථාවක්' සම්පාදනය කිරීමට APRC වෙත වරම් ලබා දුන්නේ ය.[8] එහි ප්‍රථම රැස්වීම් වාරයේදීම, සහාග රජයේ ඇමතිවරයකු හා ලසසපයේ මහ ලේකම්වරයා වූ තිස්ස විතාරණ APRCහි සභාපතිවරයා වශයෙන් පත් කරගන්නා ලදි.

සර්ව පාක්ෂික සමුළුව සඳහා සහභාගි වීමට තීරණය කළ, ප්‍රධාන විපක්ෂය වූ, එජාපය පුළුල් ව්‍යවස්ථාමය රාමුවක් ගොඩනැගීම ඉලක්ක කරගත් APRC වර්ජනය කිරීමට කටයුතු කළේ ය. එජාපයේ ප්‍රකාශක තිස්ස අත්තනායකට අනුව, ඔවුන් APRC වර්ජනය කරන්නට හේතු වන්නේ රජය අවංක ලෙසම එජාපයේ සහාය බලාපොරොත්තු නොවන බව පක්ෂය හැගීයාම සහ, දේශපාලන මධ්‍යස්ථභාවය බිඳ හෙළමින්, ජවිපෙ සහ ජාතික හෙළ උරුමය APRC වෙත අසමානුපාතික බලපෑමක් එල්ල කරමින් සිටින බව පෙනීයාමත් ය.[9]

ජාතික හෙළ උරුමය ද APRC සඳහා සහභාගි වීමට තීරණය කරන්නේ, මහින්ද චින්තනය තුළ සඳහන් වූ කරුණු ඉක්මවා යමින් ගැටුම සඳහා දේශපාලන විසඳුමක් ලබා දීමට කටයුතු කිරීමට පක්ෂය විරුද්ධව සිටින බව සඳහන් කරමිනි. ජාතික හෙළ උරුමයේ මහ ලේකම් පූජ්‍ය ආචාර්ය ඕමල්පේ සෝභිත හිමියන්ට

5. '2002 to 2008: Ceasefire Agreement', Peaceinsrilanka.lk, at http://www.peaceinsrilanka.lk/negotiations/cease-fire-agreement-20028 (අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2014 දෙසැම්බර් 19).
6. රංග ජයසූරිය, 'Will APRC suffer same fate as its predecessors?', *Sundayobserver.lk*, 16 July 2006, at www.sundayobserver.lk/2006/07/16/fea01.asp (අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2015 ජනවාරි 22).
7. 'All Party Committee to prepare framework of political solution', *President.gov.lk* (Government of Sri Lanka), 2 June 2006, at http://www.president.gov.lk/sinhala/html/news/200606/archivejune.htm (අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2014 පෙබරවාරි 10).
8. එම.
9. රංග ජයසූරියල 'Will APRC suffer same fate as its predecessors?', *Sundayobserver.lk*, 16 July 2006, at www.sundayobserver.lk/2006/07/16/fea01.asp [අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2015 ජනවාරි 22].

අනුව එම මොහොතේ දේශපාලනික විසඳුමක් ලබා දීම වක්‍රාකාරයෙන් එල්ටීටීඊයට වාසිදායක වූවකි.[10]

මේ අතරතුර, උතුරු සහ නැගෙනහිර පළාත්වල යුධමය ගැටුම් උත්සන්න වන බව දක්නට ලැබිණ. ආරක්ෂක හමුදාවන් වෙත එල්ටීටීඊය එල්ල කළ ප්‍රහාරයකට ප්‍රතිචාරයක් වශයෙන්, 2006 අගොස්තු මාසයේදී, යාපන අර්ධද්වීපය සමඟ දිවයිනේ සෙසු පළාත් සම්බන්ධ කළ එකම ගොඩබිම් මාර්ගය වූ ඒ9 මාර්ගය රජය විසින් වසා දමනු ලැබීය. නැගෙනහිර පළාතේ සාම්පූර් ඇතුළු එල්ටීටීඊය පාලනයේ පැවති ප්‍රදේශ කිහිපයකම පාලනය තමන් වෙත නතු කරගන්නට රජය සමත් විය. ගැටුම් දිගටම ක්‍රියාත්මකව පැවතිය ද පාර්ශව දෙකම කටයුතු කළේ තමන් සටන් විරාම ගිවිසුම කඩ නොකරන බව දක්වමිනි.

## 2006 ඔක්තෝබර් - එජාපය, ශ්‍රීලනිපය සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් තැබීම

බලය බෙදා හැරීම සඳහා සිදු කරන ඕනෑම උත්සාහයක් සඳහා ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක අතර සම්මුතියක් ඇතිකර ගැනීම අනිවාර්ය සාධකයක් විය. 2006 පමණ වන විට, එජාපයද නායකත්වය සම්බන්ධ අභ්‍යන්තර අර්බුදයකට මැදිව සිටියේ ය. විරුද්ධ මතධාරී එජාප සාමාජිකයින් ප්‍රකාශ කළේ 2005 පැවති ජනාධිපතිවරණය පරාජය වූ රනිල් වික්‍රමසිංහ, 1994 පටන් දරා සිටින එජාප නායකත්වයෙන් ඉවත් විය යුතු බව ය. පක්ෂය අතහැර යන එජාපයේ ඉහළ පෙළ මන්ත්‍රීවරුන් රජයේ පාර්ශවයට එක් කර ගැනීම හමුවේ, රජය දිගින් දිගටම එම ක්‍රියාවලිය සිදු කරන්නේ නම්, සර්ව පාක්ෂික සමුළුව සඳහා සහාය දීමෙන් ඉවත් වීමට එජාපය සළකා බලන්නට විය.[11]

2006 ඔක්තෝබර් මස 23 වැනිදා, වසර දෙකක කාලයක් සඳහා, ඉහළ ප්‍රමුඛතාව ලබාදිය යුතු කරුණු 4ක් මුල් කර ගනිමින්, එජාපය ශ්‍රීලනිපය සමඟ අවබෝධතා ගිවිසුමකට එක් විය. මෙහි වූ කරුණු අතර උතුරු -නැගෙනහිර අර්බුදය, ඡන්ද ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීම, යහපාලනය, ආර්ථික සංවර්ධනය, ජාතිය ගොඩනැංවීම සහ සමාජ සංවර්ධනය ඇතුළත් විය.[12]

අවබෝධතා ගිවිසුමෙහි හයවන වගන්තිය ප්‍රකාරව එජාප නායකයාට APRC සඳහා සිය පක්ෂ සාමාජිකයින් දෙදෙනෙකු නම් කළ හැකි විය. එජාපය (එවකට එජාපයේ සාමාජිකත්වය දැරූ) ජී.එල්.පීරිස් සහ කේ.එන්.චොක්සි සිය සාමාජිකයින් ලෙස නම් කළේ ය.[13] ජවිපෙ මේ පත්කිරීම් සම්බන්ධයෙන් සිය විරෝධය ප්‍රකාශ කළේ APRC සඳහා සෑම දේශපාලන පක්ෂයකින්ම එක් සාමාජිකයෙකු පමණක් පත් කළ යුතු ය යන මූලික පදනම මත හිඳිමිනි. ගැටළුව විසඳීම පිණිස ඡන්දයක් විමසීමේ ආමාත්‍ය විතාරණගේ යෝජනාවද ඔවුන් ප්‍රතික්ෂේප කළේ ය.[14] පක්ෂයකින් එක් සාමාජිකයකු පමණක්ය යන ජවිපෙ මතු කළ තර්කයට ජාතික හෙළ උරුමයද සහාය පළ කළේ ය.

මෙම අවබෝධතා ගිවිසුම යුධමය වශයෙන් එල්ටීටීඊය පරාජය කිරීම සඳහා වන ප්‍රයත්නයට බාධාවක් ලෙස දක්වමින්, ජවිපෙ දිගින් දිගටම සටන් විරාම ගිවිසුම අහෝසි කරන ලෙස ඉල්ලා සිටියේ ය.[15] ඊට අමතරව ඔවුන්, 1987 ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීමෙන්

10. දසුන් අමරසිංහ, 'UNP to boycott APC advisory Comm. Meeting', *Island.lk*, 11 July 2006 at http://www.island.lk/2006/07/11/news2.html [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2015 ජනවාරි 22].
11. සන්තුෂ් ප්‍රනාන්දු, 'Hit by crossovers, UNP opens doors to Kumaratunga loyalists,' *Sundaytimes.lk*, 29 January 2006, at www.sundaytimes.lk/060129/news/4.html [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2015 ජනවාරි 22].
12. 'Memorandum of Understanding between the Sri Lanka Freedom Party and the United National Party to Cooperate on Key Issues Vital for the Nation's Well Being', *Priu.gov.lk* (Government of Sri Lanka), 23 October 2006, at www.priu.gov.lk/news_update/Current_Affairs/ca200610/20061023memorandum_slfp_unp.htm [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2015 ජනවාරි 22].
13. මංජුල ප්‍රනාන්දු 'UNP to nominate GL and Choksy to represent APRC', *Dailynews.lk*, 2 November 2006, at http://archives.dailynews.lk/2006/11/02/pol02.asp [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2013 දෙසැම්බර් 15].
14. එස්. ෆර්ඩිනැන්ඩු, 'JVP opposed MOU provision for 2 UNPers in the APRC', *Island.lk*, 12 November 2006, at http://www.island.lk/2006/11/12/news4.html [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2014 පෙබරවාරි 14].
15. කේ. රත්නායක, 'Sri Lankan peace talks collapse amid intensifying civil war', *Wsws.org*, 31 October 2006, at http://www.wsws.org/en/articles/2006/10/sri-o31.html [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2014 දෙසැම්බර් 15].

පසු ජනාධිපති ආඥාවකින් උතුරු-නැගෙනහිර දෙපළාත් ඒකාබද්ධ කරමින් තනි පළාතක් පිහිටුවීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළේ ය. අධිකරණය තීන්දු කළේ එම ඒකාබද්ධ කිරීම ව්‍යවස්ථානුකූල නොවන බව සහ බලරහිත වූවක් බව ය. දළ වශයෙන් දමිළ ජනයාගේ නිජභූමිය ලෙස හැඳින්වූ බිමට දළ වශයෙන් සමපාත වූ, ගැටළුවට බඳුන් වූ කලාපය යළි පළාත් දෙකක්ට බෙදා වෙන් කරනු ලැබිණ.

2006 ඔක්තෝබර් 28-29 දෙදින තුළ, නෝර්විජියානු රජයේ මැදිහත්වීමෙන් රජය සහ එල්ටීටීඊය අතර තවත් සාම සාකච්ඡා වටයක් ජිනීවාහිදී පැවැත්විණ. කෙසේ වුවත්, ඒ9 ප්‍රධාන මාර්ගය යළි විවෘත කරන ලෙස එල්ටීටීඊ සංවිධානය කළ ඉල්ලීම ඇතුළු ප්‍රධාන ගැටළු කිසිවක් සඳහා එකඟතා ඇති කර ගැනීමට දෙපාර්ශවයම අපොහොසත් විය. සිදුවූයේ රජය සහ එල්ටීටීඊය සටන් විරාම ගිවිසුම සඳහා සිය පාර්ශවවල මැදිහත් වීම ගැන පුනරුච්චාරණය කිරීමකි. දෙවැනි වටයක සාකච්ඡා සඳහා එකඟතාවක් ඇති වූයේ නැත.

## 2006 දෙසැම්බර් - විශේෂඥ කමිටුවේ වාර්තා[16]

APRCහි ක්‍රියාවලිය සඳහා උපදෙස් දීමට සහ මග පෙන්වීමට බහු-ජනවාර්ගික කණ්ඩායම් නියෝජනය කරන සාමාජිකයින් දාහත් දෙනෙකුගෙන් යුක්ත විශේෂඥ කමිටුවක් ජනපතිවරයා විසින් පත් කරන ලදි.

මෙම කමිටුව බලය බෙදීම සහ ව්‍යවස්ථා ප්‍රතිසංශෝධන සඳහා සිය නිර්දේශ ඉදිරිපත් කළ යුතු විය. කෙසේ වුවත්, විශේෂඥ කමිටුවේ සාමාජිකත්වයට ද තනි සම්මුතියකට එළඹීමට නොහැකි වූ හෙයින් වෙන් වශයෙන් වාර්තා හතරක් ඉදිරිපත් කළ හ. ඒවා නම්:

- බහුතරයේ වාර්තාව (සාමාජිකයින් දාහතෙන් එකොළොස් දෙනෙකු විසින් අත්සන් කරන ලද)
- සුළුතරයේ වාර්තාව (සාමාජිකයින් දාහතෙන් සිවු දෙනෙකු විසින් අත්සන් කරන ලද)
- ඉතිරි සාමාජිකයින් දෙදෙනා ඉදිරිපත් කළ විසම්මුතික වාර්තා ද්විත්වය.

බහුතරයේ වාර්තාව සහ සෙසු වාර්තා අතර පැවති ප්‍රධානතම වෙනස්කම වූයේ බහුතරයේ වාර්තාව වැඩිම බලය බෙදා හැරීමේ තත්වයන් යෝජනා කිරීමට සූදානම් වූ අතර අනෙත් වාර්තා එසේ නොවීමයි.

එජාප නායක රනිල් වික්‍රමසිංහ මුල් අවස්ථාවලදී බහුතරයේ වාර්තාවට සිය එකඟතාව පළ කළ අතර පසුව නිවේදනය කළේ එය ශ්‍රීලනිපය සමඟ සිදු කළ සාකච්ඡා පදනම්ව දකුණේ සම්මුතියක් බවට පත් විය හැකි බවයි.[17]

එම වකවානුවේ පාර්ලිමේන්තුව නියෝජනය කළ තෙවැනි විශාලතම දේශපාලන පක්ෂය වූ ජවිපෙ APRC ක්‍රියාවලිය සමඟ තව දුරටත් කටයුතු කිරීම ප්‍රතික්ෂේප කළේ එය ෆෙඩරල් සංකල්පය පදනම් කරගත් දේශපාලන පැකේජයක් සැකසීම සඳහා උනන්දුවක් නොදක්වන්නේ ය යන පදනමෙනි. විශේෂඥ කමිටුවේ පුළුල් බලය බෙදීමේ යෝජනා පිළිබඳව ජවිපෙ එම කමිටුවට චෝදනා එල්ල කළේ ඔවුන් එල්ටීටීඊ සංවිධානය උතුරු සහ නැගෙනහිර පළාත් පදනම්ව වෙනම රාජ්‍යයක් සඳහා කරන ඉල්ලීමට සහාය දක්වන පදනමක වන බව දක්වමිනි.[18]

රාජපක්ෂ රජය විශේෂඥ කමිටු වාර්තාව තමන්

16. ඩී.බී.එස්. ජෙයරාජ්, 'Remembering the APRC expert panel 'majority' report', *dbsjeyaraj.com*, 19 December 2011, at http://dbsjeyaraj.com/dbsj/archives/3311 [අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2013 දෙසැම්බර් 11].
17. 'Petty games of President and Mangala's battle for survival', *Thesundayleader.lk*, 17 December 2006, at http://www.thesundayleader.lk/archive/20061217/politics.htm [අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2016 මාර්තු 20].
18. දසුන් අමරසිංහ, 'JHU believes JVP will return to APRC', *Island.lk*, 23 December 2006, at http://www.island.lk/2006/12/23/index.htm [අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2016 මාර්තු 20].

වෙතින් දුරස් කර තබා ජවිපෙ සහ සර්ව පාක්ෂික සමුළුවේ සිත් යළි දිනාගැනීමට උත්සාහ කළේ ය.[19]

## 2007 ජනවාරි -'අනාගත ව්‍යවස්ථාවක් සඳහා පදනමක් සැකසීම පිණිස ප්‍රධාන යෝජනා' සහ ශ්‍රීලනිපය සහ එජාපය අතර වූ අවබෝධතා ගිවිසුම අහෝසි කිරීම

2007 ජනවාරි මාසයේදී තිස්ස විතාරණ විසින්, විතාරණ යෝජනා මැයෙන් ප්‍රසිද්ධියට පත්, 'ශ්‍රී ලංකාවේ අනාගත ව්‍යවස්ථාවක් සඳහා පදනම තැනීමේ ප්‍රධාන යෝජනා' නමැති APRCහි වාර්තාව ඉදිරිපත් කළේ ය. බහුතරයේ සහ සුළුතරයේ වාර්තා ද්විත්වයම සංස්ලේෂණය කරගනිමින් මෙම යෝජනාවන් ගොඩනගා ඇති බව ඔහු සඳහන් කළ ද ඔවුන් පෙරට ගෙන තිබුණේ බහුතරයේ වාර්තාවයි. වාර්තාව යෝජනා කොට තිබුණේ, බෙදී යාමට එරෙහි, ද්විමණ්ඩල ව්‍යවස්ථාදායකයකින් සමන්විත, පාර්ලිමේන්තු ස්වරූපයේ රජයක් කේන්ද්‍ර කොටගත් 'ඒකීය, නිදහස්, ස්වෛරී සහ නිදහස් රාජ්‍යයකි.'

මේ අතරතුර, එජාපයේ නියෝජ්‍ය නායක කරු ජයසූරියගේ මූලිකත්වයෙන් යුතු එජාප මන්ත්‍රී කණ්ඩායමක් රජයේ අමාත්‍ය ධූර ලබා ගැනීම සඳහා ප්‍රතිවිරුද්ධ පාර්ශවය වෙත යන්නේ රජය සමඟ සහයෝගීතාවකින් තොරව එජාපය සහ ශ්‍රීලනිපය අතර වන අවබෝධතා ගිවිසුම ඵලදායී නොවන බව සඳහන් කරමිනි.[20] ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරු කුඩා සංඛ්‍යාවක් ද ඊට එක් විය.[21] මේ හා සමඟ පාර්ලිමේන්තුවේ බහුතරය රජයට හිමි විය.

එජාපයෙන් විසම්මුතික මන්ත්‍රීවරුන්ගෙන්ද සමන්විත නව කැබිනට් මණ්ඩලයක් රාජපක්ෂ ජනපතිවරයා විසින් පත්කරනු ලැබී ය. මෙම පුවත නිල වශයෙන් නිකුත් වීමත් සමඟ එජාප සභාපති රුක්මන් සේනානායක ජනපති රාජපක්ෂ හමු වී දන්වා සිටින්නේ විසම්මුතික එජාප මන්ත්‍රීවරුන් රජයේ පාර්ශවය විසින් පිළිගනු ලැබීමත් සමඟ අවබෝධතා ගිවිසුම අහෝසිව යන බවයි.[22]

එජාප නායක රනිල් වික්‍රමසිංහ සිය පාක්ෂිකයන් හමුවේ ප්‍රකාශ කර සිටියේ ජනාධිපති රාජපක්ෂ විසින් අවබෝධතා ගිවිසුමේ අටවැනි වගන්තිය උල්ලංඝණය කර ඇති බවත්, ගිවිසුම නැවත බලගැන්වීමට ඇති එකම මග ජනපති රාජපක්ෂ විසින් ඔහු 'අත්වැරදීමක්' ලෙස සඳහන් කර ඇති එජාප විසම්මුතික මන්ත්‍රීවරුන් පිළිගෙන ඔවුන්ට අමාත්‍ය ධූර පිරිනැමීම යළි නිවැරදි කිරීම පමණක් බවත් ය.[23]

## 2007 මාර්තු - සර්ව පාක්ෂික නියෝජිත කමිටුව සඳහා ප්‍රතිවිරෝධයන්

APRC සඳහා යළි එක්වීමට කෙරුණු යෝජනාවට සිය පක්ෂය වෙනුවෙන් විරෝධතාව පළ කළ එජාප මන්ත්‍රී රවි කරුණානායක සඳහන් කළේ ඔවුන් ඉන් ඉවත්ව ගියේ රජය ඒකපාර්ශවීයව එජාප-ශ්‍රීලනිප අවබෝධතා ගිවිසුම උල්ලංඝණය කළ හේතුවෙන් බව ය.[24] ඔහු තව දුරටත්, රජයට අවංක ලෙස එජාපයේ සහයෝගය අවශ්‍යව නොමැති බවත්, අවශ්‍යව ඇත්තේ එහි එක් මන්ත්‍රී කණ්ඩායමක සහයෝගය පමණක් බවත් සඳහන් කළ අතර එසේ වුවත් පිළිගත හැකි සාකච්ඡාමය විසඳුමක් රජය විසින් ගෙන එන්නේ නම් ඒ සඳහා පාර්ලිමේන්තුව

19. 'Mahinda talks with JVP, Re-entry to APC on the cards', *Nation.lk*, 17 December 2006, at http://www.nation.lk/2006/12/17/news2.htm [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
20. 'UNP dissidents 'joining on Sunday', *Bbc.co.uk/Sinhala* (BBC Sinhala), 26 January 2007, at http://www.bbc.co.uk/sinhala/news/story/2007/01/070126_wijesekara_dissidents.shtml[අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
21. 'Crossover today, MoU ends', *Sundaytimes.lk*, 28 January 2007, at http://www.sundaytimes.lk/070128/News/101news.html [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
22. 'US tried to save MoU, but failed', *Sundaytimes.lk*, 4 February 2007, at http://www.sundaytimes.lk/070204/News/101news.html [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
23. එම.
24. 'The Govt. scored in words and lost in Dollars', *Island.lk*, 1 March 2007, at http://www.island.lk/2007/03/01/features4.html [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].

තුළ සහාය දැක්වීමට සූදානම් බවද ප්‍රකාශ කළේ ය.

මේ අතරතුර, ආරක්ෂක හමුදා නැගෙනහිර ප්‍රදේශය තුළ දිගින් දිගටම බලය තහවුරු කරගනිමින් තිබිණ. ආරක්ෂක හමුදා එල්ටීටීඊ බලය බිඳ දමන අතරතුර, පොලීසිය, කොළඹ හා තදාසන්න ප්‍රදේශවල වාසය කළ උතුරු-නැගෙනහිර ප්‍රදේශවලින් පැමිණ සිට දමිළ ජනතාව බස් රථවලින් යළි පිටත් කර හැරියේ ඔවුන් ආරක්ෂාවට තර්ජනයක්ව ඇත යන්න පදනම් කරගනිමිනි. දේශීය සිවිල් සමාජ සංවිධානයක් විසින් ගොනු කරන ලද පෙත්සමක් සලකා බැලූ ශ්‍රේෂ්ඨාධිකරණය මෙම ක්‍රියාවලිය නතර කරන ලෙස නියෝග කළේ ය.[25] 2007 ජූලි මාසයේදී, නැගෙනහිර පළාතේ අවසන් එල්ටීටීඊ බලකඳවුර වූ තොප්පිගල සිය ග්‍රහණයට නතු කරගනිමින් වසර 13කට පසු සමස්ථ කලාපය සියතට ගැනීමට රජය සමත් විය.

## 2007 අගෝස්තු - නව ව්‍යවස්ථාව සඳහා යෝජනා[26] සහ එජාපයේ ඉවත් වීම

2007 වර්ෂයේ අගෝස්තු 13 වැනිදා, APRC පත් කොට වසරකට පමණ පසු, එහි සභාපති තිස්ස විතාරණ විසින් පක්ෂ දහතුනක එකඟතාවයෙන් සකසන ලද නව ව්‍යවස්ථාවක් සඳහා වූ යෝජනා කෙටුම්පත ජනපතිවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළේ ය.

එජාපය විසින් කමිටුවේ බලය බෙදීම සඳහා වන අවසන් යෝජනා ඉදිරිපත් කිරීම සඳහා අවසන් දිනය ලෙස 2007 අගෝස්තු 15 වැනි දිනය සඳහන් කළ අතර APRC ඒ ඉදිරිපත් කරන්නේ නම් පමණක් යළි ඒ හා එක්වන බව සඳහන් කළේ ය. කෙසේ නමුත් APRC ඔවුන්ගේ යෝජනා එම කාලය තුළ ඉදිරිපත් කළේ නැත. එබැවින්, ජනවාර්ගික ගැටළුව සඳහා පැහැදිලි පිළිතුරක් සැපයීමට රජයට උවමනාවක් නොමැත යන පදනමෙහි හිඳිමින් එජාපය APRCයෙන් ඉවත්ව ගියේ ය.[27]

මේ අතරතුර, රාජපක්ෂ ජනපතිවරයාගේ පාලනය හා එක්ව කටයුතු කළ ශ්‍රීලනිපය හා මහජන එක්සත් පෙරමුණ යන දෙපක්ෂයම ඉල්ලා සිටියේ කමිටුවේ එජනිස නියෝජිතයින් රාජපක්ෂ ජනපතිවරයා මුණගැසෙන තුරු APRCහි ක්‍රියාකාරීත්වය අත්හිටුවා තැබිය යුතු බවයි. ජවිපෙ සහ ජාතික හෙළ උරුමය APRC විසින් යෝජනා කරන ලද බලය බෙදා හැරීමේ තත්වයන් පිළිබඳ විවෘතව විවේචනය කිරීම මඟින්ද, වඩා මැදහත් වාමාංශික සන්ධාන වඩා සාධනීය ආස්ථානයකින් කටයුතු කිරීම මඟින් ද පැහැදිලි වූයේ බලය බෙදා හැරීම සම්බන්ධයෙන් සම්මුතියකට පැමිණීමට ඔවුන්ට නොහැකිව තිබුණු බවයි.[28]

## 2008 ජනවාරි - සර්ව පාක්ෂික නියෝජිත කමිටුවෙන් ජනාධිපති වෙත අන්තර්වාර යෝජනා[29]

2008 ජනවාරි 16 වැනිදා සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වන බව රජය නිල වශයෙන් ප්‍රකාශ කළේ ය. නෝර්වීජියානු සහ ශ්‍රී ලංකා රජයන් ගිවිසුම්ගතව පිහිටුවා තිබුණු සටන් විරාම නිරීක්ෂණ මධ්‍යස්ථානය ද නවතා දමන ලදි.

සටන් විරාම ගිවිසුම අහෝසි කොට දින කිහිපයකට පසු, 'දේශපාලන යෝජනාවලියක්ඃ ඉදිරි මග' නමින් පිටු හතරක ලේඛණයක් APRCහි සාමාජිකයින්

25. 'Sri Lanka: Supreme Court stops eviction of Tamils from capital', *ReliefWeb.int*, 8 June 2007, at http://reliefweb.int/report/sri-lanka/sri-lanka-supreme-court-stops-eviction-tamils-capital [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
26. සකී ජබාර්, 'SLMC, UNP MP to reveal APRC Final Report', *Island.lk*, 19 July 2010, at http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=2479 [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
27. 'UNP withdraws from APRC,' *Dailymirror.lk*, 6 September 2007, at http://archives.dailymirror.lk/2007/09/07/news/02.asp [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
28. ජේ.එස්. තිස්සනායගම්, 'APRC demonstrates the south's inability to meet Tamil aspirations', *Sundaytimes.lk*, 26 August 2007, at http://www.sundaytimes.lk/070826/Columns/telescope.html [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
29. 'APRC Proposals to President,' *Priu.gov.lk* (Government of Sri Lanka), 24 January 2008, at http://www.priu.gov.lk/news_update/Current_Affairs/ca200801/20080124aprc_proposals.htm [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].

වෙත ඉදිරිපත් කළේ ය. මෙම යෝජනාව පදනම්ව තිබුණේ ජනවාර්ගික ගැටළුවට විසඳුමක් ලබාදීමේ අරමුණින් ඉදිරිපත් කෙරුණු දහතුන්වන සංශෝධනයයි. ජනාධිපතිවරයා අවධාරණය කළේ එය APRC වාර්තාව සඳහා පදනම සැදිය යුතු බව ය.[30] ජනාධිපතිවරයා APRC වෙතින් අන්තර්වාර යෝජනාවක්ද ඉල්ලා සිටි අතර කමිටුව එය ඉක්මණින් සකස් කොට ඉදිරිපත් කළේ ය.[31]

'APRCහි යෝජනා සඳහා ආරම්භයක් ලෙස පවතින ව්‍යවස්ථාවේ අදාල විධිවිධාන පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් ගත යුතු ක්‍රියාමාර්ග' යන මැයෙන් පිටු හතරක වාර්තාවක් APRC විසින් ඉදිරිපත් කරන ලදි. මෙම අන්තර්වාර වාර්තාව මහත් ප්‍රසිද්ධියක් සහිතව ප්‍රකාශයට පත් විය.

පළාත් සඳහා කෙටිකාලීනව ඉහළම සහ ඵලදායකම බලය බෙදාහැරීම ළගා කරගනු වස් පවතින ව්‍යවස්ථාවේ අදාල විධිවිධාන පූර්ණ වශයෙන් ක්‍රියාවට නැංවීම මෙම යෝජනාවලින් නිර්දේශ කෙරිණ.[32] මෙම නිර්දේශ අතරට, ව්‍යවස්ථාව සඳහා 13වන සංශෝධනය පූර්ණ ලෙස එක් කිරීම, නැගෙනහිර පළාත් සභා මැතිවරණය පැවැත්වීම සහ උතුරු පළාත සඳහා අන්තර්වාර පළාත් සභාවක් පත් කිරීම එක් වී තිබිණ.

## 2008 පෙබරවාරි - සර්ව පාක්ෂික නියොජිත කමිටුව වෙත ජවිපෙ අභියෝග කිරීම

ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ, APRC යෝජනාවලියට අභියෝග කිරීමේ පක්ෂයේ අභිලාෂය පැහැදිලි කරමින් ප්‍රකාශ කළේ මෙම යෝජනා ෆෙඩරල්වාදය හඳුන්වා දීමටත්, ඒ හා සමග උතුරු හා නැගෙනහිර දෙපළාත් යළි ඒකාබද්ධ කිරීමටත් පසුබිම සකසන බව ය.[33] APRC විසුරුවා හරින තුරු 2007 වර්ෂයේ අයවැය සඳහා ඡන්දය ලබා නොදීමට කටයුතු කරන බව ඔවුහු සඳහන් කළ හ.

## 2009 පෙබරවාරි - දෙමළ ජාතික සන්ධානය වෙත විධිමත් ආරාධනාව[34]

2009 වර්ෂය ආරම්භ වන විට යුද්ධය එහි උච්චස්ථානයට ළගා වෙමින් තිබිණ. ජනවාරි දෙවැනිදා රජයේ හමුදා එල්ටීටීඊයේ උතුරු පළාත් අගනුවර ලෙස නම් ලබා තිබුණු කිලිනොච්චිය සිය පාලනය යටතට ගත් හ. 2009 පෙබරවාරි මස, රජයේ මාධ්‍ය විතාරණ උපුටා දක්වමින් දන්වා සිටියේ, අර්ධද්වීපය සඳහා වැඩි බලයක් ලැබෙන අයුරින් නව ව්‍යවස්ථාවක් සම්පාදනය කරනු පිණිස සිය අදහස් හා යෝජනා එක්කිරීමට APRC හා එක්වීමට දෙමළ ජාතික සන්ධානය වෙත රජය ආරාධනා කර ඇති බව ය. කෙසේ නමුත් එම ආරාධනාව දෙමළ ජාතික සන්ධානය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිණ.

## 2009 මැයි - එල්ටීටීඊය පරාජයට පත් වී යුද්ධය අවසන් වීම

2009 වර්ෂයේ මැයි මස 18 වැනි දින එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් මිය ගිය බව හමුදා පාර්ශවයන් විසින් ප්‍රකාශ කරනු ලැබී ය. යුද්ධයේ අවසන් අදියරවලදී දරුණු මානුෂීය අර්බුද පැන නැගුණු අතර, විශාල ලෙස සිදුවුණු ජීවිත හානි, රජයේ හමුදා විසින් වගවිභාගයකින් තොරව සිදු කළ ෂෙල් වෙඩි ප්‍රහාර සහ එල්ටීටීඊය විසින් සිවිල් ජනයා පළිහක් ලෙස භාවිතා කිරීම ඇතුළු දෙපාර්ශවය

30. 'President's proposals to the APRC: The report the govt. wanted kept out of The Leader', *Thesundayleader.lk*, 13 January 2008, at http://www.thesundayleader.lk/archive/20080113/spotlight-1.htm [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
31. නාමිනි විජේදාස, 'APRC final report yet to see the light of day', *Sundaytimes.lk*, 28 July 2013, at http://www.sundaytimes.lk/130728/news/aprc-final-report-yet-to-see-the-light-of-day-54746.html [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
32. 'APRC Proposals to President', *Priu.gov.lk* (Government of Sri Lanka), 24 January 2008, at http://www.priu.gov.lk/news_update/Current_Affairs/ca200801/20080124aprc_proposals.htm [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
33. කේ.ටී. රාජසිංහන්, 'JVP Plans to Challenge APRC Proposals Legally', *Asiantribune.com*, 14 February 2008, at http://www.asiantribune.com/?q=node/9623 [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
34. 'TNA to be invited for APRC', *Dailynews.lk*, 11 February 2009, at http://www.dailynews.lk/2009/02/11/news16.asp [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].

විසින්ම සිදුකළ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් වාර්තා වීම් දක්නට ලැබිණ.

## 2009 අගෝස්තු - ජනාධිපති රාජපක්ෂ වෙත සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ වාර්තාව ඉදිරිපත් කිරීම

2009 අගෝස්තු මාසයේදී APRC අවසන් වාර්තාව ජනාධිපති රාජපක්ෂ වෙත භාර දෙන ලදි. කෙසේ වුවත්, රාජපක්ෂ විසින් එය ලැබුණු බව සඳහන් කළේ හෝ වාර්තාව පොදුජනයා වෙත ඉදිරිපත් කෙරුණේ හෝ නැත. රාජපක්ෂ විසින් යෝජනාවලිය සඳහා පිළිතුරු ලබා දෙන බවට පොරොන්දු වූ බව විතාරණ සඳහන් කළ ද එවැනි ප්‍රතිචාරයක් ලබා දෙනු දක්නට නොලැබිණ.[35]

## 2010 ජනවාරි - රාජපක්ෂ විසින් APRC යෝජනා ප්‍රතික්ෂේප කිරීම

2010 ජනවාරි මාසයේදී ජනාධිපති රාජපක්ෂ සිය ප්‍රතිවාදියා වූ, පොදු විපක්ෂයේ ජනාධිපති අපේක්ෂක සහ යුධ-සමයේ හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා සමඟ තරග වැදුණේ දෙවන වාරය සඳහා ජනපති පදවිය දිනාගනු පිණිස ය. පරාජයත් සමඟ සිය යුධ සේවා කාලය තුළ සිදු කළ වැරදි වෙනුවෙන් ෆොන්සේකා අත්අඩංගුවට ගනු ලැබූ අතර එය දේශපාලනිකව ලද පෙළඹුමක ප්‍රතිපලයක් බව පැහැදිලිව පෙනෙන්නට තිබිණ.

ජනවාර්ගික අර්බුදය සඳහා දේශපාලනික විසඳුමක් ගොඩනගනු පිණිස APRC විසින් ගෙන ආ නිර්දේශ රාජපක්ෂ ජනපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබී ය. APRC වාර්තාව මහජනතාව වෙත ඉදිරිපත් කොට හෝ පිළිගෙන නොතිබියදීත්, ඔහු සඳහන් කළේ පොදුවේ පිළිගත හැකි කිසිදු විසඳුමක් යෝජනා වී ඇතැයි තමන් නොසිතන බව සහ ඉදිරියේදී පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු ඔහු 'තමන්ගේම විසඳුමක්' මේ සඳහා ඉදිරිපත් කරන බව ය.[36]

පාර්ලිමේන්තු මැතිවරණය 2010 අප්‍රේල් මස පැවති අතර පාර්ලිමේන්තු ආසන 225න් 144ක්ම දිනාග නිමින් විශාල ජයග්‍රහණයක් දිනා ගැනීමට එජනිසය සමත් විය.

## 2010 ජූලි - 'නොනිල' ලෙස අවසන් වාර්තාව එළිදැක්වීම

2010 ජූලි මාසයේදී, (ලංකා කම්කරු කොංග්‍රසයේ සාමාජිකයෙකු වශයෙන් පූර්වයේ සර්ව පාක්ෂික නියෝජිත සමුළුව සඳහා සහභාගි වුණු) එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්. යෝගරාජන් සර්ව පාක්ෂික නියෝජිත සමුළු වාර්තාව පාර්ලිමේන්තුගත කරන්නට උත්සාහ දැරී ය. කෙසේ වෙතත්, APRC සභාපතිවරයාගේ අනුමැතියකින් තොරව මෙම පියවර සඳහා පිවිසෙන්නට යෝගරාජන්ට බලයක් නොමැති බව පවසමින් රජයේ මන්ත්‍රීවරුන් ඊට විරෝධය පළ කළේ ය.[37]

යෝගරාජන් සහ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රී නිසාම් කාරියප්පර් යන දෙදෙනා APRCහි සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද අවසන් කෙටුම්පත් සාකච්ඡාවන්හි පත්‍රිකා සහ රැස්වීම් අතරතුර සිදුකළ එකතු කිරීම් මඟින් හා හැන්සාඩ් වාර්තාවේ සටහන්ව ඇති ක්‍රියාකාරකම්වලද සහාය ඇතිව අවසන් වාර්තාව සකස් කළ හ. එතැන් පටන් මෙම වාර්තාව පොදු විෂයපථය තුළ පැවතිණ.

සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ අවසන් එකතුව පක්ෂ පහළවකින් සැදුම් ලද්දේ විය. එම පක්ෂ නම්:

- ලංකා සමසමාජ පක්ෂය
- ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

35. 'APRC Report Unacknowledged', *Thesundayleader.lk*, 27 July 2010, at http://www.thesundayleader.lk/2010/07/27/aprc-report-unacknowledged/ [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
36. චාල්ස් හැවිලන්ඩ්, 'President rejects APRC proposals', *Bbc.co.uk/Sinhala* (BBC Sinhala), 15 January 2010, at http://www.bbc.co.uk/sinhala/news/story/2010/01/100115_mahinda_tamil.shtml [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].
37. 'APRC report tabling bid thwarted,' *Dailynews.lk*, 21 July 2010, at http://archives.dailynews.lk/2010/07/21/pol03.asp [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].

- එක්සත් ජාතික පක්ෂය (ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායම)
- ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය
- ලංකා කම්කරු කොංග්‍රසය
- ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය
- ජාතික ඒකාබද්ධතා පෙරමුණ
- ජාතික හෙළ උරුමය
- මහජන එක්සත් පෙරමුණ
- කඳුරට ජනතා පෙරමුණ
- සමස්ථ ලංකා මුස්ලිම් කොංග්‍රසය
- ජාතික කොංග්‍රසය
- බටහිර ජනතා පෙරමුණ
- ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
- තමිල් මක්කල් විදුතාලෙයි පුලිගල්

# III

# ව්‍යවස්ථා සංශෝධනය අතපසු කළේ ඇයි?

දේශපාලන නායකයින් විසින් කුමනාකාර සහතික ඉදිරිපත් කළ ද, බලය බෙදා හැරීම සම්බන්ධයෙන් පොදු සම්මුතියකට පැමිණීමට දේශපාලන පක්ෂ වෙත වන හැකියාව අන්තර්-සාධක දෙකක් විසින් අතපසු කොට ඇත. ඒ නම් දෘෂ්ටිවාදය සහ උපයෝගීතාව යි. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ වත්මන් උත්සාහයන් මත ද මේ දෘෂ්ටිවාදය හා උපයෝගීතාව යන සාධක බලපැවැත්වී ඇති අතර සර්ව-පාක්ෂික නියෝජිත කමිටුවේ අභිමතාර්ථ සාධනය වළක්වන්නට ද ඒ බලපා ඇත.

## දෘෂ්ටිවාදය

ශ්‍රී ලංකාවේ දේශපාලනයේ දක්නට ලැබෙන වඩාත්ම වැදගත් ලක්ෂණය නම්, දිවයිනේ කොලනිවාදී සහ පශ්චාත් නිදහස් අත්දැකීම් වෙත යළි කැදවාගෙන යා හැකි, රාජ්‍යය සහ සමාජය යන දෙඅංශය තුළම භාවිතයට ගැනෙන ජනවාර්ගික-ආගමික ජාතිකවාදයයි. 19 වන සියවස අග භාගයේ සහ 20 වන සියවස මුල් භාගයේ හමුවන සිංහල බෞද්ධ ජාතිකවාදී නැගීම තුළ දිවයින පිහිටුවා තබන්නේ සිංහල ජනතාවගේ සැබෑ නිජබිම සහ දිවයින් වැසියන්ගෙන් බහුතරයකගේ ආගමික භාවිතය වන බුදුදහමේ භාරකාරත්වය හිමි දේශය යන ස්ථානවල ය.

එපමණක් නොව, ශ්‍රී ලංකාවේ නිදහස සඳහා වූ මාර්ගය, ජනවාර්ගික, ආගමික සහ පන්ති භේද මගහැර ඒ ඒකරාශී කළ ජනතාවාදී විජිතවිරෝධී අරගලයක් ඔස්සේ වැටී නැත.[38] දිවයින පුරා පැතිරී ගිය එවැනි ජාතික අනන්‍යතාවක් බලමුළු ගැන්වී නොමැති මොහොතක හමුවූයේ නිදහස ලැබීමෙන් පසු ජනවාර්ගික අනන්‍යතාවන් තවදුරටත් දේශපාලනිකව මූලිකව ගැනෙන පසුබිමකි.[39] විජිත විරෝධය බහුතරයේ සිංහල ජාතිකවාදයේ භාෂාව හරහා අර්ථ ගැන්වෙද්දී සිදුවූයේ පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ මහජන මතය යන්න දේශීය ප්‍රභූන් අත ඉකමණින් රැස් කළ ධනය මත තීරණය වන්නක් වීමයි. මෙම තර්කය, 1948 පුරවැසි පනත, ලංකාවේ වතුකරයේ සේවය කළ ඉන්දීය දමිළ ජාතිකයින්ට ඡන්ද බලය අහිමි කිරීම සහ සියලුම සුළුජාතික ප්‍රජාවන් තව දුරටත් දුරස්ථ කරමින් සිංහලය පමණක් රාජ්‍ය භාෂාව කිරීම සඳහා වූ 1956 භාෂා පනත ආදියෙහිදී ප්‍රකාශයට පත් විය.

ජනප්‍රිය පරිකල්පනය තුළ හමුවන ඒකීය භෞමික ශ්‍රී ලංකා රාජ්‍යය හමුවේ ෆෙඩරල්වාදය හරහා නැගෙන සුළුතර ස්වයං-නිර්ණය පෙනී යන්නේ එහි වන අතිමූලික ස්වභාවය යටපත් කරමිනි. මෙම රාජ්‍යයේ ගනුදෙනු විරහිත ස්වභාවය එහි දේශපාලන භූමි දර්ශනයේ තරගකාරීත්වය පිළිබඳ මූලික කරුණ

38. David Rampton, 'A Game of Mirrors: Constitutionalism and Exceptionalism in a Context of Nationalist Hegemony', in Asanga Welikala (ed), *The Sri Lankan Republic at 40: Reflections on Constitutional History, Theory and Practice* (Colombo: Centre for Policy Alternatives, 2013).

39. David Rampton (2011) 'Deeper hegemony': the politics of Sinhala nationalist authenticity and the failures of power-sharing in Sri Lanka, *Journal of Commonwealth and Comparative Politics*, 49:2 (2011): 245-273.

සකසයි. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව, බුද්ධාගම සඳහා 'ප්‍රමුඛතම ස්ථානය' හිමිකර දෙන පසුබිමක පිහිටන මධ්‍යගත රාජ්‍යයක් මූර්තිමත් කරන්නකි. රාජ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ වූ උත්සාහයන් රාශියක් දිගින් දිගටම අතහැර දමා හෝ අතරමග නතර වී තිබෙන්නේ ශ්‍රී ලාංකික රාජ්‍යය සම්බන්ධ අර්ථ සම්පන්න ප්‍රති-පරිකල්පනයකට පිවිසෙමින් සියලු පාර්ශවවලට පුළුල්ව පිළිගත හැකි ආකෘතියක් නිර්මාණය කිරීමට අපොහොසත් වීම හේතුවෙනි.

එපමණක් නොව, දිවයිනේ ජාතික අනන්‍යතාව හරයාත්මකව නැවත පරිකල්පනය නොකිරීමද සිංහල දේශපාලනික ප්‍රභූන් අතර ආතතිය නැංවීමට පසුබිම් සාදා ඇත. ඓන්ද්‍රියව ගොඩනැගුණු ජනතාවාදී විජිත විරෝධී ව්‍යාපාරයක් නොමැති වීම තුළ සිංහල ප්‍රභූන් ජාතිකවාදී තත්‍යථාව සඳහා වන නිත්‍ය තරගය වෙත ස්ථාපිත වූයේ සිංහල-බෞද්ධ සහයෝගීතාවක ඇසින් ඒ දකිමිනි. දේශපාලනික ජීවිතය වෙතට දැඩි බලපෑමක් ඇති කිරීමට බෞද්ධ භික්ෂුවට හැකි විය. පුළුල් ලෙස අපකීර්තියට ලක්වූ ඉන්දු-ලංකා ගිවිසුම පවා සිංහල ජාතිකවාදී ජවිපෙ සිය සන්නද්ධ අරගලය සඳහා බෞද්ධ භික්ෂූන් පෙළගසවන බව දුටුවේ ය. සැබවින්ම, ජවිපෙ විසින් පවත්වන ලද 'පන්ති පහ' තුළ දී ඔවුන් නිදහස අර්ථ ගන්වන ලද්දේ ඒ 'කළු සුද්දන්' (බටහිරකරණය වූ ප්‍රභූන් හැඳින්වූ පරිභව නාමය) විසින් ලබාගත් මුලා කරවන ලද නිදහසක් ලෙස ය. ජවිපෙ තත්වය තවදුරටත් පිළිඹිබු කරන්නේ ශ්‍රී ලාංකික දේශපාලනයේ වඩාත් ස්ථාවර මතවාදී බලවේගය ලෙස සිංහල ජාතිකවාදයේ වූ ආරක්ෂාව සලසා ගැනීමේ පදනමයි. රැඩිකල් විකල්ප ව්‍යාපාරයක් ලෙස ජවිපෙ වෙත ඇති ප්‍රතිරූපය නොතකා හරිනු ලැබූ විට එය ශ්‍රී ලංකාව සිංහලයින්ගේ ය හා සඳහාය යන අධිපති සුසමාදර්ශය තුළ රැඳේ.

යුද්ධය පුපුරා හැලීමත් සමඟ, කුමන ගැටළු යටතේ රාජ්‍ය බලය පිළිබඳ සාකච්ඡා කළ යුතුද යනුවෙන්, දේශපාලනික තලයට නව ගතිකයන් හඳුන්වා දෙනු ලැබිණ. උතුරු සහ නැගෙනහිර පළාත්වල විශාල කලාපවල බලය තහවුරු කරගැනීම සඳහා ප්‍රචණ්ඩ ගැටුම් සිදුවීමට සමාන්තරව දේශපාලනික හෙට්ටු කිරීම් සිදුවනු දක්නා ලදි. සාකච්ඡා සහ රාජ්‍ය ප්‍රතිසංස්කරණ දිගින් දිගටම එකතැන පල්වීම හෝ අත්හැර දැමීම හේතුවෙන් ව්‍යසනකාරී ගැටුම සඳහා කිසිදු තීරණාත්මක වෙනසක් යෝජනා කිරීමට ඔවුහු අපොහොසත් වූ හ. දේශපාලන බිම පූර්ණ ලෙස නිහඬ වීමත් සමඟ සටන් බිම ජාතික ගැටළුව සඳහා පිළිතුරු විමසන ඉම් පෙදෙස බවට හැරිණ.

## උපයෝගීතාව

රාජ්‍යය යන්න වඩාත් සංගෘහිත ආකෘතියකින් ප්‍රතිරූපයට නැගීම පිළිබඳ කිසිදු ස්වාධීන සම්මුතියක් නොමැති විටක, දකුණේ ප්‍රධාන දේශපාලන ක්‍රියාධරයෝ, වඩා බලසම්පන්න ජනතා බලමුළුව හමුවන සිංහල-බෞද්ධ ඡන්දදායකයාගේ අනොන්‍යාන්‍ය එක්වී එදිරිවාදී වන ගතිපැවතුම් යළි පණගන්වති. මෙම සන්දර්භය තුළ, එජාපය සහ ශ්‍රීලනිපය යන දකුණේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකෙහිම දේශපාලනික හැසිරීම ආකාර ත්‍රිත්වයක් ඔස්සේ හඳුනාගත හැකි යː

1. බලයේ සිටින විට, පාලක පක්ෂවලට සුළුතරයේ නොවිසඳුණු දුක්ගැනවිලිවලට පිළිතුරු සෙවීම සඳහා උත්සාහ කිරීමට බල කෙරෙන්නේ තමන් බහු-වාර්ගික නමුත් ගැටුම්වලින් වියුක්ත රාජ්‍යයක ආණ්ඩුව බවට සිය සුජාතභාවය පෙන්වනු පිණිස ය. ආර්ථික සංවර්ධනය සහ විදේශ සබඳතා වැනි කරුණු සමඟ ගණුදෙනු කරමින් පාලනය ගෙන යාම සඳහා පක්ෂවලට මධ්‍යයට පැමිණෙන්නට සිදු වන විට සිය දේශපාලනික වින්‍යාසය සමබර තත්වයක පිහිටුවන්නට ඔවුනට සිදු වේ. එබැවින් පාලක පක්ෂ, සුළුතර පක්ෂ සමඟ සිදුකෙරෙන සාකච්ඡා වෙත හෝ ජනවාර්ගික ගැටුම සඳහා දේශපාලන විසඳුමක් පිණිස ලබාගැනීම ඉලක්ක කරගත් ප්‍රතිසංස්කරණ පැකේජ ඉදිරිපත් කිරීම වෙත හෝ, තල්ලු වී යති.

2. විපක්ෂයේ භූමිකාව රඟදක්වන විට, පක්ෂ කටයුතු කරන්නේ විශාලතම දේශපාලනික ප්‍රතිලාභය හිමිවන පරිදි සිංහල ජාතිකවාදී හැඟීම් උලුප්පා එම කණ්ඩායම් බලමුළු ගන්වමින්, දේශපාලනික විසඳුමක් සඳහා වන රජයේ උත්සාහයන් කඩාකප්පල් කර දමනු පිණිස ය. ජාතිකවාදී අවර ගැසීම් හමුවේ පාලක පක්ෂ දේශපාලන විසඳුමක් සඳහා ආරම්භ කළ පියවරයන් පසුපසට තබන අතර අනතුරුව ඒ සඳහා නව ප්‍රතිසංස්කරණ යෝජනාවලි ඉදිරිපත් කරනු හඳුනාගත හැකි ය. බොහෝ විට විපක්ෂ දේශපාලන පක්ෂ කටයුතු

කරන්නේ 'අවුස්සා දමන්නන්' වශයෙන් පමණක් මිස 'අනාගත පාලක පක්ෂ' වශයෙන් නොවේ. එහෙයින්, සිය ප්‍රයෝජ්‍ය න්‍යාය පත්‍රවලින් ඔබ්බට ගොස්, ජනවාර්ගික අර්බුදයට ස්ථිර දේශපාලනික විසඳුමක් ලබා දෙනු පිණිස පුළුල් මහජන මතයක් සාදනු වස් කටයුතු කෙරෙන සංගෘහිත පියවරයන් අවම ය.

3. යුධ සමය තුළදී, එල්ටීටීඊය මැදහත් දමිළ කණ්ඩායම් සහ අනුකම්පාසහගතව බැලූ ජාත්‍යන්තරයෙන් වෙන් කොට තනි කිරීම සඳහා උපායමාර්ගිකව, බලය බෙදීමේ විසඳුම් දෙස නෙත් හෙළන ලද්දේ අධිපති සිංහල ජාතිකවාදී දෘෂ්ටියකිනි. සිංහල හඬවලින් අධිපතිත්වය දැරූ ශ්‍රී ලංකා රජයේ සහ සර්ව පාක්ෂික සමුළුවල බලය බෙදීම වෙත වූ මෙම උපයෝගී යෙදවුම දමිළ යුධවාදීන් තුළ නිර්මාණය කළේ සැකයකි.

දකුණේ දේශපාලකයින් වෙතින් ආ මෙම ජනවාර්ගික වැඩි කොටස ඉල්ලීම දේශපාලනික විසඳුමක් සඳහා වූ උත්සාහයන් ගණනාවක් ව්‍යර්ථ කරදමන්නට හේතුපාදක විය. ජනප්‍රිය විරෝධතා මතු නොව සන්නද්ධ කැරැල්ලක් හමුවේ පවා සිය අත්හැර දැමීම විශද කළ මෙම උත්සාහයන් ජාතිකවාදී පසුපසට ඇදීම පූරණය කළේ ය.

වාර්ගික වැඩි කොටස ඉල්ලීමේ ගතිකයන් මහින්ද රාජපක්ෂගේ ජනාධිපති පදවිය සහ APRC ක්‍රියාවලිය තෙක්ම වර්ධනය විණ. පොදුජන එක්සත් පෙරමුණේ ව්‍යවස්ථා කෙටුම්පතේ සිට (2000) එක්සත් ජාතික පෙරමුණේ සටන් විරාම ගිවිසුම දක්වා (2002-04) වූ අසාර්ථක වූ උත්සාහයන් දාමයක් මේ යුගය තුළ හමු විය. මුල් අවස්ථාවේ ජවිපෙන් සහ දෙවැනි අවස්ථාවේ ජාතික හෙළ උරුමයෙන් වශයෙන්, උත්සාහයන් දෙකටම ජාතිකවාදී විරෝධතා පැන නැගුණු අතර සාම ක්‍රියාවලිය ජාත්‍යන්තරකරණය කිරීමට සහ එක්සත් ජාතික පෙරමුණු රජයේ ආර්ථික ප්‍රතිපත්තිවලට එරෙහිව ප්‍රබල විරෝධතා නැගිණ. 2003 වසරේ එල්ටීටීඊය විසින් ගෙන ආ අන්තර්වාර ස්වයං පාලන යෝජනා සහ 2004 සුනාමි ව්‍යසනයෙන් පසුව ආ, ජවිපෙ විසින් අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කෙරුණු, පශ්චාත්-සුනාමි ක්‍රියාකාරී කළමණාකරන ව්‍යුහය දිගින් දිගටම ඉහළ නැගෙමින් ආ ජාතිකවාදී ප්‍රතිරෝධයන්ට ඉන්ධන සැපයීමක් බඳු විය. එක්සත් ජාතික පෙරමුණු රජය අත්සන් කළ සටන් විරාම ගිවිසුම යනු හුදු නාමයක් පමණක් වී, දේශපාලනික සහ යුධමය යන දෙඅංශයම විසඳුමකින් තොරව පවතිද්දී, රාජපක්ෂ රජය ගෙවුණු දශකයේ වූ (ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සහ සාකච්ඡා ඉලක්ක කරගත්) 'ලිබරල් සාමය' යන්න ප්‍රතික්ෂේප කරමින් යුධමය විසඳුමක් වෙත අවතීර්ණ විය. 2006 වර්ෂය මැද භාගයේ APRC පිහිටුවෙන්නේ එල්ටීටීඊයට එරෙහිව යුධමය ක්‍රියාදාමයක් ඇරඹෙන එවැනි සන්දර්භයක් පසුබිමෙහිදී ය.

APRCහි ක්‍රියාකාරීත්වය වසර තුනක් පුරා විහිද ගිය අතර ඒ සඳහා විශේෂඥයින් දාහත් දෙනෙකුගේ සහ දේශපාලන පක්ෂ පහළවකගේ දායකත්වය ලැබිණ. එතෙක් පැවති අසාර්ථක වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයන්හි රටාවන්ට අනුකූලවම, APRC ක්‍රියාවලිය අතරතුරද දේශපාලනික හිරවීම් සහ දේශපාලන පක්ෂ අතර වූ අන්‍යෝන්‍ය සැකකිරීම් දක්නට ලැබිණ. මූලිකව කුමන ආකාරයේ ඉහළ අපේක්ෂාවන් පැවතියද, ශ්‍රීලනිප-එජාප අවබෝධතා ගිවිසුම ආරක්ෂා කරගැනීමට රජය අසමත් වීම සහ ඉන්පසු ඇතිවූ සිදුවීම් ඇතුළු දේශපාලනික පක්ෂග්‍රාහී වීම් හේතුවෙන් APRC ක්‍රියාවලියට බාධා ඇති විය. බලය බෙදා හැරීම පිළිබඳ සාපෙක්ෂ වශයෙන් වැඩි නැඹුරුවක් පෙන්වූ එජාපයේ ජී.එල්.පීරිස් සහ කේ.එන්.චොක්සි යන දෙදෙනා කමිටුවට ඇතුළු කිරීමට ආරම්භයේදී ජවිපෙ සහ ජාතික හෙළ උරුමය එරෙහි විය. එසේ වුවත්, එජාපයේ විසම්මුතික මන්ත්‍රීවරුන්ට පිළිගත් දේශපාලන පක්ෂයක් හරහා APRC වෙත සිය කණ්ඩායමේ යෝජනා ඉදිරිපත් කිරීමට රජය අවසර දුන්නේ ය.[40]

සුවිශේෂ කරුණ නම්, ආරම්භයේදී APRC වෙත එජාප සාමාජිකයින් දෙදෙනෙකු සහභාගී වීමට විරෝධය පළ කළ ජවිපෙ සහ ජාතික හෙළ උරුමය එජාපයේ විසම්මුතික මන්ත්‍රීවරුන් මෙලෙස තම යෝජනා ඉදිරිපත් කිරීමට එරෙහිව විරෝධය පළ නොකිරීමයි. වෙනත් කිසිදු APRC සාමාජිකයෙක්ද

40. සඳුන් ඒ. ජයසේකර, 'UNP reformists outline devolution proposals', *Dailymirror.lk*, 23 May 2007, at http://archives.dailymirror.lk/2007/05/23/front/06.asp [අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2016 මාර්තු 20].

මෙයට විරුද්ධ වූයේ නැත. මෙනයින්, මුලින් ඇතුළත් කරන්නට කටයුතු කෙරුණු එජාප සාමාජිකයින් දෙදෙනා, APRCහි සාමාජිකයන්ගේ අවසන් නිර්දේශ වෙත බලපෑම් එල්ල කරමින්, වඩාත් වැඩි බලය බෙදීමක් වෙත කමිටුව යොමු කරවනු ඇතැයි යන පදනමින් ඔවුන්ට එරෙහි වූ බව තීරණය කරන්නට වැඩි අවකාශයක් පවතී. අනෙත් අතට, ජනපතිවරයාට සහාය දක්වනු පිණිස අනෙත් අන්තයට පැමිණි විසම්මුතික මන්ත්‍රීවරු, ජවිපෙ සහ ජාතික හෙළ උරුමයද සහාය පළ කළ ශ්‍රීලනිපයේ නව (ඒකීය රාජ්‍ය) මාර්ගය වෙත අවතීර්ණව සිටි අය වූ හ. එසේ හෙයින්, පක්ෂග්‍රාහී දේශපාලනය, APRC තුළ වන බලය බෙදීම පිළිබඳ අත්‍යාවශ්‍යයික සහ අර්ථ සම්පන්න සාකච්ඡාවක් සහ විවාදයක් අපේක්ෂා කරයි.

# IV

# සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ ප්‍රතිඵල: නිර්දේශ පිළිබඳ කෙටි විමසුමක්

APRC ක්‍රියාවලිය ප්‍රධාන ලේඛණ හතරක් ඉදිරිපත් කළේ ය. විශේෂඥ කමිටුවේ සාමාජිකයින් දාහත් දෙනාගෙන් එකොලොස් දෙනෙකු ‘A’ වාර්තාව නමින් සඳහන් කළ ලේඛණයට අත්සන් තැබූ අතර එය බහුතරයේ වාර්තාව ලෙස ප්‍රසිද්ධියට පත් විය. සිවුදෙනෙකු ‘B’ වාර්තාවට අත්සන් තැබූ අතර එය ප්‍රසිද්ධියට පත් වූයේ සුළුතරයේ වාර්තාව ලෙස ය. මෙම වාර්තාව තුළ බහුතරයේ වාර්තාව තුළ ගනු ලැබූ ආස්ථානයන් විවේචනාත්මකව විග්‍රහ කොට තිබිණ. (ඉතිරි සාමාජිකයින් දෙදෙනා ස්වකීය ඒකපුද්ගල වාර්තා ඉදිරිපත් කර තිබුණු අතර ඒ වාර්තා ද්විත්වයම බහුතරයේ වාර්තාව පිළිබඳ විසම්මුතික අදහස්වලින් යුක්ත විය).

බහුතරයේ වාර්තාව ඉදිරිපත් කළ නිර්දේශ අතර, ජනාධිපතිවරයාගේ විධායක ක්‍රියාකාරීත්වය අධිකරණයේ විමර්ෂණයට ලක් විය යුතු බව; ප්‍රධාන අධිකරණ පද්ධතියෙන් පරිබාහිරව ව්‍යවස්ථාදායක අධිකරණයක් පිහිටුවිය යුතු බව; පළාත් විෂයයෙහි ජනාධිපතිවරයා විසින් ගනු ලැබිය හැකි හදිසි බලතල අධිකරණයේ හා පාර්ලිමේන්තුවේ පාලනය යටතේ පැවතිය යුතු බව; පළාත් නියෝජිතයින්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ දෙවන මණ්ඩලයක් ස්ථාපිත කළ යුතු බව; ජනාධිපතිවරයාගේ වාර්ගිකත්වයෙන් බැහැර අනෙකුත් වාර්ගික කණ්ඩායම්වලින් තෝරාගැනෙන, වසර තුන බැගින් බලයේ සිටිය හැකි උප ජනාධිපතිවරුන් දෙදෙනෙකු පත් කළ යුතු බව සහ ඉන් එක් උප ජනාධිපතිවරයෙක් පාර්ලිමේන්තුවේ දෙවන මණ්ඩලයේ (ඡන්ද බලය රහිත) සභාපතිවරයා ලෙසත් අනෙත් තැනැත්තා උසස් නිලතල කොමිසමේ ප්‍රධානිය ලෙසත් පත් කළ යුතු බව සඳහන් විය.[41]

සුළුතරයේ වාර්තාව බහුතරයේ වාර්තාවේ දෘශ්ඨීන් කිහිපයක් අභියෝගයට ලක් කළේ ය. ජනවාර්ගික හා භාෂාමය පදනම් මත පළාත් මායිම් වෙන් කිරීම සිදු වන්නේය යන පදනමෙහි සිටිමින් එය උතුරු-නැගෙනහිර දෙපළාත් ඒකාබද්ධ කිරීමට වූ යෝජනාවලට විරෝධතාවන් ඉදිරිපත් කර තිබිණ. ඉඩම් සහ පොලිස් බලතල බෙදා හැරීමටත්, අධිකරණය සදහ බැහැරින් එල්ල විය හැකි බලපෑම ඉහළ අවදානම් තත්වයකට පත් වීම පදනම් කොටග නිමින් අධිකරණයෙන් පරිබාහිරව ව්‍යවස්ථාදායක අධිකරණයක් පිහිටුවීමත් ඔවුන් විරුද්ධ වී තිබිණ.[42] කෙටියෙන් සඳහන් කළහොත්, සුළුතරයේ වාර්තාව, බහුතරයේ වාර්තාව මඟින් සිදු කරන නිර්දේශ හේතුවෙන් භෞමික අඛණ්ඩතාවට බාධාවන් එල්ල වීම හරහා ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් එල්ල විය හැකි බවට අවධානයට යොමු

41. Report A (Majority Report) of the Panel of Experts in Rohan Edrisinha, Mario Gomes, V.T. Thamilmaran and Asanga Welikala (ed), *Power Sharing in Sri Lanka: Constitutional and Political Documents 1926-2008*, (Colombo: Centre for Policy Alternatives, 2008).

42. එම.

කළේ ය. මෙම වාර්තා දෙකක් හමුවේ කණ්ඩායම් දෙකක් අත්සන් තැබීම හරහා පෙන්නුම කරන අදහස් වෙනස වූ කලී, ජාතික ගැටළුව පිළිබඳ වන අදහස් සාරයන් හමුවේ පිළිඹිබු කෙරෙන, විමධ්‍යගත-වාදීන් සහ ජාතිකවාදී අද්වෛතවාදීන් අතර ඇති තරගකාරී න්‍යාය පත්‍රයන්හි වෙනස ය.

තුන්වන වැදගත්ම ලේඛණය නම් 'APRCහි යෝජනා සඳහා ආරම්භයක් ලෙස පවතින ව්‍යවස්ථාවේ අදාල විධිවිධාන පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් ගත යුතු ක්‍රියාමාර්ග' නමින් ඉදිරිපත් වූ අන්තර්වාර වාර්තාවයි. හිටපු ජනපති මහින්ද රාපක්ෂගේ යෝජනාවක් අනුව APRC විසින් මෙම යොජනා ඉදිරිපත් කරන ලද්දේ 13වන ව්‍යවස්ථා සංශෝධනය කමිටුව සඳහා පදනම තැනිය යුතු බව සඳහන් කරමිනි. එබැවින් මෙම වාර්තාව 13A ලෙස ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සාකච්ඡා මධ්‍යයට යළි ඉදිරිපත් කරන ලද අතර එතැන් පටන් භාවිතයේ පැවතිණ. මෙම අන්තර්වාර යෝජනා කෙටිකාලීනව පළාත් තුළ බලය ඵලදායී ලෙස බෙදා හැරීම සාක්ෂාත් කරගනු පිණිස පවතින ව්‍යවස්ථාමය විධිවිධාන පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම අනුමත කළේ ය.

සිවුවන සහ වඩා වැදගත්ම APRCහි අග්‍රඵලය වන්නේ, එහි ක්‍රියාකාරීත්වය තුළදී ලංකා කම්කරු කොංග්‍රසය නියෝජනය කළ ආර්. යෝගරාජන් සහ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නියෝජනය කළ නිසාම් කාරියප්පර් දෙදෙනා විසින් නොනිල වශයෙන් එළි දැක්වූ (විතාරණ යෝජනා වශයෙන් ප්‍රසිද්ධියට පත්) අවසන් වාර්තාවයි. එය විශේෂඥ කමිටු වාර්තා පදනම් කරගනිමින් තිස්ස විතාරණ විසින් සකසා ඇති අතර සුළුතරයේ වාර්තාවට වඩා බහුතරයේ වාර්තාවේ අන්තර්ගතය වෙත වැඩි අවධානයක් යොමු කොට ඇත.[43]

රාජ්‍යයේ ඒකීය රාමුව සුරක්ෂිත කරන අතරම, සුවිශේෂී මට්ටමකින් බලය පළාත් හමුවේ බෙදා හරිමින් ද, මධ්‍යම හා පළාත් නීති සම්පාදනය කරමින්ද, ව්‍යවස්ථාදායක අධිකරණයක් මඟින් ව්‍යවස්ථාදායකයේ උත්තරීතර බව බලාත්මක කරමින්ද, විධායක ක්‍රියාකාරීත්වය පිළිබඳ අධිකරණමය විමර්ෂණ යෝජනා කරමින් ද, සිවිල් අයිතිවාසිකම්, දේශපාලන අයිතිවාසිකම්, සමාජ හා කණ්ඩායම් අයිතිවාසිකම් සුරක්ෂිත කරමින්ද වඩා බහුත්වවාදී සමාජයක් යෝජනා කරයි. එහෙයින් APRC පරිකල්පනය කරන්නේ මධ්‍යම ආණ්ඩුව සහ පළාත් අතර බලය බෙදී යන ඒකීය, නොබෙදුණු සහ පුළුල්ව සංගෘහිත රාජ්‍යයකි. (ඉහත සඳහන් කළ ප්‍රතිඵල හතරින් තුනක් මඟින් මතුකළ ප්‍රධාන කරුණු 13ක් යටතේ වන යෝජනා සන්සන්දනය සඳහා ඇමුණුම I බලන්න: විශේෂඥ කමිටුවේ බහුතරයේ වාර්තාව, APRCහි අන්තර්වාර වාර්තාව සහ APRCහි අවසන් වාර්තාව).

රාජ්‍යය මූලික සංඝටක පිළිබඳ APRCහි යෝජනා පහත දක්වා ඇත:

**රාජ්‍යයේ ස්වභාවය:**
නොබෙදුණු හා එකිනෙක බැදුණු රාජ්‍ය ව්‍යුහයකින් සමන්විත, රාජ්‍ය බලය මධ්‍යම රජය හා පළාත් වෙත බෙදී ඇති ශ්‍රී ලංකා ජනරජය යනු ඒකීය රාජ්‍යයකි.

**ආණ්ඩුවේ ආකෘතිය:**
ජනතාව විසින් ඡන්දයෙන් පත් කරන ලද නියෝජිතයින්ගෙන් මධ්‍යම රජයේ පාර්ලිමේන්තුව සමන්විත වන අතර පළාත් ව්‍යවස්ථාදායකය මඟින් සෙනෙට් මණ්ඩලය පත් කෙරෙනු ඇත.

**සෙනෙට් මණ්ඩලය:**
එක් පළාතකින් සෙනෙට් සභිකයින් හත් දෙනෙකු බැගින් 63 දෙනෙකුගෙන් සමන්විත සෙනෙට් මණ්ඩලයක් පළාත් ව්‍යවස්ථාදායක විසින් පත් කෙරෙනු ඇත. අමතර සෙනෙට් සභිකයින් දසදෙනෙකු (ඉන්දීය දමිළ ප්‍රජාව සඳහා එක් සභාවක් සහ උතුරු නැගෙනහිරින් පරිබාහිර ප්‍රදේශවල වෙසෙන මුස්ලිම් ප්‍රජාව සඳහා එක් සභාවක් වශයෙන් වූ) ප්‍රජා සභා දෙකකින් පත් කෙරෙනු ඇති අතර නියෝජනය නොවෙන සෙසු කණ්ඩායමවලින් දෙදෙනෙකු ජනාධිපතිවරයා විසින් නම් කරනු ඇත.

43. එම. පිට 777.

**බලය බෙදීම:**

මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන වශයෙන්, ඒ ඒ ස්ථරය වෙත වෙන්වූ වෙනම ලැයිස්තු ගතකොට, ස්ථර තුනක් යටතේ බලය බෙදී යනු ඇත. සමගාමී බලතල ලැයිස්තුව අහෝසි කෙරෙනු ඇත.

ජනාධිපතිවරයාගේ මීළග ධූර කාලය අවසාන වීමෙන් පසු, නව ජනාධිපතිවරයා පත් කෙරෙනු ඇත්තේ පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකම විසිනි. පාර්ලිමේන්තු මණ්ඩල දෙකම මගින් තෝරා පත් කරගන්නා, පාර්ලිමේන්තුවේ සාමාජිකයකු නොවන හා ජනාධිපතිවරයාගේ ප්‍රජාවට අයත් නොවන ප්‍රජාවකින් තෝරාගත්, උප ජනාධිපතිවරයකු ද හමුවනු ඇත. උප ජනාධිපති ධූරය, එම ධූරය පත් කිරීමෙන් අනතුරුව, ජනාධිපතිවරයා අයත් වන ප්‍රජාව හැර සෙසු සියලු ප්‍රජාවන් අතර හුවමාරු වෙමින් පැවත යනු ඇත.

**බලය බෙදීමේ ඒකකඃ**

බලය බෙදී යාමේ ඒකකය වන්නේ පළාතයි.

**ප්‍රජා සභාඃ**

ඉන්දියානු දමිළ ප්‍රජාවේ සහ උතුරු නැගෙනහිර පළාත්වලින් බැහැර ජීවත්වන මුස්ලිම් ප්‍රජාවේ සංවර්ධන අවශ්‍යතාවන් වෙනුවෙන් ප්‍රජා සභා දෙකක් පිහිටවනු ඇත.

**පුද්ගල සහ කණ්ඩායම් අයිතීන්ඃ**

සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් පමණක් නොව කණ්ඩායම්, සමාජ, ආර්ථික, සංස්කෘතික, කාන්තා සහ ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කෙරෙන පුළුල් හිමිකම් පනතකින් ව්‍යවස්ථාව සමන්විත වනු ඇත.

**බුදු දහමඃ**

බුදු දහම සඳහා රාජ්‍යයේ අග්‍රස්ථානය හිමිවනු ඇති අතර ඒ අනුව බුද්ධ ශාසනය ආරක්ෂා කොට පෝෂණය කිරීම රජයේ වගකීම වනු ඇත. ඒ අතරම, 1978 ව්‍යවස්ථාවේ අංක 10 සහ 14(l)(e) වගන්ති ප්‍රකාරව සියළු ආගම්වල අයිතිවාසිකම් සුරක්ෂිත කෙරෙනු ඇත.

**භාෂාඃ**

ජාතික භාෂාවන් වන සිංහල සහ දෙමළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා වනු ඇත. නිල කටයුතුවලදී ඇතැම් විට ඉංග්‍රීසි භාෂාව භාවිතා කෙරෙනු ඇත.

**ව්‍යවස්ථාදායකයේ උත්තරීතර බවඃ**

ව්‍යවස්ථාදායක අධිකරණයක් මගින් ව්‍යවස්ථාවේ ඇති උත්තරීතර බව හඳුනාගැනෙනු සහ ආරක්ෂා කෙරෙනු ඇත. මධ්‍යම රජය හා පළාත් මගින් පැනවෙන, ව්‍යවස්ථාවට පටහැනි වන, පිළිපැදීමට හෝ අතහැර දැමීමට නියෝග කෙරෙන සියළු අණපනත් බල රහිත කෙරෙනු ඇත. ජනාධිපති ධූරයේ සිටින පුද්ගලයාට සිය නිල කාලය තුළ සියලුම ආකාරයේ විධායක බලතල භාවිතා කිරීම සඳහා මුක්තිය හිමි වේ. කෙසේ වුවත්, සියලුම විධායක ක්‍රියාකාරකම් අධිකරණ විමර්ෂණයන් සඳහා යටත් ය. ජාතික හෝ පළාත් හෝ යන කවර මට්ටමක නීති සම්පාදනයක් වුව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිදුකරන පශ්චාත් නීති කෙටුම්පත් පිළිබඳ සමාලෝචනයකට යටත් ය.

**බෙදී වෙන්වීමෙන් ආරක්ෂා වීමඃ**

පළාත් සහ පළාත් පාලන ආයතන ව්‍යවස්ථානුකූලවම ජාතික සමගිය හා ජනරජයේ අභාජ්‍යතාව සඳහා කටයුතු කිරීමට බැඳී සිටී. රාජ්‍යයේ ඒකමිතිය, භෞමික අඛණ්ඩතාව හා ස්වෛරීභාවය සඳහා 'පැහැදිලි සහ පවතින' අන්තරායක් හඳුනාගත හැකි අවස්ථාවකදී සහ පළාත් අධිකාරිය මැදිහත්වීම ඉල්ලා සිටින අවස්ථාවකදී මධ්‍යම රජයට හදිසි බලය භාවිතා කරමින් පළාත් කටයුතු සඳහා මැදිහත් විය හැකි ය.

**ඡන්ද ක්‍රමයඃ**

ඡන්ද කොට්ඨාශය පදනම් කරගත් සරල බහුතර නියෝජන (FPTP) ක්‍රමය සහ පක්ෂ පදනම් කරගත සමානුපාතික නියෝජනය (PR) යන දෙයාකාරය මුල්කරගත් මිශ්‍ර ඡන්ද ක්‍රමයක් ස්ථාපිත කෙරෙනු ඇත. මෙම ක්‍රමවේදය සමානුපාතික නියෝජිත ක්‍රමය බල පැවැත්වෙන බවට සහතික කළ යුතු ය. තවදුරටත්, මෙහිදී

ඡන්දදායකයාට ඡන්ද පත්‍රිකා දෙකක් ලැබෙන අතර එක් ඡන්ද පත්‍රිකාවක් මඟින් සිය ඡන්ද කොට්ඨාශය සඳහා නියෝජිතයා ද අනෙත් පත්‍රිකාව මඟින් සිය අභිමතය පරිදි පක්ෂය ද, දිස්ත්‍රික්කය (හෝ දිවයින) පදනම්ව සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ තෝරා ප්‍රකාශ කළ හැක.

## ඉඩම්:

සෑම පළාතකටම, අදාල ඉඩම්වල ඇති පුද්ගල අයිතිය හෝ රැකියා අයිතිය යන්නට යටත්ව, පළාත් තුළ ඇති අනෙකුත් සියලු රජයේ ඉඩම්වල අයිතිය හිමි වේ. අදාල පළාත් රජයට, එම ඉඩම් භාවිතා කිරීමේ අයිතිය යටතේ ඉඩම් පැවරීම හා අන්සතු කිරීම, ඉඩම් භාවිතයට ගැනීම, ඉඩම් නිරවුල් කිරීම සහ වර්ධනය කිරීම සඳහා බලය හිමි වනු ඇත.

පළාතේ රජයේ ඉඩම් නිරවුල් කොට පැවරීම සහ අන්සතු කිරීම යටතේ පළමුව දිස්ත්‍රික්කයේ ඉඩම් අවශ්‍යතා ඇති පුද්ගලයින්ටද, දෙවනුව පළාත තුළ සම්බන්ධව ඇති දිස්ත්‍රික්කවලට ද, අනතුරුව පළාතේ ඉඩම් අවශ්‍යතා ඇති පුද්ගලයින්ට ද (සියලුම ප්‍රජාවන්ගේ, විශේෂයෙන් දිස්ත්‍රික්කය තුළ සහ පළාත තුළ වෙසෙන සුළුජාතීන් ද ඇතුළුව, අවශ්‍යතා සැළකිල්ලට ගනිමින්) සහ අවසානයේ පළාතෙන් පිටත ඉඩම් අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ද වශයෙන් ගෙන කටයුතු කළ යුතු ය. ලැබුම්කරුවන් තේරීමේ වගකීම පළාත සතු ය. අන්තර්-පළාත් වාරිමාර්ග ව්‍යාපෘති (මහවැලි ව්‍යාපෘතිය වැනි) යටතේ ඉඩම් බෙදාදීමේදී ජාතික ජනවර්ග අනුපාතය අනුව කටයුතු කළ යුතු ය (1981 සංගණනය).

ඉඩම් බෙදාදීමේ ව්‍යාපෘති ක්‍රියාවට නැගිය යුත්තේ හැකිතාක් දුරට පළාතට ආවේණික ජනවිකාස රටාවට බාධා එල්ල නොවන පරිදි ය. එසේම පළාතේ ප්‍රජාවන්හි සංසක්තභාවය ආරක්ෂා කිරීමට මූලධාර්මිකව එකඟව කටයුතු කළ යුතු ය.

## ආරක්ෂාව, ජාතික ආරක්ෂාව සහ නීතිය සහ සාමය

ආරක්ෂාව සහ ජාතික ආරක්ෂාව යනු පූර්ණ වශයෙන් මධ්‍යම රජය සතු මාතෘකා ය.

පොලිස් බලතල පළාත් ආණ්ඩු වෙත හිමිවන නමුත්, අගනුවර කලාපය සහ ඊට අමතරව ව්‍යවස්ථාව තුළ විශේෂිතව සඳහන් කර ඇති ප්‍රදේශවලදී ඒ මධ්‍යම රජය සතුවනු ඇත.

## ප්‍රාදේශීය පාලනය:

ප්‍රාදේශීය සභා, මහනගර සභා සහ නගර සභා වැනි ප්‍රාදේශීය අධිකාරීන් සඳහා වන බලය ඉහළ නැංවිය යුතු ය. ප්‍රාදේශීය අධිකාරීන් සඳහා නීති සම්පාදන බලය ලබා නොදිය යුතු වුවද සුවිශේෂ අංශ සඳහා අතුරු නීති සම්පාදනය කිරීමේ බලය ලබා දිය යුතු ය.

## අධිකරණයේ සහ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය:

අධිකරණයේ සහ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා ඉහළ නිලතල සඳහා පත්කිරීම් කොමිසමක් ජාතික මට්ටමෙන් පිහිටුවිය යුතු ය. පළාත් ඉහළ නිලතල සඳහා පත්කිරීම් මණ්ඩලයක් පළාත් මට්ටමෙන් පිහිටුවිය යුතු ය.

# V

# සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ යෝජනා: බලාපොරොත්තු සහගත අවසානයක්

එල්ටීටීඊය පරාජය වී මාස කිහිපයක් ඇතුළත, එනම් 2009 අගෝස්තු මස APRCහි අවසන් වාර්තාව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙත ඉදිරිපත් කෙරිණ. කෙසේ නමුත්, පශ්චාත්-යුධ සංහිඳියාව සහ සාමය ඇති කිරීම සඳහා ශක්‍යතා ඇති ඉදිරි පියවරක් ලෙස ගිනිය හැකි පොරොන්දුවක් ලෙස සලකමින් APRCහි යෝජනා නිල වශයෙන් පිළි ගන්නා ලද්දේ හෝ මහජනයා වෙත ඉදිරිපත් කරන ලද්දේ නැත. යුද්ධය නිමාවී වසර හයකට වඩා කාලයක් ගතවී ඇතත්, ජාතික ගැටළුව සඳහා සාධනීය දේශපාලන විසඳුමක් තවමත් යෝජනා කර නැත.

13 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ සඳහන් බලය බෙදා හැරීමේ සීමාවෙන් ඔබ්බටත් කටයුතු කරන බවට කළ මුල් ප්‍රකාශවලට පටහැනිව, පැවති රජය රාජ්‍ය බලය ක්‍රියාකාරීව තවදුරටත් මධ්‍යගත කිරීමට කටයුතු කළේ 2010 වසරේදී 18වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමේ සිට 2012 වසරේදී දිවි නැගුම පනත ක්‍රියාත්මක කිරීම දක්වාම ඒ විහිදුවාලී ය. සැබවින්ම, (එවකට පොජඑපෙ සාමාජිකත්වය දැරූ) ජාතික හෙළ උරුමය රජය විසින් එල්ටීටීඊය පරාජය කළ නිසාවෙන් තව දුරටත් APRC වලංගු නොවන බව සඳහන් කරන්නට තරම් අනෙත් අන්තයට ගියේ, එය බිහිකරන්නට යෙදුණු යුගයේ එල්ටීටීඊය භයානක යුධ ක්‍රියාකාරිකයකු වුවත් වත්මනෙහි එය එසේ නොවන හෙයින් එසේ කළ හැකි බව ප්‍රකාශ කළේ ය.[44] මෙම දැක්මට අනුව, එල්ටීටීඊය පරාජය කිරීම දිවයිනේ පැවති ජනවාර්ගික අර්බුදය විසඳීමට සමකළ හැකි හෙයින් රාජ්‍ය බලය සම්බන්ධ ප්‍රමුඛ ජාතික ගැටළුව සැලකීමට නොගෙන පසෙකින් තැබිය හැකි විය.

මේ අතරතුර, පැවති රජය සංහිඳියාව අරමුණු කර ගනිමින් ජාතික ගැටළුවට පිළිතුරක් විමසනු පිණිස 2010 දී උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම (LLRC) සහ පාර්ලිමේන්තු තේරීම් කමිටුව පත් කළේ ය. අර්ථාන්විත ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන් හරහා ඇගයිය හැකි ප්‍රගතියක් ලඟා කර ගැනීමට මින් එකකටවත් අවකාශ හිමි වූයේ නැත.

2010 දෙසැම්බර් මස 16 වැනි දින ප්‍රකාශයට පත් කෙරුණු LLRC වාර්තාව බලය බෙදා හැරීම, ජනවාර්ගික ගැටළුවට දේශපාලන විසඳුමක් සඳහා පදනම විය යුතු බව සඳහන් කළේ ය. රජය විසින් බලය බෙදා හැරීම පිළිබඳ සම්මුතියක් ඇති කර ගැනීම සඳහා සුළුතර දේශපාලන පක්ෂවලද සහභාගීත්වයෙන් අර්ථවත් දේශපාලන ක්‍රියාවලියක් ආරම්භ කළ යුතු එම වාර්තාව නිර්දේශ කළේ ය. LLRCහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වූ රජයේ 'ජාතික ක්‍රියාකාරී වැඩසටහනට' (NPA) අනුව, මෙම ක්‍රියාවලිය 2011 ඔක්තෝබර් මස පත් කරන ලද 'ශ්‍රී ලාංකික ජනයා එක් ජාතියක් ලෙස බලගැන්වීම

44. 'APRC does not represent all parties – Warnasingha', *Nation.lk*, 28 June 2009, at http://www.nation.lk/2009/06/28/inter1.htm [අවසන් වරට විමර්ෂණය කරන ලද්දේ 2016 මාර්තු 20].

සඳහා අවශ්‍ය දේශපාලනික සහ ව්‍යවස්ථාදායක මිණුම්දඬු නිර්දේශ කිරීම සහ වාර්තා කිරීම' පිණිස වූ පාර්ලිමේන්තු තේරීම් කමිටුවට පැවරිය යුතු විය.

පාර්ලිමේන්තු තේරීම් කමිටුව සාමාජිකයින් තිස්එක් දෙනෙකුගෙන් සමන්විත වූ අතර පත් කොට හයමසක් ඇතුළත අදාල දේශපාලනික සහ ව්‍යවස්ථාදායක මිණුම්දඬු යෝජනා කළ යුතු විය. හිටපු ජනපති මහින්ද රාජපක්ෂද සඳහන් කළේ APRCහි නිර්දේශ පාර්ලිමේන්තු තේරීම් කමිටුවේ සාකච්ඡා සඳහා පදනම සාදනු ඇති බව ය.[45] කෙසේ නමුත්, දෙමළ ජාතික සන්ධානය, එජාප, ජවිපෙ සහ කුඩා වාමාංශික පක්ෂ කිහිපයක්ම එහි ක්‍රියාකාරකම් හා එක්වීම වර්ජනය කළේ සුදුසු දේශපාලන විසඳුමක් ලබා දීම සඳහා රජය අවංකව කටයුතු නොකරන්නේ ය යන පදනමෙහි හිඳිමිනි. තවදුරටත්, APRCහි නිර්දේශ එහි සාකච්ඡා සඳහා පදනම තනනු ඇති බව සඳහන් කර තිබුණද APRCහි සභාපතිවරයා වූ ජ්‍යෙෂ්ඨ ඇමති තිස්ස විතාරණ පාර්ලිමේන්තු තේරීම් කමිටුවේ ක්‍රියාවලියෙන් ඉවත් කොට තිබිණ. මූලික වැඩකටයුතුවලින් පසු ඉදිරියට ක්‍රියාත්මක වීමට පාර්ලිමේන්තු තේරීම් කමිටුව අපොහොසත් වූ අතර ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ කිසිදු කතාබහට ලක්වුණු යෝජනාවලියක් හෝ වෙනත් හඳුනාගත හැකි ප්‍රතිඵලයක් නිපදවන ලද්දේ නැත.

APRC ක්‍රියාවලියේ ප්‍රති-කූටප්‍රාප්ත අවසානය මෙම ක්‍රියාදාමය ජාත්‍යන්තර ප්‍රජාව- විශේෂයෙන් ඉන්දියාව[46] - සන්සුන් කිරීමටත් ඒ අතරතුර ජනවාර්ගික ගැටුම සඳහා යුධමය විසඳුමකට රජයට අවශ්‍ය කාලය හා අවකාශය සලසා ගැනීමටත් වූ මෙවලමකට වැඩි යමක් නොවූ බව අවසානයේ දී පැහැදිලි ය. උදාහරණයක් ලෙස, හිටපු විදේශ අමාත්‍ය රෝහිත බෝගොල්ලාගම සහ ජිනීවාහි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය සඳහා එවකට විශේෂ නියෝජිත මහින්ද සමරසිංහ යන දෙදෙනාම APRC යන්න රජය දේශපාලනික විසඳුමක් සඳහා කටයුතු කරන්නේ යන්න සඳහා සාක්ෂියක් ලෙස පෙන්වති. උගන්ඩාවේ, කම්පාලා නුවරදී පැවති පොදු රාජ්‍ය මණ්ඩල නායක සමුළුවේදී (CHOGM) බොගොල්ලාගම විසින් සෙසු විදේශ ඇමතිවරුන් හමුවේ මේ බව පවසන අතර සමරසිංහ ඒ සඳහන් කරන්නේ ජිනීවාහි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ දසවන සැසිවාරය සඳහා සහභාගි වෙමිනි. 2007 ජනවාරියේදී ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ප්‍රණාබ් මුකර්ජි හමුවේ ද රජය විතාරණ යෝජනා ඉදිරිපත් කළේ ය.

දිවයිනේ ජනවාර්ගික අර්බුදය සඳහා දේශපාලනික විසඳුමක් හා බැඳී එන රාජ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා වූ තදබල අවශ්‍යතාව යන්න මේ වන විට පුළුල්ව පිළිගන්නා කරුණකි. යුද්ධයේ අවසානයට ඉතා ආසන්න සමයේදී, එනම් 2009 මාර්තු මාසයේදී APRCහි මූලික යෝජනාවලිය සඳහා වන සහයෝගීතාව කොපමණදැයි පිරික්සා බලන්නට පැවැත්වූ සමීක්ෂණය මඟින් පෙන්වා දෙන්නේ ප්‍රතිසංස්කරණ පැකේජයක් ලෙස කමිටුවේ යෝජනා සිංහල සහ දෙමළ ප්‍රජාවන් දෙක අතරම පුළුල් පිළිගැනීමකින් යුක්ත බව ය.[47] සමීක්ෂණයට මුහුණ දුන් සිංහලයින් අතුරින් 59%ක් ප්‍රතිසංස්කරණ පැකේජයක් ලෙස APRC යෝජනාවලට සිය කැමැත්ත පළ කර සිටියහ.[48] ඔවුනතුරින් වැඩි දෙනෙකු ප්‍රමුඛත්වය ආගමික අයිතීන් වෙත ලබා දී තිබුණු අතර අනතුරුව මූලික අයිතිවාසිකම් සහ භාෂා අයිතීන් සඳහන් කොට තිබිණ.[49] දමිළ ජාතිකයින් අතුරින් 82%ක් ප්‍රතිසංස්කරණ පැකේජයක් ලෙස APRC යෝජනා පිළිගෙන තිබිණ.[50] පිළිවෙලින් APRC යෝජනාවලියේ සඳහන් භාෂා අයිතීන්, මූලික අයිතිවාසිකම් සහ අධිකරණය යන කරුණු සමීක්ෂණයට මුහුණ දුන් දමිළ ජාතිකයින් විසින් පෙරට කැඳවා තිබිණ.

45. 'MR Says APRC Will Be Basis for PSC', *Dailymirror.lk*, 27 June 2013, at http://www.dailymirror.lk/31540/mr-says-aprc-will-be-basis-for-psc [අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2016 මාර්තු 20].
46. ඩී.බී.එස්. ජෙයරාජ්, 'APRC in quandary as Jan. 23 deadline nears', *Nation.lk*, 20 January 2008, at http://www.nation.lk/2008/01/20/newsfe1.htm [අවසන් වරට විමර්ශණය කරන ලද්දේ 2016 අප්‍රේල් 11].
47. කොල්වින් අර්වින්, *The APRC Proposals and 'Winning the Peace* (June 2009).
48. එම. 25%ක පිරිසක් ප්‍රතිසංස්කරණ පැකේජය 'පිළිගත හැකි' ලෙස ද, 21%ක් 'සිත්ගන්නා සුළු' ලෙස ද, 13%ක් 'අත්‍යාවශ්‍ය' ලෙස ද දක්වා තිබිණ.
49. එම. 41%ක පිරිසක් ප්‍රතිසංස්කරණ පැකේජය 'පිළිගත හැකි' ලෙස ද, 27%ක් 'සිත්ගන්නා සුළු' ලෙස ද, 14%ක් 'අත්‍යාවශ්‍ය' ලෙස ද දක්වා තිබිණ.
50. එම.

2010 මාර්තු මාසයේදී, උතුරු පළාතෙන් ද සාම්පලයක් ඇතුළත් කරගනිමින් සිදු කළ පසු විපරම් සමීක්ෂණය APRC යෝජනාවලිය සඳහා වූ සහයෝගය තවදුරටත් ඉහළ නැගී ඇති බව පෙන්නුම් කළේ ය. එවර, සමීක්ෂණයට මුහුණ දුන් සිංහල ජාතිකයින්[51] 80%ක් ද, දමිළ ජාතිකයින් 83%ක් ද APRC යෝජනා සඳහා සිය සහාය පළ කර තිබිණි. ඊට අමතරව, වතුකරයේ දමිළ ජාතිකයින්ගෙන් 80% ක්ද, මුස්ලිම් ජාතිකයින්ගෙන් 88%ක්ද 2010දී APRC යෝජනා සඳහා සිය සහාය පළ කොට තිබිණ.[52]

මේ ආකාරයෙන් APRC යෝජනා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා පිළිගත හැකි පදනමක් ලෙස පුළුල් පිළිගැනීමකට ලක් විය. ඉන් පසු ක්‍රියාත්මක වුණු LLRC සහ පාර්ලිමේන්තු තේරීම් කමිටුව වැනි ක්‍රියාකාරකම් හමුවේ සිදුකළ සාකච්ඡා බලය බෙදා හැරීම සඳහා සුදුසු නිර්ණායක ඉදිරිපත් කිරීමෙහි ලා පෙන්වූයේ දුර්වල ප්‍රගතියකි. අද වන විටත් APRCහි අවසන් වාර්තාව මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරුණු යෝජනා විෂයයෙහි විශිෂ්ඨතම සහ අදාලත්වයෙන් ඉහළම යෝජනාවලියක් ලෙස පවතී.

51. කොල්වින් අර්වින්, War and Peace and the APRC Proposals (May 2010). ප්‍රතිචාර දැක්වූ සිංහල ජාතිකයින් අතරින් 20%ක් ඒවා 'අත්‍යාවශ්‍ය' ලෙස ද, 38%ක් 'සිත් ගන්නා සුළු' ලෙස ද, 22%ක් 'පිළිගත හැකි' ලෙස ද දක්වා තිබූ අතර දමිළ ජාතිකයින් අතුරින් 42%ක් 'අත්‍යාවශ්‍ය' ලෙස ද, 24%ක් 'සිත් ගන්නා සුළු' ලෙස ද සහ 17ක් ඒ 'පිළිගත හැකි' ලෙස ද දක්වා තිබිණ.

52. එම.

# සමාප්තිය

බහුවිධ උත්සාහයන් හමුවේ වුව, පත්වූ සියලුම රජයයන් ශ්‍රී ලංකාවේ ඉතා වැදගත් 'ජාතික ගැටළුව' සඳහා විසඳුමක් ලබා දීමට අපොහොසත් වී ඇත. වසර ගණනාවක් මුළුල්ලේ විවිධ ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරියට පැමිණ ඇතත් අවසානයේ සිදුව ඇත්තේ ඒ ඉවත් කර ගැනීම හෝ බල රහිත කිරීම පමණි. මෙම වාර්තාව මඟින් පෙන්වා දුන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිසංස්කරණ විෂයයෙහි ලා ඓතිහාසිකව නොසලකා හැරුණු අන්තර්සම්බන්ධිත කාරණා ද්විත්වයක් පවතින බව යː

1. ශ්‍රී ලංකා රාජ්‍යය සඳහා පිළිගත ප්‍රතිසංස්කරණ සඳහා සීමා නිර්ණයේදී බහුතර සිංහල-බෞද්ධ දෘෂ්ටිවාදයේ බලපෑම; සහ
2. සිය සිංහල බහුතරයේ ඡන්දදායකයින් බලය බෙදා හැරීමේ ක්‍රියාවලියකට එරෙහිව පෙළඹ ස්වමින් දකුණේ දේශපාලන පක්ෂ සිදුකරන වාර්ගික වශයෙන් 'වැඩි කොටස' ඉල්ලා සිටීමේ ක්‍රියාදාමය

ඉහත සාධක දෙකම එහි ක්‍රියාකාරීත්වය තුළ දී හඳුනාගෙන ඇති පසුබිමක් තුළ APRC හි අවසන් වාර්තාව බලය බෙදා හැරීම සඳහා වන යෝජනා අතුරින් වඩා ඉදිරිගාමී, සංගෘහිත සහ පුළුල්ව පිළිග න්නා ලද්දකි. එහෙත් තවමත්, APRCහි අවසන් වාර්තාව වෙත ලබා දුන් පොරොන්දුව පසෙක තබා ඒ සඳහා වන නිල පිළිගැනීම කිසිදු මොහොතක ලබා දී නොමැති අතරම ඒ තුළ වන බලය බෙදා හැරීම පිළිබඳ වන පුළුල් දායකත්වය සිතාමතාම නොසලකා හැර ඇත.

APRCහි අවසන් වාර්තාව තුළ අඩංගු යෝජනා ඔවුන් මෙතෙක් ලබාගත් පිළිගැනීමටත් වැඩි තත්වයකට සුදුසකම් ලබන්නකි. දැනට සිදුකෙරෙමින් පවතින ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යළිත් APRC යෝජනා වෙත අවධානය යොමු කිරීම සඳහා ඉතා වැදගත් අවස්ථාවක් හිමිකර දී ඇත. දේශපාලන පක්ෂවල පුළුල් හරස් කාණ්ඩ අතර සිදුවුණු දීර්ඝ සාකච්ඡාවල පදනමින් තැනී ඇති APRC අවසන් වාර්තාව නව ක්‍රියාකාරකම් ස්ථානගත කිරීම සඳහා පැහැදිලි පසුබිමක් නිර්මාණය කර දෙයි.

එක් පියවරක් ඉදිරියට තබමින් රජය විසින් APRCහි අවසන් වාර්තාව නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන්නේ නම් එය සුළුතර දේශපාලන පක්ෂ සමඟ අර්ථවත් සාකච්ඡාවක් සඳහා මනා උත්ප්‍රේරකයක් සපයනු ඇත. ඉදිරි සාකච්ඡාවලට පැහැදිලි පදනමක් තනාදී, ශ්‍රී ලංකාවේ කල්පිනූ ජාතික ගැටළුව සඳහා විසඳුමක් ලබාදීමේ ක්‍රියාවලියේදී APRC යෝජනාවලට සිදු කළ හැකි කාර්යභාරය අනල්ප ය.

# ඇමුණුම I

## නිර්දේශ පිළිබඳ දළ විශ්ලේෂණය: බහුතරයේ වාර්තාව, අන්තර්වාර යෝජනා සහ අවසන් වාර්තාව

| | බහුතරයේ වාර්තාව | අන්තර්වාර යෝජනා | අවසන් වාර්තාව |
|---|---|---|---|
| රාජ්‍යය | i. කිසිඳු ආකාරයකින් රාජ්‍යය යන්න අර්ථකථනය නොකරයි.<br><br>ii. රාජ්‍යය පිළිබඳ සමුද්දේශයන් අවශ්‍ය තන්හිදී 'ව්‍යවස්ථාව විසින් ලබා දෙනු ලැබ ඇති පරිදි මධ්‍යම රජය සහ පළාත් විසින් බලය භාවිතා කරනු ලබන ආයතනවලින් සමන්විත' යනුවෙන් සඳහන් කෙරෙනු ඇත. | | i. රාජ්‍යය අර්ථ ගන්වනුයේ 'ඒකීය රාජ්‍යයක්' ලෙස ය. - එනම් මධ්‍යම රජය සහ පළාත් අතර බලය විමධ්‍යගත කෙරුණු නොබෙදුණු සහ සංකලිත වුණු රාජ්‍ය ව්‍යුහයක් ලෙස ය. |
| ව්‍යවස්ථාව | i. ව්‍යවස්ථාදායකය උත්තරීතර වේ.<br><br>ii. ව්‍යවස්ථාදායක අධිකරණය - ව්‍යවස්ථාව හා සම්බන්ධිත කරුණු හා කටයුතු කරන, පවතින අධිකරණ ධූරාවලියට අයත් නොවන, විශේෂිත අධිකරණයකි.<br><br>iii. සිවිල්, දේශපාලනික, කණ්ඩායම්, සමාජ, ආර්ථික, සංස්කෘතික හා ළමා අයිතිවාසිකම්වල සුරක්ෂිත බව සහතික කෙරෙන පුළුල් පනත් කෙටුම්පතකි. | | i. ව්‍යවස්ථාව හා බැඳි කරුණු හා සම්බන්ධව කටයුතු කරන ව්‍යවස්ථාදායක අධිකරණය - පවතින අධිකරණ ව්‍යුහය හා සම්බන්ධිත නමුත් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වෙන් වූ අධිකරණයකි.<br><br>ii. සිවිල්, දේශපාලනික, කණ්ඩායම්, සමාජ, ආර්ථික, සංස්කෘතික හා කාන්තා සහ ළමා අයිතිවාසිකම්වල සුරක්ෂිත බව සහතික කෙරෙන පුළුල් පනත් කෙටුම්පතකි.<br><br>iii. අයිතිවාසිකම් පිළිබඳ පනත්වලට ඇතුළත් කළ යුතු විශේෂ විධිවිධාන සැපයෙනු ඇත. ඒ අතර:<br><br>- ජීවිතය සඳහා ආවේණික වූ අයිතිය<br><br>- ළමා අයිතිවාසිකම් සම්බන්ධ විශේෂ විධිවිධාන<br><br>- ව්‍යවස්ථාව තුළ මානව හිමිකම් කොමිසම හඳුනාගැනීම |
| විමධ්‍යගත කිරීම | i. බලය පළාත් වෙත විමධ්‍යගත කිරීම<br><br>ii. සමගාමී ලැයිස්තුවක් සඳහා අවම විෂයන් සහ කාර්ය අයත්වන පරිදි ජාතික සහ පළාත් පරිස්ථිති තුළ විෂය සහ කාර්ය වර්ගකරණය කිරීම.<br><br>iii. සමගාමී ලයිස්තුවේ ඇති විෂයන් සහ කාර්යයන් උතුරු-නැගෙනහිර ප්‍රාදේශීය බලතල ලයිස්තුවේ ඇති අංග ලෙස සලකන අතරම, ඒවා මධ්‍යම ආණ්ඩුව මඟින් යම් හෙයකින් දේශීය ශක්‍යතාවන් තුළට බලාත්ප්‍රවේශනය කිරීමට අවකාශ ඇති කරුණු කෙරේ. ආරක්ෂිත උපක්‍රමයක් ලෙස භාවිත කිරීමට ද සිදු වේ. | i. පළාත් සභාවල කාර්යක්ෂම ක්‍රියාත්මකවීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පාදනයන් සැපයීමත්, 13වැනි ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කිරීම.<br><br>ii. නැගෙනහිර පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීම.<br><br>iii. උතුරු පළාත් ආණ්ඩුකාරවරයාගේ විධායක බලතල ක්‍රියාත්මක කිරීම විෂයෙහි ආණ්ඩුකාරවරයා වෙත උපදෙස් ලබාදීමට සහ සහයෝගය ලබාදීමට අන්තර්වාර කවුන්සිලයක් (පළාතේ ජනවාර්ගිකත්වය විශද වන අන්දමේ) පිහිටුවීම, සහ පළාත් මැතිවරණය පැවැත්වෙන තෙක් ක්‍රියාත්මක වීම. | i. පළාත බලය බෙදීමේ යෝග්‍ය ඒකකය බවට පත්කිරීම.<br><br>ii. පළාත් අධිකාරය මඟින් මධ්‍යම ආණ්ඩුවේ ඒකකයක් වන සෙනෙට් මන්ත්‍රීවරුන් තෝරාපත් කරගැනීම සහ, එමඟින් ජාතික ව්‍යවස්ථාදායකයේ භූමිකාව ඉටු කිරීමට පළාතට ඉඩ සැලසීම.<br><br>iii. විෂයන් ජාතික සහ පළාත් වශයෙන් බෙදා වෙන්කළ යුතුය. ජාතික බලතල, මධ්‍යම ආණ්ඩුව වෙතත්, පළාත් ලයිස්තුවේ බලතල පළාත් ව්‍යවස්ථාදායකය වෙතත් ඒ ඒ විෂයන් නතුවිය යුතුය.<br><br>ප්‍රාදේශීය සභා, මහනගර සහ නගර සභා ආදී ප්‍රාදේශීය බලාධිකාර වෙත ඇති බලය වැඩි කළ යුතුය. |

| | බහුතරයේ වාර්තාව | අන්තර්වාර යෝජනා | අවසන් වාර්තාව |
|---|---|---|---|
| **විධායකය** | i. විධායක බලය ජනාධිපතිවරයෙකුගෙන් සහ උප ජනාධිපතිවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත යුතුය.<br><br>ii. ජනාධිපතිවරයාගේ ජනවර්ගය හැර සෙසු ජනවර්ග දෙකක් නියෝජනය වන පරිදි උප ජනාධිපතිවරුන් පත්කළ යුතුය.<br><br>iii. ජනාධිපතිවරයා වෙත සිය විධායක බලය සම්බන්ධයෙන් නිශේධ බලයක් හිමිවුව ද එය අධිකරණයේ විමර්ශනයට යටත් විය යුතුය. | | i. ජනාධිපතිවරයා විධායක බලය ක්‍රියාත්මක කළ යුතුය.<br><br>ii. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ මන්ත්‍රී මණ්ඩල ද්වය මගින් තෝරා පත්කර ගත යුතුය.<br><br>iii. එක් උප ජනාධිපතිවරයෙක් ජනාධිපතිවරයා නියෝජනය කරන ජනවර්ගය හැර සෙසු ජනවර්ගයක් නියෝජනය කරන පරිදි පාර්ලිමේන්තුවේ මන්ත්‍රී මණ්ඩල ද්වය මගින් තෝරා පත්කර ගත යුතුය. (මෙම තනතුර, වරින් වර ජනපති නියෝජනය වන ජනවර්ගය හැර සෙසු ජනවර්ග අතර හුවමාරු විය යුතුය.)<br><br>ජනාධිපතිවරයා සිය ධුර කාලය තුළ විධායක කාර්යභාරය ලෙස සිදු කරන ඕනෑම විධායක කාර්යයක් සම්බන්ධයෙන් මුක්තියට උරුමකම් කියන නමුදු, මෙම විධායක කාර්යභාරයන් අධිකරණයේ විමර්ශනයට විෂය වේ. |
| **නීති සම්පාදන බලතල** | i. ජාතික ව්‍යවස්ථාදායක සභාව තුළ පළාත්බද නියෝජනය පරිදි දෙවැනි මන්ත්‍රී මණ්ඩලය තෝරා පත්කර ගත යුතුය.<br><br>ii. සමානුපාතික නියෝජන ක්‍රමයක් යටතේ පළාත් ව්‍යවස්ථාදායකය මගින් තෝරාපත් කර එවන සාමාජිකයින්ගෙන් දෙවන මන්ත්‍රී මණ්ඩලය සමන්විත විය යුතුය. | | i. මධ්‍යම ආණ්ඩුව, ජනතා චන්දයෙන් පත්කරනු ලැබූ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයකින් සහ පළාත් ව්‍යවස්ථාදායකය මගින් පත්කරන ලද සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයකින් සමන්විත විය යුතුය.<br><br>ii. ව්‍යවස්ථාදායක බලය ජනමත විචාරණ, පාර්ලිමේන්තුව සහ පළාත් ව්‍යවස්ථාදායකය විසින් ක්‍රියාත්මක කළ යුතුය.<br><br>ව්‍යවාස්ථාදායකය මගින් ගෙන එන කවර නීති සම්පාදනයක් වුව, ව්‍යවස්ථා පටහැනි වන විටෙක, එවැන්නක් පශ්චාත් විමර්ශනයට ලක්කර, පරිච්ඡින්න කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය වෙත බලය ඇත්තේය. |
| **ඉඩම් බලතල** | i. රජයේ ඉඩම් සිය පළාත් බල ප්‍රදේශ තුළ පාලනය කිරීමේ වරය පළාත් පාලනය වෙත නතුවන අතර, මධ්‍යම රජය යටතේ පාලනය වන හෝ ප්‍රයෝජනයට ගන්නා ඉඩම් බලතල මධ්‍යම රජය වෙත හිමිවේ.<br><br>ii. ජාතික ඉඩම් කොමිෂන් සභාව, ජාතික ඉඩම් යෙදවුම් ප්‍රතිපත්තිය සකස්කර මධ්‍යම සහ පළාත් රජයන් වෙත, නිර්දේශ ලබා දීම කළ යුතුය. | | i. පළාත් රජයන් වෙත පවරා දෙනු ලැබූ ඉඩම්වල සමෘද්ධිය මධ්‍යම ආණ්ඩුව වගකීමට යටත්වේ.<br><br>ii. පළාත් රජයන් භාවිත කළ හෝ ඒ වෙත පවරා දෙනු ලැබූ ඉඩම්වල සමෘධිය ප්‍රාන්ත රාජ්‍ය වගකීමට යටත්වේ.<br><br>iii. ඉඩම් සහ ජල කොමිෂන් සභාව පළාත් සහ මධ්‍යම රජයන්ගේ සමාන නියෝජනයෙන් ක්‍රියාත්මක වෙමින්, සෑම ප්‍රමුඛ ජන ප්‍රජාවක් වෙතම සමාන නියෝජනයක් සපයන්නේ ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සහ ජල සම්පාදන, අන්තර් පළාත් වාරිමාර්ග සහ ජල බල ව්‍යාපෘති පිළිබද ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ අධ්‍යාශයෙනි. |

| | බහුතරයේ වාර්තාව | අන්තර්වාර යෝජනා | අවසන් වාර්තාව |
|---|---|---|---|
| **පොලිස් බලතල** | i. පොලිස් බලතල පළාත් රජයන් වෙත විමධ්‍යගත කිරීම සිදුකළ යුතු අතර, ප්‍රාග්ධන / අගනුවර කලාපයේ ක්‍රමෝපායික ආයතන එනම්, වරයා, ගුවන්තොටුපල පිහිටුවීම වැනි කටයුතුවලදී යම් හෙයකින් පළාත් පොලිසි ආරක්ෂාව ලබාදීමට අපොහොසත් වන අවස්ථාවලදී පමණක් මධ්‍යම රජයේ පොලිසියට මැදිහත්වීමට ඉඩ ඇත්තේය.<br>ii. පොලිස් සේවා දෙකකි- ජාතික පොලිස් සේවය සහ පළාත් පොලිස් සේවය වශයෙනි. | | i. සුවිශේෂ අවස්ථාවලදී පමණක්, ව්‍යවස්ථාපිතව මධ්‍ය රජය වෙත බලතල සංකේන්ද්‍රණය වී ඇත්තේ නම් විනා, පොලිස් බලතල පළාත් රජය වෙත විමධ්‍යගත කළ යුතුය.<br>ii. ශ්‍රී ලංකා පොලිස් සේවය, මධ්‍යම පොලිස් කොට්ඨාසය, සහ ඒ ඒ පළාත්වලට වෙනම පළාත් පොලිස් කොට්ඨාස වශයෙන් ප්‍රතිව්‍යුහගත කළ යුතුය. |
| **සුළුතරය** | i. ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ ජනතාවගේ ගැටලු සොයාබැලීම සඳහා ස්වාධීන කලාපිය කවුන්සිලයක් ස්ථාපිත කිරීම. | | i. මුස්ලිම් ජාතිකයින්ගේ සහ ඉන්දියානු දෙමළ ජන ප්‍රජාවේ අභිලාෂයන් ප්‍රමාණ කිරීමට විශේෂ මිනුම් සකස් කිරීම.<br>ii. ඒ ඒ ප්‍රජාවේ සංවර්ධන අභිලාෂයන් සාක්ෂාත් කරනු වස්, උතුරු නැගෙනහිරින් පිටත, මුස්ලිම් සහ ඉන්දියානු දෙමළ ප්‍රජාවන් වෙනුවෙන් ප්‍රජා කවුන්සිල දෙකක් ස්ථාපිත කිරීම. |
| **නීති පරිපාලනය** | | | i. නිතිය හෝ ව්‍යවස්ථාදායකය මඟින් ස්ථාපිත, පළාත්බද මාහාධිකරණ, අභියාචනාධිකරණය, ශේෂ්ඨාධිකරණය, ව්‍යවස්ථාදායක අධිකරණය සහ වෙනත් අධිකරණ සහ විනිශ්චය සභා වැනි යුක්තිය පසිඳලන ආයතන පිහිටුවීම.<br>ii. ව්‍යවස්ථාදායක අධිකරණය - ව්‍යවස්ථා නිතිය විෂයෙහි පැණනගින ගැටලු විසඳීම සඳහා<br>iii. ඉහළ පත්කිරීම් කවුන්සිලය මඟින් අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම. |

| | බහුතරයේ වාර්තාව | අන්තර්වාර යෝජනා | අවසන් වාර්තාව |
|---|---|---|---|
| භාෂාව | i. භාෂාව විෂයෙහි අවශ්‍යතාවන්ට පිළිතුරු සැපයීම වෙනුවෙන් ව්‍යවස්ථාවේ සිව්වැනි පරිච්ඡේදය ප්‍රවර්ධනය කිරීම.<br>ii. පරිපාලන සහ රාජ්‍ය භාෂා ලෙස සිංහල සහ දෙමළ භාෂා සැලකීමත් ඉංග්‍රීසි භාෂාව ජාතික භාෂාවක් ලෙස සැලකීමත් කළ යුතුය.<br>iii. ඕනෑම රාජ්‍ය ආයතනයක් සමඟ සන්නිවේදන සහ ගනුදෙනු කාර්යයන ඉටුකරගැනීමටත්, පොලිස් නිලධාරීන් සහ සෑම නිලධාරීන් සමඟ කටයුතු කිර්මටත්, රාජකාරි ලේඛනයක් ලබා ගැනීමටත් තම රුචිය පරිදි ඕනෑම ජාතික භාෂාවක් තෝරා ගැනීමට ඕනෑම පුරවැසියෙකුට අවකාශ සැලසීම.<br>iv. උතුරු සහ නැගෙනහිර හැර අන් සියලුම පළාත්වල පරිපාලන වාර්තා භාෂාව ලෙස සිංහල භාෂාව ක්‍රියාත්මක විය යුතුය.<br>v. ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ කටයුතු භාෂා තුනෙන්ම ක්‍රියාත්මක විය යුතුය. | i. ව්‍යවස්ථාවේ සිව්වැනි පරිච්ඡේදය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරමෙහි ලා අවශ්‍ය නීති සම්පාදනය කොට බලාත්මක කිරීම.<br>ii. රට පුරා සියලු දෙපාර්තමේන්තු, ආයතන, අමාත්‍යංශ, පොලිස් ස්ථාන සහ වෙනත් රාජ්‍ය ආයතන සියල්ලේම නිලධාරීන් අනුයුක්ත කිරීම සහ රටේ ඕනෑම ප්‍රදේශයක ඇති පොලිස් ස්ථානයකදී තමාගේ මව් භාෂාවෙන් කටයුතු කිරීමට පහසු වන පරිදි දෙමළ භාෂාව උගත් රාජ්‍ය නිලධාරීන් සේවයේ යෙදවිය යුතුය.<br>iii. ඕනෑම අධිකරණයකදී ගැටලු විසඳීම වෙනුවෙන්, භාෂා පරිවර්තකයින්, තෝල්ක මුදලිවරුන්, සහ අනෙක් සේවා සපයන දෙමළ භාෂකයින් සහිත ජංගම 'සායන' පැවැත්විය යුතුය.<br>iv. උතුරු නැගෙනහිර වෙසෙන සුළු ජාතික සිංහලයින් වෙනුවෙන්, එම ක්‍රියා මාර්ගම අනුගමනය කළ යුතුය. | i. සිංහල සහ දෙමළ භාෂා ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා විය යුතුය. ඉංග්‍රීසි භාෂාව ද රාජකාරි කටයුතුවලදී භාවිත කිරීම කළ හැකිය.<br>ii. අධ්‍යාපනය, ව්‍යාපාර සහ අනෙක් කටයුතු සඳහා ඕනෑම පුරවැසියෙකුට ඕනෑම රාජ්‍ය භාෂාවක් හෝ ඉංග්‍රීසි භාෂාව භාවිත කළ හැකිය.<br>iii. පරිපාලන කටයුතු, යුක්තිය පරිපාලනය, නීති සම්පාදන සහ දැනුම් දීම, රාජ්‍ය වාර්තා සියල්ලක්ම රාජ්‍ය භාෂා දෙකෙන්ම පළ කළ යුත්තේ ඉංග්‍රීසි පරිවර්තනයක් ද සමඟිනි. |
| හදිසි අවස්ථා බලතල | i. රටේ ස්වාධිපත්‍යයට, අන්තර්-සහයෝගිතාවට සහ ඒකීයභාවයට තර්ජනයක් ඇතැයි පැහැදිලි සහ තත්‍ය බවට නිශ්චිත අවස්ථාවකදී පළාත් විෂයෙහි හදිසි අවස්ථා බලතල පාවිච්චි කිරීමේ බලය මධ්‍යම ආණ්ඩුවට හිමිවේ. | | i. හදිසි අවස්ථා බලතල ප්‍රකාරව, පළාත් ආණ්ඩු විසින් එම පළාත් තුළට, මධ්‍යම රාජ්‍ය මැදිහත්වීම ඉල්ලා සිටිය හැකි අවස්ථා කවරේද යන්න පිළිබඳව ඉතා පැහැදිලි ව ව්‍යවස්ථාපිතව තහවුරු කළ යුතුය. මෙම බලතල අධිකරණයේ සහ පාර්ලිමේන්තුවේ පාලනයට විෂය වේ. |
| මූල්‍ය | i. මුල්‍ය වගකීම් පිළිබඳව මධ්‍යම හා පළාත් රජයන් අනන්‍යාහිමුඛව පහදා ගත යුතුය.<br>ii. වැය වගකීම් මුදාහැරිම සඳහා ප්‍රමාණවත් අදායම් පෙන්විය යුතුය.<br>iii. පළාත් සහ මධ්‍යම රජය අතර වැය ආශ්‍රිත ගැටලු විසඳාගැනීම වෙනුවෙන්, මුල්‍ය කොමිසමක් ස්ථාපිත කළ යුතුය. | පළාත් විෂයපත්‍රතාව තුළ පවතින, එහෙත් මධ්‍යම රජය මඟින් පළාත් සිමාවන් හි ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති විෂයෙහි මුල්‍ය කටයුතු අදාළ පළාත් අධිකාරීන් වෙත යොමුකළ යුතුය. | පළාත් අධිකාරී ලබන අදායම් සහ මධ්‍යම රජයේ අදායම් සඳහා ඒකාබද්ධ ගිණුම් දෙකක් පවත්වාගෙන යාම. |

Verité Research
Strategic Analysis for Asia

A | No. 5A, Police Park Place, Colombo 5
T | +94 11-2055544
E | reception@veriteresearch.org
W| www.veriteresearch.org